# දහම් පාසල

## 11 ශ්‍රේණීය

# ශාසන ඉතිහාසය

පෙළපොත් ආශ්‍රිත කෙටි සටහන්



දන්ත වෛද්‍ය පීඨ බෞද්ධ සහෝදර සංගමයේ තිලිණයකි
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පවතින **COVID - 19**
වසංගත තත්ත්වය
සැලකිල්ලට ගනිමින්
ඉගෙනුම් ඉගැන්වීම්
ක්‍රියාවලියේ පහසුව
වෙනුවෙන් මුල් කර්තෘනට
හානි නොවන අයුරින් දහම්
පාසල් පෙළපොත්
ආශ්‍රයෙන් කෙටිසටහන්
නිර්මාණය කරන ලදි.

තෙරුවන් සරණයි !

# පිදුම

ආදරණීය නංගියේ , මල්ලියේ...

ඔබේ දහම් නැණ වඩවාලන්නට...

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය

දන්ත වෛද්‍ය පීඨ

බෞද්ධ සහෝදර සංගමයෙන්

පිදෙන

දහම් පඬුරකි මේ...!



# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01. | බෞද්ධ ධර්ම දූත සේවාවේ ආරම්භය සහ බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තිය | 1 |
| 02. | ධර්ම සංගායනා | 26 |
| 03. | මෞර්ය යුගය හා ධර්මාශෝක රජතුමා | 34 |
| 04. | අශෝක රජතුමා බෞද්ධයකු විම | 38 |
| 05. | අශෝක ධර්මය | 40 |
| 06. | අශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාරක සේවාව | 42 |
| 07. | අශෝක රජතුමාගේ බෞද්ධ ධර්ම දූත සේවය | 44 |
| 08. | ධර්මාශෝක රජතුමාට ඉතිහාසයේ හිමිවන තැන | 47 |
| 09. | සිවුවන ධර්ම සංගායනාව | 49 |
| 10. | මහින්දාගමනය හා ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටුවීම | 51 |
| 11. | භික්ෂුණී සමාජය | 55 |
| 12. | ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීම | 58 |
| 13. | ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවීම | 61 |
| 14. | මහා විහාරය | 67 |
| 15. | අභයගිරි විහාරය | 71 |
| 16. | ජේතවන විහාරය | 74 |
| 17. | ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම | 76 |
| 18. | බුදු සමයෙන් ලක්වැසියන් ලද ආභාසය | 79 |

# 1.බෞද්ධ ධර්ම දූත සේවාවේ ආරම්භය සහ බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තිය

**ගෞතම බුදුරජාණන් වහන්සේ,**

- උපත - දඹදිව ලුම්බිණි සල් උයන
- පියතුමා - සුද්ධෝදන මහ රජතුමා
- මවුතුමිය - මහමායා දේවිය
- සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණය කළේ විසි නව වැනි වියේදීය.

සත්‍ය ගවේෂණය සඳහා ප්‍රථමයෙන්ම සොයා ගිය ගුරුවරුන් -

- ආලාර කාලාම
- උද්දකරාම පුත්ත

- එම ගුරුවරුන් සතුව තමා සොයන සත්‍ය නොමැති බව අවබෝධ කරගත් සිදුහත් තවුසාණෝ හුදෙකලාව ම සත්‍ය ගවේෂණයෙහි පරම අධිෂ්ඨානයෙන් යුතුව උරුවෙල් දනව්වේ දුෂ්කර ක්‍රියා කළහ. ( අත්තකිලමථානුයෝගය )

- දුෂ්කර පිළිවෙත් මගින් විමුක්තිය පසක් කර ගත නොහැකි බව තේරුම් ගත් උන්වහන්සේ ආනාපාන සතිය වඩමින් මැදුම් පිළිවෙත මාර්ගය තුළ යමින් අවසානයේදී සම්මා සම්බුද්ධත්වයට පත්වූහ.

**ධර්ම දූත කාර්යය**

- මවිසින් අවබෝධ කරන ලද මේ දහම ගැඹුරුය. අවබෝධ කර ගැනීමට අපහසුය. වටහා ගැනීම දුෂ්කරය. ශාන්තය. ප්‍රණීතය. සියුම්ය. තර්ක කිරීමෙන් නොදත හැකිය. නුවණැත්තන් විසින් දත යුතු ය. මේ මහජනයා ඇලීම් කෙරෙහි සතුටුවන පිරිසකි. මේ දහම එවැනි ජනයා විසින් දැන ගැනීම අපහසුය.
- මා දහම් දෙසන විට ඔවුන්ට එය වටහා ගැනීම අපහසු වේ නම්, එයින් විය හැක්කේ උදක් මහා වෙහෙසට පත් වීම පමණකි.
- මෙම උදාසීනත්වය දුටු මහා බ්‍රහ්ම තෙමේ බුදුරදුන්ට ධර්මය දේශනා කිරීමට ආරාධනා කළේය .

## ප්‍රථම ධර්ම දේශනාවට පදනම් වූ දර්ශනය

- ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූයේ පස්වග මහණුන් මුල්කරගෙන ය.
- පැවැත්වූ ස්ථානය - ඉසිපතන මිගදාය
- ප්‍රථම ධර්ම දේශනාව - ධම්මචක්ක පවත්වන සූත්‍රය
- අත්තකිලමථානුයෝගය, කාමසුඛල්ලිකානුයෝගය, ශාස්වත වාදය හා උච්ඡේද වාදය වැනි අන්තවාදී දෘෂ්ටීන් ප්‍රතික්ෂේප කිරීම.
- සම්මා දිට්ඨිය මුල් කොටගත් මධ්‍යම ප්‍රතිපදා මාර්ගය ඉදිරිපත් කිරීම. ( ආර්ය අෂ්ඨාංගික මාර්ගය )
- චතුරාර්ය සත්‍ය ධර්මය දේශනා කිරීම. ( දුක, දුකට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය )
- ලොව සියල්ල හේතු ප්‍රත්‍ය අනුව හටගන්නා බවත්, හේතු ප්‍රත්‍යයන්ගේ නිරෝධයත් සමඟ නිරුද්ධ වන බව දේශනා කිරීම.
- ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාව අවසානයේදී අඤ්ඤාකොණ්ඩඤ්ඤ තවුසාණන් සෝවාන් ඵලයට පත් වීම.

**අනාත්ම ලක්ෂණ දේශනාව**

- බුදුරදුන් ආත්ම වාදය ප්‍රතික්ෂේප කරමින් අනාත්මවාදී සංකල්පය ලොවට හෙළි කළහ.
- අනාත්ම ලක්ඛණ දේශනාව අවසානයේදී පස් වග තවුසන් සියලු කෙලෙසුන් නසා අරිහත් භාවයට පත්වීම.

ප්‍රථම රහත් හැටනම අමතා බුදුරදුන් අනුශාසනා කළේ ;

**" මහණෙනි බොහෝ දෙනාගේ හිත සුව පිණිස ලෝකයාට අනුකම්පා පිණිස මිනිසුන්ට පමණක් නොව දෙවියන්ටද හිත වැඩ පිණිස ගමක් ගමක් පාසා ( නියම් ගමක් නියම් ගමක් පාසා, නගරයක් නගරයක් පාසා ) චාරිකාවේ හැසිරෙන්න. දෙදෙනෙක් එක මග නොයන්න. මුල මැද අග යන තුන් කල්හිම යහපතක් ගෙන දෙන දහම් දෙසන්න. මමද උරුවෙලාහි සේනානි නමැති නියම් ගමෙහි දහම් දෙසන්නට යන්නෙමි................"**

**ධර්මදූත මෙහෙයක තිබිය යුතු මූලික ලක්ෂණ එම ප්‍රකාශය අඩංගු වේ.**

- සර්ව සත්ත්ව හිතවාදීව මෙම කාර්යය කලයුතු බව.
- වැඩි දෙනෙකුට මෙහෙයක් වන අයුරින් පුළුල් ක්ෂේත්‍රයක් අසුවන සේ දෙදෙනකු එක මඟකින් නොයා යුතු බව.
- අනවශ්‍ය විස්තර වලින් තොරව ප්‍රයෝජනවත් සේ දහම් දෙසන ලෙස.
- එම ශ්‍රාවකයන් වහන්සේලාට එම වගකීම පැවරීම.
- බුදුරදුන් තුළ පැවැති මහා කරුණාව හා ප්‍රඥාවත් සංවිධාන ශක්තියත් මැනවින් පිළිබිඹු වේ.
- ශ්‍රාවකයන් වහන්සේලා ධර්මදූත කාර්යයේ යොදවා සෑහීමකට පත් නොවී, ආදර්ශවත් ලෙස තමන් වහන්සේද එම උදාරතර කාර්යයේ නිරත වීම.

**ශ්‍රාවකයන් වහන්සේලා එම වගකීම මැනවින් ඉටු කළ බවට ශාසන ඉතිහාසයේ එන සාක්ෂි**

- අස්සජි මහරහතන් වහන්සේ - උපතිස්ස පිරිවැජියා ට ධර්මය දේශනා කිරීම.
- මහාකාත්‍යායන මහරහතන් වහන්සේ - උදේනියෙහි උන්වහන්සේ බෞද්ධ මධ්‍යස්ථානයක් ඇති කිරීම.
- සොණකුටිකණ්ණ නමැති ධනවත් බමුණාගේ හා තවත් බමුණන් කිහිපදෙනකු බුදුසමය වැළඳ ගැනීම.

**අන්‍ය ආගමික පැවිද්දන්ගේද ප්‍රසාදයට ලක් වූ අන්දම**

දිනක් අනඳ හිමි භික්ෂු පිරිසක් සමග දේවකටසොබ්භ නම් ස්ථානයට වැඩියහ. එහි විසූ සඳක නැමැති පිරිවැජියා තමා අතවැසි පිරිස අමතා මෙසේ පැවසීය.

**" කෑ ගහන්නට එපා. ශබ්ද කරන්නට එපා. ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයකු වූ අනඳ තෙරුන් එනවා. ඒ තෙරවරුන් නිහඬ බව ශාන්ත බව ප්‍රිය කරනවා. එබැවින් හැම කෙනෙක්ම නිශ්ශබ්දව ශාන්තව සිටිය යුතුයි........."**

- මෙවැනි තොරතුරු වලින් හෙළි වන්නේ එම ශ්‍රාවකයන් වහන්සේලා සිය වගකීම මැනවින් ඉටු කිරීමට අවශ්‍ය මහජන ප්‍රසාදය ලැබීමට සුදුසු ව සිටි බවයි.

## විශේෂඥතා හඳුනාගැනීම

- ගෞතම බුද්ධ ශාසනයේ ප්‍රථම ශ්‍රාවකයා - අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේ
- මහානුවණැති ශ්‍රාවකයන් අතරින් අග්‍රස්ථානය - සැරියුත් මහරහතන් වහන්සේ
- සෘද්ධිමතුන් අතරින් අග්‍රස්ථානය - මුගලන් මහරහතන් වහන්සේ
- ධුතාංගධාරීන් අතරින් අග්‍රස්ථානය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ
- දිවැස් ඇත්තවුන් අතරින් අග්‍රස්ථානය - අනුරුද්ධ මහා රහතන් වහන්සේ
- මිහිරි කටහඬ ඇත්තවුන් අතරින් අග්‍රස්ථානය - ලකුණ්ඨක භද්දිය මහරහතන් වහන්සේ
- සිහනාද කරන්නන් අතරින් අග්‍රස්ථානය - පින්ඩෝලභාරද්වාජ මහරහතන් වහන්සේ
- ධර්ම කථිකයන් අතරින් අග්‍රස්ථානය - මන්තානිපුත්ත මහරහතන් වහන්සේ
- සැකෙවින් කී දෙය විස්තර කර දෙන්නන් අතරින් අග්‍රස්ථානය - මහාකාත්‍යායන මහරහතන් වහන්සේ
- මනෝමය රූප මවන භික්ෂූන් අතරින් අග්‍රස්ථානය - චුල්ලපන්ථක මහරහතන් වහන්සේ
- අරූපධ්‍යානයෙහි දක්ෂ භික්ෂූන් අතර අග්‍රස්ථානය - මහාපන්ථක මහරහතන් වහන්සේ
- ආරද්ධවීර්ය ඇත්තවුන් අතරින් අග්‍රස්ථානය - සෝණ මහ රහතන් වහන්සේ
- ප්‍රිය වචන ඇත්තවුන් අතරින් අග්‍රස්ථානය - කුටිකණ්ණ තිස්ස මහරහතන් වහන්සේ

- සම්පූර්ණ වැටහීම් ඇත්තවුන් අතරින් අග්‍රස්ථානය - වංගීස හිමි
- ධාරණ ශක්තිය ඇත්තවුන් අතරින් අග්‍රස්ථානය - ආනන්ද හිමි
- විනයධරයන් අතරින් අග්‍රස්ථානය - උපාලි තෙරුන්

මෙය ද බුදුරජාණන් වහන්සේගේ ධර්ම දූත සේවාවේ කැපී පෙනෙන තවත් ලක්ෂණයකි.

## ධර්මදූත සේවාවේ විශේෂත්වය

- එකල පැවති අනෙක් ආගමික අදහස් තර්කය පදනම් කොට ගත් ඒවාය.බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ දර්ශනයක් අතක්කාවචර විය. තම තමන් විසින් ස්වාධීන නුවණින් අවබෝධ කළ යුතුයි.

## විවිධ ක්‍රම ශිල්ප

- බුදුරදුන් සමකාලීන වෙනත් ශාස්තෘවරයකු නොගත් මගක් ගෙන ගෙන ප්‍රායෝගිකව ක්‍රියාත්මක වී ප්‍රශ්න විසඳීම.
- බිම්බිසාර, කෝසල, ලිච්ඡවී හා අජාසත් වැනි රජවරු දේශපාලන ප්‍රශ්න වල දී පවා බුදුරජාණන් වහන්සේගෙන් උපදෙස් පැතීම.
- අංගුලිමාල නිසා හටගෙන තිබුණු සමාජ භීතිය දුරලීමට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් වීම.
- විශාලා මහනුවර තුන්බිය සංසිඳවීම.
- රෝහිණී නදියේ ප්‍රශ්නය විසදීම.
- කසීභාරද්වාජට කරුණු තේරුම් කර දීම.

## බුද්ධිමතුන් බුදුරදුන් වටා එක් රැස් වීම

- ***වරක් චූල සකුලදායි*** බුදුරදුන්ගේ බුදුරදුන් ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් තම පිරිස ද නිහඬ කොට ගෙන සිටියේය.
- ***වච්ඡගොත්ත පිරිවැජියා*** වරක් බුදුරදුන් පිළිගෙන ඇත්තේ හද පිරි ගෞරවයෙනි.
- ***නිග්‍රොධ පිරිවැජියා*** බුදුරදුන් සමග වාද කිරීමට  සූදානම් වුවද බුදුරදුන්ගෙන් දහම් අසා උන්වහන්සේ ගැන ප්‍රසාදය පළ කිරීම. ( ***දීඝ නිකාය උදුම්බරික සීහනාද සූත්‍රය*** )

**බ්‍රාහ්මණ ශාස්ත්‍ර පිළිබඳ පිළිබඳව හසල දැනුමක් ලබා සිටි අයද පවා, බුදුරජාණන් වහන්සේ සමග සාකච්ඡා කර, තෙරුවන් සරණ යාම.**

**උදාහරණ**

- පස් වග තවුසන්
- පුණ්ණමන්තානි පුත්ත
- නාලක
- සභිය
- කාශ්‍යප අග්ගිදත්ත එලක
- මහා කොට්ඨිත
- පිණ්ඩෝලභාරද්වාජ
- මහා කප්පින
- රේවත කදිරවණිය
- රට්ඨපාල
- සෝණදණ්ඩ
- බ්‍රහ්මායු
- අභයරාජ කුමාර

## බුදුරජාණන් වහන්සේගේ විශේෂ මිනිස් ගුණ

බුදුරජාණන් වහන්සේ තුළ පැවති විශේෂ මානව ගුණ සමුදාය උන්වහන්සේගේ ධර්ම දූත මෙහෙය සාර්ථක වීම කෙරෙහි බලපෑ බව පෙනේ.

- ප්‍රසන්න වීම.
- ආචාරශීලී ගතිගුණවලින් යුක්තවීම.
- උපශාන්තව ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත වීම.
- මහා කරුණාව හා ප්‍රඥාව.

බුදුරජාණන් වහන්සේ සෑම දිනකම අලුයම නැගිට මහා කරුණා සමාපත්තියට සමවැද ලෝක සත්වයා දෙස බලයි.

එසේ තමන්ගේ සේවාව අවශ්‍ය වන්නේ කවරෙකුට දැයි බලා නොපමාව ඔවුන් සොයා යාම.

**එසේ පිහිට වූ අය ලෙස**

- අනේපිඬු මහා සිටුතුමාගේ නිවසේ සේවයේ යෙදී සිටි පුණ්ණා නම් දාසිය
- චුල්ලපන්ථක තෙරුන්
- බඩේ අමාරුවක් සෑදී වැතිරී සිටි භික්ෂුවක්
- කිසාගෝතමිය
- අංගුලිමාල
- මට්ටකුණ්ඩලී උදාහරණ කිහිපයකි.

> වරක් චුන්ද හිමියන් ඇමතූ බුදුරජාණන් වහන්සේ,
>
> **" චුන්දය ශ්‍රාවකයන්ට ඉතාම හිතවත්, අනුකම්පාව ඇති ශාස්තෘවරයෙකු විසින් අනුකම්පාවෙන් යමක් කරන්නට තිබේද ඒ සියල්ල මම නුඹලාට කළෙමි."**

- මෙවැනි ප්‍රකාශ තුළින් ද පැහැදිලි වන්නේ උන්වහන්සේගේ ධර්ම දූත සේවයට මහා කාරුණික බව පදනම් වූ ආකාරයයි.

**අන්‍ය සාමයික කොටස්වලින් විරෝධතා පැන නැගීම**

- බුදුරජාණන් වහන්සේගේ ධර්ම දූත සේවාව ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වනවාත් සමග අන්‍ය සාමයික ශාස්තෘවරුන්ගේ විරෝධතාවය බුදු දහම කෙරෙහි එල්ල විය. මෙම අන්‍ය ශාස්තෘවරුන් බුදුරජාණන් වහන්සේට චෝදනා එල්ල කිරීමට පෙළඹුණි.

> **උදාහරණ ලෙස**
>
> - බුදුරදුන් මායාකාරයකැයිද, ආවර්තනීය මායාවක් දනිතැයිද කියන්නට විය.
> - ශ්‍රමණ ගෞතම තෙමේ පවුල් වඳ කිරීම පිණිස, වැන්දඹුවන්ඇති කිරීම පිණිස, කුල නැසීම පිණිස වැඩ කරන්නේය යනුවෙන් ද මිනිස්සු බුදුරදුන්ට දොස් නගන්නට පටන් ගත්හ.

## තාදී ගුණය

**තාදී ගුණය පිළිබිඹු වන උදාහරණ ලෙස**

- වේරංජාවේ වැඩ විසූ සමයේ බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට දානය නොලැබීම.
- මාගන්දියා ගෙන් අල්ලස් ගත් දා මට කියන්න අපහාස කිරීම.
- අන්‍ය තීර්ථකයින් සුන්දරිය මරා දමා බුදුරදුන්ටත් ශ්‍රාවකයන්ටත් අපහාස කිරීම.
- චිඤ්චාව විසින් කළ අභූත චෝදනා.

මෙවැනි නොයෙක් ආකාරයෙන් චෝදනාව බුදුරජාණන් වහන්සේගේ තාදි ගුණය ඉදිරියේ ව්‍යර්ථ විය.

## බුදුරදුන් උපයෝගී කරගත් සන්නිවේදන මාධ්‍යය

- එකල පොදුජන බසක් සේ පැවැති ***මාගධී භාෂාව*** බුදු හිමියන් ධර්මය දේශනා කිරීමට යොදා ගත්හ.
- ශ්‍රාවකයන්ට ද ස්වකීය මාතෘ භාෂාවෙන් ධර්මය හැදෑරීමට ඉඩ ලබාදී තිබීම.

ගාථා මාධ්‍ය

- බොහෝ විට ඇතැම් දේශනා සඳහා ***ගීතවත් බසක්, පද්‍යම බසක්*** යොදා ගෙන ඇත.
- ***කසීභාරද්වාජ සූත්‍රය, ධනිය සූත්‍රය*** ආදී පද්‍යමය දේශනාවලින් මෙම කරුණ ප්‍රකට වේ.
- කුඹුරක් සාමින් සිටි කසීභාරද්වාජට ගාථාවකින් බණ කීවේ ඔහු පැහැද වීමට තිබූ එකම මඟ එය වූ බැවිනි.
- පසුකාලීන බෞද්ධ ආචාර්යවරු ද ධර්ම ප්‍රචාරයේදී මේ ක්‍රමය මාධ්‍යය කරගත් බව පෙනේ.

**මනෝ විද්‍යානුකූල පදනම**

බුදුරදුන් ඇතැම් පුද්ගලයින්ගේ සුව දුක් විචාරිමෙන් අනතුරුව දහම් දෙසූ අවස්ථාව සඳහන් වේ.

**උදාහරණ**

- පුතු මළ සොවින් සිටි කිසා ගෝතමිය හට නොමල ගෙයකින් අබ මිටක් ගෙන එන්න එසේ යොමු කොට ඇයට ම ජීවිතයේ අනිත්‍යතාවය අත්දැකීමෙන් අවබෝධ කිරිමට ඉඩ සැලසීම.
- චූල්ලපන්ථක තෙරුන්ට ධර්මය අවබෝධ කර ගැනීමට ඉඩ සැලැස්වූ යේ පිරිසිදු රෙදි කඩක් පිරිමැදීමට උපදෙස් ලබා දීමෙනි.
- ගිනි දෙවියන් පුදමින් සිටි උරුවෙල කාශ්‍යප ආදීන්ට ගින්න ආශ්‍රිත දේශනාවක් වූ ආදිත්තපරියාය සූත්‍රය දේශනා කිරීම.
- යාගයේ නියැලී සිටි කූටදන්ත බ්‍රාහ්මණයාට යාගය අරමුණු කොට ද, දඬයම් කරුවෙකු සිට පැවිදි වූ අරිට්ට තෙරුන් ට සර්පයන් අල්ලන්නකු උපමාව කොට බුදුරදුන් ධර්මය දේශනා කළහ

**ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය**

- බුදුරජාණන් වහන්සේ ශ්‍රව්‍ය මෙන්ම දෘශ්‍ය රූප මාධ්‍ය කොට ගෙනද දහම් දෙසා ඇත.

**උදාහරණ**

- රූප මානයෙන් උදම් ව සිටි රූපනන්දා ඉදිරියේ ශෝභාමත් ස්ත්‍රී රූපයක් මවා අනතුරුව එය ජරාවට පත්වන අන්දම පෙන්වීම.
- ජනපද කල්‍යාණිය කෙරෙහි පෙම් බැඳ පසුව සසුනෙහි උකටලී වූ නන්ද තෙරුන්ට, එහෙයින් නිසරු බව වටහා දුන්නේ දැවීගිය වැඳිරියක හා දිව්‍යාංගනාවක් පෙන්වා කරන ලද සැසඳීමකින් ය.
- රූ සපුවෙන් මුළු නුවරම වශීකල සිරිමා නමැති සුරූපි කාන්තාවගේ මළ සිරුර සොහොන් බිමේදී වෙන්දේසි කිරීම.

**ප්‍රශ්න විසඳීමේ ක්‍රම සතර**

- ***ඒකංස ව්‍යාකරණිය*** - අසන ලද ප්‍රශ්නයට එක එල්ලේම පිළිතුරු දේශනා කිරීම
- ***විභජ්ජ ව්‍යාකරණිය*** - ප්‍රශ්න කොටස්වලට බෙදා විග්‍රහ කොට එක් එක් කොටසට වෙන් වෙන් වශයෙන් පිළිතුරු සැපයීම.
- ***පටිපුච්ඡා ව්‍යාකරණිය*** - ප්‍රති ප්‍රශ්න නගමින් දහම් දෙසීම.
- ***ඨපනීය*** - ඉවතලන ප්‍රශ්න

මෙසේ බුදුරදුන් ආරම්භ කළ ධර්ම දූත සේවාව බුද්ධත්වයෙන් සිට පිරිනිවන්පාන මොහොත දක්වා ම උන්වහන්සේ නොකඩවා පවත්වාගෙන ගියහ. බුදුරජාණන් වහන්සේ තුළ පැවති ***අවංකභාවය ආත්ම විශ්වාසය මනා සංවිධාන ශක්තිය අධිෂ්ඨානය මහා කරුණාව ප්‍රඥාව*** වැනි ගුණයන් මේ සඳහා සඳහා විශේෂයෙන් හේතු විය.

## ශාසන ව්‍යාප්තිය

**බුදුන් දවස බුදු සසුනේ ව්‍යාප්තිය**

බුදුරජාණන් වහන්සේ චාපාල චෛතිය ස්ථානයේ වැඩ සිටින විට එහි පැමිණි මාරයා බුදුරදුන්ට පිරිනිවන් පාන ලෙස ආරාධනා කළේය. එහිදී බුදුරදුන් ප්‍රකාශ කළේ

**"භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන තමන් වහන්සේගේ සිවුවනක් පිරිස ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, විනයධර, ධර්මානුධර්ම ප්‍රතිපත්ති පිරිසක්ව, ආචාර්ය වාදය හොඳින් ඉගෙන ගෙන ලෝකයට උගන්වන තුරු තමන් වහන්සේ පිරිනිවන් නොපාන බවයි "**

- බුදුරදුන්ගේ එම අභිප්‍රාය සම්පූර්ණ වී ඇති බැවින් පිරිනිවන් පාන ලෙස මාරයා විසින් නැවත ඉල්ලා සිටි විට බුදුරජාණන් වහන්සේම ඉල්ලීම පිළිගත්හ.
- ***සතලිස් පස් වසරක්*** මුළුල්ලේ බුදුරදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයා මධ්‍ය දේශය පුරාවට ධර්මය ව්‍යාප්ත කළහ.

**ධර්ම ප්‍රචාරක සේවාව** බුදු සිරිත ඇසුරින් කොටස් **දෙකකට** බෙදිය හැක

- **පළමු කොටස** - බුදුරදුන්ගේ ප්‍රථම බෝධියට අයත් මුල් අවුරුදු 20
- **දෙවන කොටස** - පිරිනිවන් පාන තෙක්, බුදුරදුන්ගේ ඊළඟ අවුරුදු විසිපහක කාලය

## භූගෝලීය පසුබිම

- ***හිමාල කඳු වැටිය*** - උතුරේ උතුරෙන් ඇෆ්ගනිස්තානයේ සිට ඈය මේ දක්වා විහිදේ.
- ***සින්දු නදී මිටියාවත*** - හිමාල කඳුවැටිය කඳු වැටියට දකුණින් වයඹට හා බටහිර දෙස බරව පිහිටියේය.
- ***රොලින්සන්*** සඳහන් කරන පරිදි ***යමුනා, චම්බාල්, ගුම්ති, ගොග්‍රා හා සෝන නදී*** වලින් හා තවත් කුඩා ගංගා වලින් ජලය සපයන සාරවත් බිමකි.
- ඉන්දියාවට පැමිණි ආර්යයෝ ***පළමුවෙන්ම ඉන්දු නදී මිටියාවත්*** වල පදිංචි වූ අතර, ***කල්යත්ම ගංගා නදී මිටියාවතේ*** ජනපද පිහිටුවා ගනිමින් පහළට ගමන් කළහ.
- ක්‍රි.පූ. 6 වන සියවසේ බුදුරදුන් පහළ වන විට ගංගා නදී මිටියාවතේ මධ්‍ය මහා පහළ කොටස් ජනාකීර්ණ ප්‍රදේශ බවට පත්ව තිබුණි.

## සොළොස් මහ ජනපද

- ***අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේති, වංස, කුරු, පංචාල, අස්සක, සූරසේන, අවන්ති, ගන්ධාර, කාම්බෝජ, අස්මක.***
- මේ අතුරින් ***12ක්*** පමණ ***සමූහාණ්ඩු*** බවත් ***හතරක් රාජාණ්ඩු*** බවත් රීස් ඩේවිඩ්ස් මහතා පවසයි.
- ***සමූහාණ්ඩු*** වලින් වැඩි කොටසක් අයත් වූයේ ***ලිච්ඡවී, මල්ල, ශාක්‍ය, භග්ග, පිප්ඵලී*** වනයේ ***මෞර්යයන්*** යන රජ පෙළපත් වලටයි.
- ***රාජාණ්ඩු සතර*** වනුයේ ***මගධ, කෝසල, වත්ස, අවන්ති*** වේ.

## මගධය

**සීමා**

- උතුර - ගංගා නදිය
- නිරිත - වින්ධ්‍යා කඳු වැටිය
- නැගෙනහිර - චම්පා නදිය
- බටහිර - සෝන නදිය
- අගනගරයේ ***රජගහනුවර***
- ***චම්පාව අගනුවර*** වූ අංග රාජධානියද ***මගධයට*** අයත්ය.
- මගධය පාලනය කළේ ***බිම්බිසාර හා අජාසත්ත*** රජවරුන්ය.
- බිම්බිසාර රජතුමා බුදුරජාණන් වහන්සේ සමඟ සමීපව කටයුතු කළ අතර  බුදු දහමට නොයෙක් අනුග්‍රහය දැක්වීය.
- ***වේළුවන පූජාව සිදුවූයේද මගධය රාජ්‍යයේ දී ය.***
- ***බුදුරදුන්ගේ අගසවුවන්*** වන ***සැරියුත් මුගලන්*** දෙදෙනා ද මගධ රාජ්‍යයෙන් බුදු සසුනට එක් වූවෝ වෙති.

**බුදුරදුන් මගධයෙහි වසන සමයේ තෙරුවන් සරණ ගිය උපාසක උපාසිකාවෝ**

- භද්‍රාකුණ්ඩලකේශිය,  චාලා, උපචාලා,  සිසූපචාලා
- ඛානුමථ නම් බමුණු ගමෙහි අධිපති කූටදන්ත බ්‍රාහ්මණයා
- මගධයෙහි පරිබ්‍රාජක නායකයෙකු වන නිග්‍රෝධ නමැත්තා හා සන්ධාන නමැති ගෘහපතියා

- ***රජගහ නුවර ගිජ්ජකූට*** පර්වතයේදී ***ආටානාටිය සූත්‍රය*** දේශනා කිරීම. දිනක් උදෑසන සතර වරම් දෙවිවරු සිය අනුගාමික පිරිස බුදුරදුන් බැහැ දැක උන් වහන්සේ හා ශ්‍රාවකයන් පිය නොකරන එක්තරා යක්ෂ විශේෂයක් සිටින බව පැවසූහ. එහිදී ආරක්ෂාව පිණිස බුදුහු භික්ෂූන්ට ආටානාටිය සූත්‍රය ඉගැන්වීය.

**මගධයේ විශේෂතා**

- ***සැවැත්නුවර අනාථ පිණ්ඩික සිටුතුමා*** බුදුසමය වැළඳ ගැනීම.
- බුදුරදුන් ඔහුට සුදත්ත යැයි ඇමතීම.
- බුදුරජාණන් වහන්සේගේ මුල් දේශනා බොහොමයකට මධ්‍යස්ථානය වී ඇත්තේ ***රජගහ නුවරයි.***
- විවිධ දාර්ශනික, ගැටළු පිළිබඳව වාද විවාද පැවැත්වූ ප්‍රචාරක මධ්‍යස්ථානයක් වීම.
- කසී භාරද්වාජ නම් ධනවත් බ්‍රාහ්මණයා බුද්ධ ශ්‍රාවකයෙකු බවට පත් වූයේ බුදුරදුන් ***රජගහනුවර*** අසල ***දක්ඛිණ ගිරියෙහි ඒකනාල නම්*** බමුණු ගමෙහි වසන සමයේ දී ය.
- භාරද්වජ ගෝත්‍රයට අයත් බමුණන් බුදුරදුන්ගේ අවවාද අනුශාසනා පිළිගෙන බුදුදහම වැළඳගැනීම.

***( අක්කෝසක භාරද්වජ, අග්ගික භාරද්වජ )***

**මගධයේ පිහිටා ඇති බෞද්ධ සංස්කෘතිය අතින් වැදගත් ස්ථාන**

- වේළුවනය
- ගිජ්ජකූට පර්වතය
- තපෝදාරාමය
- මන්දකුච්ඡි මිගදාය
- කලන්දක නිවාපය
- පාවාරික අඹ වනය
- සීත වනය

## අංග ජනපදය

- අගනුවර ***චම්පා*** නුවර
- ***සෝණදණ්ඩ*** නම් බමුණා හා ඔහුගේ පිරිස බුදුන් සරණ යෑම.
- ***සෝණ කුටිකණ්ණ හිමියෝ*** අංග රටවාසී ධනවත් භාණ්ඩාගාරිකයෙකුගේ පුතෙකි.

# කෝසල

- උතුර නේපාලය
- දකුණ ගංගා නදිය
- බටහිර පංචාල රට
- නැගෙනහිර සාධා නීරා නදිය
- අගනුවර ***සැවැත් නුවර***
- ***පාලකයා*** පසේනදි ***කොසොල් රජතුමා***
- ඔහුට පසුව ඔහුගේ ***පුත් විඩූඩභ*** එහි පාලකයා විය.
- කලක් කෝසලයේ අගනුවර වූ සාකේතයෙන් යොදුන් සියයක් උතුරෙන් අචිරවතී නදී තීරයේ සැවැත් නුවර පිහිටා තිබුණි. මෙය බුදුරජාණන් වහන්සේ බහුල වශයෙන් සංචාරය කළ ප්‍රදේශයක් විය.
- කෝසල රාජ්‍යයේ පවතින බෞද්ධ මධ්‍යස්ථාන ලෙස ***පූර්වාරාමය , ජේතවනාරාමය, අංජන වනය , අන්ධ වනය , සින්සපා*** වනය හැඳින්විය හැක.
- කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේ ගේ පා සිඹිමින් සිය ***අචල ගෞරවාදරය*** හා භක්තිය පිරිනැමූ අයු අයුරු ***මජ්ඣිම නිකායේ ධම්ම- චේතිය සූත්‍රයේ*** සඳහන් වේ.

**කෝසල ප්‍රභූවරු**

- අනේපිඬු සිටුතුමා ***( බුදු සසුනේ අග්‍ර දායකයා )***
- විශාඛා මහා උපාසිකාව
- පසේ නදී රජුගේ පුත්‍ර බ්‍රහ්මදත්ත හා සොයුරිය වූ සුමනා ද බුදු සසුනේ පසුකාලීනව පැවිදි විය. බුදුසමය කෙරෙහි කොසොල් රට වැසි අන්‍ය සමය වාදීන් ගේ නෙත් සිත් යොමු වීමට වීමටද මෙය හේතුවක් විය.
- ***ෂට් ශාස්තෘවරුන්ගේ*** මධ්‍යස්ථානය වූයේද කොසොල් රාජ්‍යයයි.
- ***පොක්ඛරසාති ලෝහිච්ච, වංකී*** වැනි මහාසාර කුලයන්ට අයත් කොසොල් රට වැසි බමුණු පඬිවරු බුදු සමය වැළඳ ගැනීම.

**අඟුල්මල් දමනය**

- අංගුලිමාල ද කොසොල් රට වැසියෙකි.
- කොසොල් රජුගේ පුරෝහිතයාගේ පුත්‍රයා වූ අංගුලිමාල බුදුරජාණන් වහන්සේ විසින් දමනය කොට බුදු සසුනේ පැවිද්ද ලබාදුනි.

**රෝහිණී ගංතෙර යුද්ධය**

- රෝහිණී නදියේ ජලය පිළිබඳ ***ශාක්‍ය හා කෝලීය*** වංශිකයන් අතර අරගලය ඇතිවූයේද බුදුරදුන් ***සැවැත්නුවර වසන*** සමයේ දී ය.
- බුදුරජාණන් වහන්සේගේ ආනුභාවයෙන් එම සටන නවත්වා දෙපිරිසේම සියලු දෙනා බුදු සසුනට ඇතුළත් කර ගැනීමට උන්වහන්සේ සමත් වූහ.

## වත්ස ජනපදය

- කොසොල් රාජ්‍යයට උතුරෙන් පිහිටියේය.
- අගනුවර ***කොසඹෑ*** ***ව***
- වත්ස ජනපදයෙහි බලයට පත් ***උදේනි රජතුමා*** බුදු සමය වැළඳ ගැනීම නිසා බුදු සමයේ ව්‍යාප්තියට බලවත් ආධාරයක් විය.
- සුප්‍රසිද්ධ බෞද්ධ උපාසිකාවන් වූ ***සාමාවතිය හා ඛුජ්ජුත්තරා*** යන කාන්තාවන් සිටියේද මෙහිය.
- වත්ස ජනපදයේ පැවැති ***ප්‍රධාන සංඝාරාම හතරක්*** විය .
- ***බදරිකා රාමය, කුක්කුටාරාමය, ඝෝෂිතාරාමය හා පාවාරික අඹ වනය***

**කොසඹෑනුවර**

- බුදුරදුන් ***නව වැනි වස*** විසුවේ ***කොසබෑ නුවර ඝෝෂිතාරාමයේ*** ය.
- ***දහ වැනි*** වස විසුවේ **පාරිලෙය්‍ය** වනයේ ය.
- ධර්ම කථික භික්ෂූන් වහන්සේලාගේ ගුරුවරයෙකු අතින් සිදු වූ සුළු අතපසුවීමක් නිසා විනයධර ධර්මධර භික්ෂූන් වහන්සේලා අතර අරගලය කොසබෑ නුවර ආශ්‍රිතව සිදු වූවකි.
- එමෙන්ම මාගන්ධිය කතා පුවත ද කොසබෑ නුවර ආශ්‍රිතව සිදු වූවකි.

## අවන්ති ජනපදය

- බුදුදහම දක්ෂිණ භාරතයේ ව්‍යාප්ත වීමට උදාහරණයක් ලෙස අවන්ති ජනපදය දැක්විය හැක.
- වින්ධ්‍යා කඳුවලට උතුරෙන් යමුනා නදිය ශාඛාවක් වූ වූ තඹ නදියේ ඉහත්තාවේ අවන්ති රාජ්‍යය පිහිටියේ ය.
- මෙහි අගනුවර ***උදේනිය***යි.
- බුදුරදුන් දවස මෙහි පාලකයා වූයේ ***චණ්ඩපජ්ජෝත*** රජුය.
- අවන්ති ජනපදයේ කුරරඝර නුවර පිහිටි පවත්ත නම් පර්වතය භික්ෂූන්ගේ මධ්‍යස්ථානයක් වශයෙන් සැලකේ.

- චණ්ඩපජ්ජෝත රජුගේ පුරෝහිතයෙකු ලෙස කටයුතු කළ කච්චායන බුදුරදුන් වෙත ගොස් පැවිදි විය. මහා කච්චායන හිමිගේ නොපසුබස්නා උත්සාහය ධෛර්යය නිසා බුදු සමය දක්ෂිණ පථය පුරාවට ව්‍යාප්ත වී ගියේය.මෙම ප්‍රදේශයේ උපසම්පදා භික්ෂූන් දස නමක් සොයා ගැනීම ඉතා අසීරු විය. මහා කච්චායන හිමියන්ගේ ඉල්ලීමක් අනුව එම ප්‍රදේශයට බලපාන විනය නීතිය සුළු කොටසක් වෙනස් කොට ඇත. උපසම්පදාවට පස්නමක් අනුමත කොට ඇත්තේ ඒ අනුවය.

## වජ්ජි ජනපදය

- මගධ රාජ්‍යය උතුරේ පිහිටි වජ්ජි ජනපදය ලිච්ඡවි රජවරුන් විසින් පවත්වාගෙන ගිය සමූහාණ්ඩුවකි.
- මෙහි අගනුවර ***විශාලා නුවරයි.***
- රාජ්‍ය පාලනය සඳහා ඔවුන් විසින් ***සප්ත අපරිහානි ධර්ම*** අනුගමනය කළේය.
- කලින් නිගණ්ඨනාතපුත්ත ගේ ශ්‍රාවකයෙකු වූ සිහ සේනාපති බුදුරදුන් හමුවට පැමිණ කරන ලද සාකච්ඡාවකින් පසුව බෞද්ධ උපාසකයෙක් විය.
- තවත් එවැනිම උපාසකයෙක් ලෙස ***මහාලී ලිච්ඡවී*** දැක්විය හැක.

**වජ්ජි රාජ්‍යය බෞද්ධ ප්‍රබෝධය**

- විශාලා මහනුවර ඇතිවූ දුර්භික්ෂයේ දී බුදුන් ප්‍රමුඛ භික්ෂූන් අනුගමනය කළ ක්‍රියාමාර්ගය, බෞද්ධයන්ගේ පමණක් නොව විශාල වැසි අන්‍ය දෘෂ්ටිකයන්ගේද සිත් ඇද ගැනීමට හේතු විය.
- මේ රාජ්‍යයේ උදේන, ගෝතමක, බහු පුත්තක ආදි චෛත්‍යය ගොඩනගා තිබූ බව සඳහන් වේ.
- ***අම්බපාලී*** නම් සුප්‍රසිද්ධ බෞද්ධ කාන්තාවක මේ රාජ්‍ය තැනැත්තියකි.

**බෞද්ධ ස්ථූප ගොඩනැංවූ රාජ්‍යය**

- බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුදුරජාණන් බුදුරජාණන් වහන්සේගේ ධාතුන් වහන්සේලා රාජ්‍ය අටකට බෙදා දුනි.
- අනතුරුව එම රාජ්‍යය වල බුදුරදුන්ගේ ධාතු නිදන් කොට චෛත්‍ය සෑදුණි.
- ***රාජගහ, වේසාලි, කපිලවත්ථු, අල්ලකප්ප, රාමගාම, වේඨදීපක, පාවෙය්‍යක, කුසිනාරා***

❖ **ශාක්‍ය ජනපදය**

- ශාක්‍ය ජනපදයේ වැසියෝ බුදුරදුන්ගේ ඥාතීන් වූ නිසා ශාක්‍යයෝ විශාල වශයෙන් බුදුසමය වැළඳ ගත්හ.
- ***මහා ප්‍රජාපතී, යශෝධරා, රාහුල, නන්ද, අනුරුද්ධ, නාග, කිම්බිල***

## කුරු රට

- ඉතා නිරෝගිමත්, බුද්ධිමත් වූ කුරුරට වැසියන්ට බුදුරජාණන් වහන්සේ විසින් මහා ***සතිපට්ඨාන, මහානිදාන*** වැනි ඉතා වැදගත් සූත්‍ර දේශනා කර ඇත.
- රට්ඨපාල තෙරුණුවෝ කුරුරට තුල්ලකොට්ඨිත ගමෙහි බමුණු පවුලකට අයත් වූහ.

## ගාන්ධාර ජනපදය

- අගනුවර ***තක්ෂිලාව***
- බුදුන් දවස මෙහි පාලකයා ***පුක්කුසාති*** නම් රජෙකි.
- මගධ රජු වූ බිම්බිසාර සහ පුක්කුසාති රජු අතර ඉතා හොඳ මිත්‍රත්වයක් පැවතිණි.
- පුක්කුසාති රජු විසින් බිම්බිසාර රජුට එවූ අගනා තෑගි වලට පිළිතුරු වශයෙන්, බිම්බිසාර රජු විසින් ද බුදුරදුන්ගේ අගනා ධර්ම පාඨ ඇතුළත් රන් තහඩුවක් පුක්කුසාති රජු වෙත යවා ඇත.ඒවා කියවීමෙන් බුදුදහම කෙරෙහි පැහැදුණු රජු බුදුරජාණන් වහන්සේ මුණ ගැසීම පිණිස පැමිණියේය. අතරමගදී රජතුමාට බුදුරජාණන් වහන්සේ මුණ ගැසුණු නමුත් ඒ බව රජතුමා නොදැන උන්වහන්සේ සමඟ සාකච්ඡාවක යෙදුණි. බුදුරජාණන් වහන්සේ රජුට ***ධාතුවිභංග සූත්‍රය*** දේශනා කළ අතර, දේශනාව කෙලවර රජු අනාගාමී වූ බව සඳහන් වේ.

රාජ අනුග්‍රහය

- දඹදිව බොහෝ ප්‍රදේශවල පාලක පක්ෂය ද, සිටු වරුන් ද, නා නා තරාතිරම්වල ජනයා ද, විශේෂයෙන් ම බිම්බිසාර කෝසල ආදී රජවරුන් ප්‍රමුඛ රාජාණ්ඩුව ද වජ්ජී, මල්ල, පංචාල, ආදී සමූහාණ්ඩු ද බුදු දහම කෙරෙහි දැක්වූ අනුකූලතාව නිසා බුදුන් දවස දඹදිව විශාල ප්‍රදේශයක බුදුසමය පැතිර ගියේය.

## බිම්බිසාර රජතුමා

- වයස අවුරුදු 30 දී පමණ බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය ශ්‍රවණය කර සෝවාන් ඵලයට පත්විය.
- බුදුන් ප්‍රමුඛ මහා සංඝයාට ***වේළුවනාරාමය*** පූජා කළේය.
- මහ ජනතාවට ආදර්ශයක් වන ලෙස රජු මසකට හය වරක් පෙහෙවස් සමාදන් විය.
- රජතුමා බුදු දහම කෙරෙහි මහත් ලැදිව හා බුදුදහමේ උන්නතිය කෙරෙහි මහත් වූ කැපවීමකින් කටයුතු කළේය.
.
- එක් අවස්ථාවක ධනීය නම් භික්ෂුවක් රාජ්‍ය භාණ්ඩාගාරයට අයත් දැව සොරකම් කර ගත්තේ යැයි චෝදනාවක් පැනනැගුනු අතර භික්ෂුවක් නිසා රජතුමා ඊට දඬුවම් නොකොට සමාව දුනි.
- පුක්කුසාති රජුද බුදුදහම වැළඳගත්තේ බිම්බිසාර රජු නිසාවෙනි.

## අජාසත් රජතුමා

- මුල් කාලයේ දෙව්දත් හා එකතුව බුදුරදුන්ට විරුද්ධව ක්‍රියා කළ නමුත්, පසුව ජීවක වෛද්‍යවරයාගේ මෙහෙයවීමෙන් බුදුරදුන් හමුවට ගොස් ධර්මය ශ්‍රවණය කර ප්‍රසාදයට පත්විය.
- මුගලන් හිමියන්ගේ මරණය ගැන වගකිව යුතු නිඝණ්ටයන් පන්සියයකට රජතුමා මරණය නිම නියම කළ බවත් ඒ නිසාම නිගන්ටයින් රජුට වෛර කළ බවත් ධම්මපදට්ඨ කථාවේ සඳහන් වේ.
- බුද්ධ පරිනිර්වාණයෙන් තමාට ලැබුණු සර්වඥ ධාතු නිදන්කොට ශෛලමය ස්ථූපය ස්ථූපයක් කරවා ඇත.
- අජාසත් රජු ප්‍රථම ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ නිසා බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුදු සසුන මුහුණ පෑ අවිනිශ්චිත තත්වයෙන් මුදා ගැනීමට හැකිවිය.

## පසේනදී කොසොල් රජතුමා

- කෝසල රාජ්‍යයේ රජකම් කළ මෙම රජතුමා දිනකට තෙවරක් බුදුන් හමුවීමට ගියේය.
- බුදුරජාණන් වහන්සේ නොමැතිනම් ශ්‍රාවකයකු හෝ මුණගැසීම ධර්ම සාකච්ඡා කිරීම රජතුමාගේ සිරිතකි.
- රජුගේ සොයුරිය වූ සුමනා සොයුරිය භික්ෂුණී සමාජයට ඇතුළත් වී රහත් වූ පසු ඇය සතු දේපල බුදුරදුන්ගේ අනුමැතිය ඇතිව සංඝයාට පූජා කළාය.
- ජේතවනාරාමයේ ඉදිරිපිටම රාජකාරාමය නම් ආරාමයක් ඉදිකර ඇති බව ධම්මපද අටුවාවේ සඳහන් වේ.

## උදේන රජතුමා

- පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් නිසා වත්ස රාජ්‍යයේ පාලකයා වූ උදේන රජතුමා බුදුන් සරණ ගියේ ය.

## චණ්ඩපජ්ජොත රජතුමා

- මහා කච්චාන හිමියන් නිසා අවන්ති රාජ්‍යයේ පාලකයා වූ චණ්ඩ පජ්ජෝත රජු බුදු සරණ ගියේය.

## ලිච්ඡවී රජවරු

- පංච වස්තුවක් පිළිබඳව සාරනන්ද චෛතියේ පැවැත්වූ සාකච්ඡාවට බුදුරදුන්ට ආරාධනා කළ ලිච්ඡවීහු ඊට බුදුරදුන්ගේ අදහස් ලබා ගත්හ.
- බුද්ධ ස්තෝත්‍රයක් කියන ලද පිංගියානි බමුණාට ලිච්ඡවීන්ගෙන් සළු පන්සීයක් ලැබුණු බව අංගුත්තර නිකායේ සඳහන් වෙයි.

- ජෛනයන්ගේ මධ්‍යස්ථානයක් වූ ලිච්ඡවී රාජ්‍යයේ බුදුරදුන්ගේ ධාතු නිදන්කොට චෛත්‍යක් සෑද වූ බව සඳහන් වේ.
- වේසාලියේ තිබූ චාපාල, සාරන්දද, බහු පුත්තක, ගෝතමක ආදී යක්ෂචෛතිය ස්ථාන බෞද්ධ ආරාම බවට පත්වී ඇති බව උදාන අටුවාවේ සඳහන් වේ.

## ප්‍රභූවරුන්ගේ අනුග්‍රහය

- අනේපිඬු සිටුතුමා, විශාඛා වැනිඋසස් පෙළේ ප්‍රභූන්ගේ හා ධනවතුන්ගේ අනුග්‍රහය ද බුදු සසුනේ ව්‍යාප්තියට මහත් අනුබලයක් විය.

**ආගමික සහනශීලී බව චෛතිය ස්ථානවලට ගරු කිරීම**

- අතීතයේදී චෛති නමින් හැඳින්වූ පූජා ස්ථාන වලට මිනිස්සු විසින් පුද පූජා පවත්වන ලදී.
- එවැනි චෛති වලට උදාහරණ ලෙස බහු පුත්තක චෛතිය, මකුට බන්ධන චෛතිය දැක්විය හැක.
- එහි වසන්නා වූ දේවතාවන්ට පුද පූජා පවත්වා දරුවන් ප්‍රාර්ථනා කිරීම එකල මිනිසුන්ගේ සිරිතක්ව පැවතුණි.
- බුදුරජාණන් වහන්සේ මෙම පැරණි ඉන්දියානු විශ්වාසයන් හෝ පූජා ස්ථාන හෙළා දැක නැත. එයට උදාහරණයක් ලෙස වරක් බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන් සමග චාපාල චෛතිය ස්ථානයට වැඩම කළ විට,

> " ආනන්දය වේසාලිය රමණීයයි, ගෝතමක චෛතිය, බහුපුත්තක චෛතිය රමණීයයි, සත්තම්බක චෛතිය රමණීයයි, චාපාල චෛතිය රමණීයයි "

යනුවෙන් එම ස්ථානවල පැවති රමණීයත්වය අගය කළ බව **පරිනිර්වාණ සූත්‍රයේ** සඳහන් වෙයි.

- අපරිහානීය ධර්ම දේශනා කරන බුදුහු වජ්ජීන් පෙර පටන් චෛතිය පූජාව කරන බවත් එය ඔවුන්ගේ නොපිරිහීමට හේතුවක් බව සඳහන් කරති. නමුත් මේ කිසිවක් බය රහිත නොවේ. උතුම්ද නොවේ. මේ කිසි සරණයකට පැමිණ දුකින් මිදීමට නොපිළිවනැයි උන්වහන්සේ පෙන්වා දුන්හ.

**දේවත්ත්වයෙන් ගිලිහුණු බෞද්ධ දෙවිවරු**

- සමකාලීන ඉන්දියාවේ පැවැති දේව විශ්වාසය බ්‍රහ්ම ඇදහීම නව මුහුණුවරකින් බුදුසමයට ඇතුලත් කරගැනීම ද බුදුසමය ව්‍යාප්තියට ප්‍රබල හේතුවක් විය.
- වෛදික දෙවියන්ගේ වැඩි සැලකිල්ල ලැබී ඇත්තේ අග්නි හටය. නමුත් බුදුසමයේ සඳහන් වන දෙවියන් වූ කලී මිනිසා මෙන්ම පින් පව් අනුව සැරිසරන සත්ව කොට්ඨාසයකි. බුද්ධ දේශනා වල ශක්‍ර දේවේන්ද්‍රයා සහ මහා බ්‍රහ්මයා පිළිබඳ මනාව සඳහන් කර ඇති අතර, මිනිස්සුන්ටද බොහෝ පින්කම් කර එම සැපයන් උදාකර ගත හැකි බව පෙන්වා දී ඇත.

## පැරණි ආචාර ධර්ම හා බෞද්ධ අර්ථකථන

- බුදුරජාණන් වහන්සේ බ්‍රාහ්මණයෙක් ගේ ආගමික ස්වරූපයෙන් ඉදිරිපත් කර තිබුණු ඇතැම් ආචාරධර්ම ස්වකීය නිරුක්තියෙන් ඉදිරිපත් කළහ.

**අභිවාදන සීලිස්ස නිච්චං වද්ධාපචායිනො**

**චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයු වණ්ණෝ සුඛං බලං**

- මේ බව මනාව බ්‍රාහ්මණ ධම්මික සූත්‍රයෙන් පැහැදිලි වේ.

## යාගය පිළිබඳ බෞද්ධ මතය

- බ්‍රහ්මණ ආධිපත්‍ය යටතේ පැවැති අනර්ථකාරී යාග ක්‍රමයන් සාවද්‍ය බව පෙන්වා දෙමින්, සිය දහස් ගණනින් සතුන් බිල්ලට දෙමින් පවත්වන යාගයෙන් ඵලක් නොවන බවත් ඊට වඩා ධර්මයාගේ උතුම් බවත් පෙන්වා දෙන ලදී. ( අස්සමේධ, පුරිසමේධ, සම්මාපාස, වාජපෙය්‍ය, නිරග්ගල )

## පව් සේදීම

- එවක මහජනයා තුළ පිළිගැනීමට භාජනය වූයේ පුණ්‍ය තීර්ථයන් හැටියට පත්වූ ගංගාවන්ගෙන් නෑමෙන් පව් සේදී යන බවයි. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ අකුසල කර්ම කරන්නා කොපමණ ගංගාවන් හී ස්නානය කලත් වැඩක් නොවන බවයි. මේ පිළිබඳව පැවති සාකච්ඡාව **මජ්ඣිම නිකායේ වත්ථූපම සූත්‍රයේ** ඇතුළත් වේ.

## දිසා නමස්කාරය

- දිසා නමස්කාරය වෛදික යුගයේ සිට දඹදිව පැවති සිරිතකි.
- බුදුරජාණන් වහන්සේ සිඟාල ගෘහපතියාට දිසා වන්දනාවට නව අරුතක් එක් කර දුන්හ.

## වර්ණ භේදය

- කුල භේදය එකල සමාජයේ පදනම විය.
- ***බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්ෂුද්‍ර*** යනුවෙන් ප්‍රධාන කුල සතරකින්
- ***ක්ෂුද්‍රයන් යනු මෙම කුල අතුරෙන් පහත්ම කුලයයි.*** ඔවුන්ගේ යුතුකම වූයේ අනෙක් උඩ තුන අයට බැලමෙහෙවර කිරීමයි.

- ක්ෂුද්‍රයන්ට වඩා පහත් කුලයක් වූ පංචම නම් ජන කොට්ඨාසයක් ද එකල දක්නට ලැබුණි. ***වේණ, නේසාද, පුක්කුස, රථකාර, චණ්ඩාල*** ආදී නම් වලින් එම පස් වන කුලයට අයත් වූවෝ හඳුන්වනු ලැබූ අතර ඔවුන් කුල හීනයන් ලෙස සලකනු ලැබීය.

- බමුණන් විසින් ගොඩනැංවූ කුල සංස්ථාව තුළ එකල මිනිස් මිනිස් අයිතිවාසිකම් පවා අහිමි වූ ජන කොටස් ද සිටියහ.

- මිනිසාගේ සිල්වත්කම හා නුවණ අනුව මනින විට කුල භේදයේ වූ වටිනාකමක් නැති බව බුදුසමයෙන් පෙන්වා දෙනු ලැබීය. ඒ බව මනාව පෙන්වා දෙන්නේ වාසෙට්ඨ, අස්සලායන, වසල වැනි සූත්‍ර වලිනි.

- මේ අනුව බුදු බුදු දහමේ පෙනුණු සමානාත්මතා ධර්මය සමාජයේ සියලුම දෙනාට නිදහස හා සහනය ලබාදුනි.

- බුදු දහමේ සීඝ්‍ර ව්‍යාප්තියට මෙය ද ප්‍රබල හේතුවක් විය.

## කාන්තා විමුක්තිය

- වෛදික යුගයේ දී කාන්තාවට උසස් තැනක් ලැබී තිබුනත්, බ්‍රාහ්මණ ඉගැන්වීම් යටතේ ඇයට හිමි වූයේ පහත් ජීවන ක්‍රමයකි. එබැවින් ගැහැණු දරුවකුගේ උපත ගැන දෙමාපියෝ බිය වූහ. කාන්තාව කුඩා කාලයේ පියා යටතේ ද තරුණ කල ස්වාමියා යටතේ ද මහලු කල පිරිමි දරුවන්ව ජීවත් විය යුතු බව බ්‍රහ්මණ ඉගැන්වීම ද සඳහන්ව ඇත. ආගමික වශයෙන් ද කාන්තාවට කිසිදු සහනයක් හිමි නොවුණි.

- බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ නැණවත් වූ සිල්වත් වූ නැදි මයිලන් දෙවි කොට සලකන්නා වූ, පතිවත රකිනා වූ, කාන්තාව ශ්‍රේෂ්ඨ වන බවයි. එමෙන්ම ධර්මය අවබෝධ කිරීමේ දී නුවණ ඇත්නම් ස්ත්‍රීභාවය බාධාවක් නොවන බවත් බුදු සමයෙන් අවධාරණය කොට ඇත. කාන්තාවන් වෙනුවෙන් භික්ෂුණී සමාජය පිහිටුවීම නිසා ආගමික වශයෙන් තම අයිතිවාසිකම් ලැබීමටද කාන්තාවන් වාසනාවන්ත විය.

## නිදහස් චින්තන ක්‍රමය

- බුදුසමය නිදහස් චින්තනය හා විමසීමට මහ පෙන්වන්නක් විය. ඒ බව මනාව පැහැදිලි කර දෙන්නේ ***කාලාම සූත්‍රයෙනි.***

## මෙලොව යහපත

- බුද්ධ ධර්මය පරලොව සැපත ගැන පමණක් නොව මෙලොව ජීවිතය සාර්ථක කරගන්නා කරගන්නා සැටිද උගන්වා ඇත.

- ධනය උපයන සැටිත්, උපයාගත් ධනය වියදම් කළ යුතු අන්දමත් බුදු දහමෙන් උගන්වයි.

- පරම සැපය හැටියට නිර්වාණ සුවය හඳුන්වා දෙන නමුත් පුද්ගලයකුට එයින් මෙහා ළඟා කරගත හැකි ලෞකික සැප ගැනද හඳුන්වා දෙයි.

- අල්පේච්ඡතාව මගින් සැපවත් විය හැකි බවත් මහේච්ඡතාව මගින් අතෘප්තිය වැඩි කරන බවත් බුදු දහමේ ඉගැන්වේ.

- මෙවැනි කරුණු නිසා බුදු දහම කෙරෙහි සම කාලීන භාරත වැසියාගේ ඇල්ම වැඩි විය.

## බෞද්ධ දේශපාලන දර්ශනය

- පාලකයෙකු අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති මෙන්ම රජවරුගේ පැවතුම් හා ආචාර ධර්ම පිළිබඳව ද බුදුසමය අවධාරණය කොට ඇත. මේ පිළිබඳව දක්වා ඇති සූත්‍ර දේශනා ලෙස ***චක්කවත්ති සීහනාද සූත්‍රය, අග්ගඤ්ඤ සූත්‍රය, කූටදන්ත වැනි සූත්‍ර*** දේශනා හැඳින්විය හැක.
- මුලින් ආර්ථික ප්‍රශ්න මුල් කොට ගෙන සමාජය සදාචාරාත්මක වශයෙන් පිරිහීමට පත්වන අතර අනතුරුව ඒ හේතුකොටගෙන සමාජ සංස්ථාවන් පිරිහී යන අන්දම චක්කවත්ති සීහනාද සූත්‍රයෙන් ප්‍රකාශ වෙයි.
- කූටදන්ත සූත්‍රයෙන් මූලිකවම දක්වන්නේ රට වැසියාගේ ආර්ථික සුබසිද්ධිය උදෙසා පාලකයකු සතු වගකීම් හා යුතුකම් ගැන ය.
- ***චක්කවත්තිසීහනාද හා අග්ගඤ්ඤ සූත්‍ර*** දෙකෙන් තවදුරටත් ප්‍රකට කරන්නේ රාජ්‍ය බලය හා ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය එකට ගලපන්නට බුදුසමය දරණ උත්සාහයයි.
- පාලකයෙකුගේ ආචාරධර්ම හැටියට ***දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය*** යන සතර සංග්‍රහ වස්තු ද දසරාජ ධර්ම ද අනුගමනය කළ යුතු බව පෙන්වා දෙයි.
- පාලකයන්ගේ මෙන්ම සාමාන්‍ය පුරවැසියන්ගේ ද ප්‍රසාදය බුදුසමය කෙරෙහි ඇති වීමට මෙයද හේතුවක් විය.

## සංඝ සමාජයේ ව්‍යාප්තිය

### පැරණි භාරතීය පැවිදි ජීවිතය

**බෞද්ධ භික්ෂූන් වහන්සේ ,**

- ජීවියෙකු ලෙස උපත ලබන්නෙකුට මුහුණ දිය හැකි ප්‍රධාන ප්‍රශ්නය වනුයේ ජරා,මරණ ආදියෙන් මැඩ පැවැත්විය හැක්කේ කෙසේද යන්නයි. ගෞතම බුදුරජාණන් වහන්සේගේ ප්‍රධාන අරමුණ වූයේ ද එම දුක අභිභවනය කොට දුක් ගිනි නිවා දමා නිවන් ලැබීමේ මඟ පෙන්වීමයි. ඒ සඳහා අවිද්‍යාවත් ආශාවත් සහමුලින්ම ඉවත්කිරීමේ උපත නතර කළ හැකි බව උන්වහන්සේ ප්‍රත්‍යක්ෂ කර ගන්නා ලදී. එම මාර්ගයේ ගමන් කිරීමට දක්ෂ පින්වතුන් ගිහි බැමි වලින් මිදී භික්ෂු සමාජයට ඇතුළත් වූහ. භික්ෂූන් පිල්බර නැති වළාකුළු විනිවිද පියැඹීමේ දක්ෂ ජවසම්පන්න ස්වර්ණහංස රාජයෙකුට බුදුරදුන් උපමා කළහ. අවිද්‍යාවත්, ආශාවත් තම සිතින් බැහැර කරලීම පිණිස භික්ෂුව විසින් ප්‍රගුණ කළ යුතු ශික්ෂණ ක්‍රමයක් ද බුදුරදුන් විසින් නියම කොට ඇත.එම ශික්ෂණ මාර්ගය බුදුසමයෙහි ලා හැඳින්වෙන්නේ හැඳින්වෙන්නේ අධිශීල ශික්ෂා, අධිචිත්ත ශික්ෂා, අධි ප්‍රඥා ශික්ෂාව යනුවෙනි. ජීවිතයේ ප්‍රශ්න අවසන් කිරීම සඳහා මෙය ක්‍රියාමාර්ගය අනුගමනය කළ යුතුය. ඒ සඳහා ක්‍රියාකාරී වීමත්, අන්‍යයන් ඊට යොමු කරවීමත් භික්ෂු සමාජයේ මූලික අරමුණයි.

## සංඝ සමාජයේ වැඩීයාම

**ප්‍රථම රහත් හැටනම**

- අඤ්ඤාකොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන පස්වග තවුසන්
- යසකුල පුත්‍, ඔහුගේ යහළු විමල, සුබාහු, පුණ්ණජී,හා ගවම්පති ඇතුළු යහළුවන් පනස් දෙදෙනෙකු

මේ සියලු පිරිස ඒහි භික්ෂු භාවයෙන් පැවිදි උපසම්පදාවට පත්විය.

- අනතුරුව භද්දවග්ගිය කුමාරවරුන් තිස් දෙනාත්, ශ්‍රාවක පිරිස සමග ජටිල සොහොයුරෝ තිදෙනාත්, ඒ ආසන්න සමයේ දී උපතිස්ස හා කෝලිත පිරිවැජියෝ දෙදෙනාද භික්ෂු සමාජයට ඇතුළත් වී ඒහි භික්ෂු භාවයෙන් පැවිදි විය.

**ප්‍රාදේශීය වශයෙන් පැවිදි කිරීමට අවසර දීම**

- මුල්ම ශ්‍රාවක වහන්සේලා හැට නම ගේ ක්‍රියා පිළිවෙත් දුටු භාරත වැසියෝ බුදුසමය කෙරෙහි ඉමහත් ප්‍රසාදයක් ඇති කර ගත්හ. එබැවින් පැවිදිවීමට කැමැත්ත දැක් වූවන්ගේ සංඛ්‍යාව ද ශීඝ්‍රයෙන් වැඩි විය. නොයෙක් ප්‍රදේශවල සිටි ඔවුන් බුදුරදුන් වෙත කැඳවාගෙන ඒමට සිදුවීම නිසාත් එය ප්‍රායෝගිකව කළ නොහැකි වීමක් නිසා, බුදුරජාණන් වහන්සේ ඒ ඒ ප්‍රදේශ වලදීම පැවිදි උපසම්පදා කරවීම සඳහා අවසරය ලබා දුන්හ.
- මේ අසංග සංඝ සංවිධානය විමධ්‍යගත කිරීමකි. එහිදී අනුගමනය කළේ කෙස් රැවුල් කප්පවා, සිවුරු හැඳ පොරවා, තිසරණයේ පිහිටුවීමෙන්, පැවිදි උපසම්පදාව ලබා දීමයි. මේ නිසා භික්ෂුත්වය ලබන්නන්ගේ සංඛ්‍යාව ද විශාල විය.
- මේ වකවානුවේ භික්ෂූන් වහන්සේලා සතුව පැවැතියේ ඕවාද ප්‍රාතිමෝක්ෂ සංවර සීලයයි.
- මුල්කාලීන භික්ෂූන්වහන්සේලාට ශික්ෂාපද පැනවීමක් සිදු නොවූ අතර, පසුකාලීනව බුදුරජාණන් වහන්සේ භික්ෂූන් විසින් ප්‍රගුණ කළ යුතු ශික්ෂා පද හා සීලයන් පැනවීය.

**ආචාර්ය උපාධ්‍යායන් පත්කිරීම**

- පැවිදි වැන්නවුන්ගේ ගණන ක්‍රමයෙන් වැඩි වෙනවාත් සමග ගුරුවරු නැතිකමිනුත්, සිවුරු පෙරවීම ආදී වත් නොදැනීමෙනුත්, භික්ෂූහු අශෝභන ක්‍රියා කරන්නට වූහ. ඒ අනුව විවිධ තරාතිරම්වල සිටි පින්මඳ නවක භික්ෂූන් සංවරයේ පිහිටුවනු සඳහා බුදුරදුන් විසින් ආචාර්ය, උපාධ්‍යාය, අන්තේවාසික, සද්ධිවිහාරික වශයෙන් ගුරු ශිෂ්‍ය ක්‍රමයක් ඇති කරන ලදී.

**ඥත්තිචතුත්ථකම්ම උපසම්පදාව**

- මුල් කාලයේ දී එක් භික්ෂුවකට පමණක් ශිෂ්‍යයකු පැවිදි උපසම්පදාව කළ හැකිව තිබුණි.
- ඥත්තිචතුත්ථකම්ම උපසම්පදාවට අනුව උපසම්පදා අපේක්ෂකයා වෙනුවෙන් වගකිව යුතු ආචාර්ය උපාධ්‍යාය යන දෙපළක් පෙනී සිටිය යුතු අතර සංඝයා මධ්‍යයේ දී සතර නමක් විසින් එය කළ යුතු විය.
- උපසම්පදාවෙන් පසු ව ආචාර්ය හා උපාධ්‍යාය සද්ධිවිහාරික, අන්තේවාසික වත් දක්වා තිබුණු බැවින් ඔවුන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය දියුණු විය.
- එමෙන්ම බුදුරජාණන් වහන්සේ විසින් පැවිදි උපසපන් කළ යුතු හා නොකළ යුතු පුද්ගලයන් පිළිබඳව නීති රීති පැනවූහ.

**පරිවාස කාලයක්**

- වෙනත් ආගමික නිකායන්ට අයත් පුද්ගලයන් සංඝ සමාජයට ඇතුළත් කර ගැනීමේදී සිව් මසක් පිරිවෙස් විසිය යුතුය. ජටිලයින් හා ශාක්‍යයන් සඳහා එය එතරම් බලපා නැත. ඊට හේතු වී ඇත්තේ ජටිලයින් කර්මවාදීන් වීමත් ශාක්‍යයන් බුදුරදුන්ගේ ඥාතීන් වීමත් ය.
- විනය මහා වග්ගයේ සඳහන් සසුනට ඇතුළත් නොකළ යුතු පුද්ගලයින්

දරුණු රෝග වලින් පෙළෙන පුද්ගලයින්, රාජ භටයින්, සොරුන්, ණයකාරයන්, දාසයන්, ආනන්තරිය කර්ම කළවුන්, අංගවිකල වූවන්

**පැවිද්ද**

- සසුන්ගත වීමට කැමතිවන්නාවුන්ට පැවිද්ද දී සාමණේරයෙකු බවට පත් කරයි.
- එහිදී තිසරණ වාක්‍ය කීම පමණක් සිදුවේ.
- මේ අවස්ථාවේදී තමාගේ උපාධ්‍යායවරයා හා ආචාර්යවරයා තෝරා ගැනීමට සිදු වෙයි. එම දෙදෙනාම බහුශ්‍රැතයන් මෙන්ම උපසම්පදාවෙන් දස වස් ඉක්මවූවන් විය යුතුය.

**පැවිද්ද**

- සාමණේර තැන සංඝ සමාජයේ නිත්‍ය සාමාජිකයෙකු හෙවත් භික්ෂුවක් බවට පත්වේ.
- ඒ අලුත් උපසම්පදා වූ භික්ෂුව ගුරුවරයෙකු යටතේ පුහුණුව ලැබිය යුතුය.
- එය "නිස ලබා ගැනීම" යනුවෙන් හැඳින්වේ.

**වයස් සීමාව**

- මුල් අවස්ථාවේදී පැවිදි උපසපන් වීම සඳහා වයස් සීමාවක් නොවීය.
- එහෙත් ලාබාල වියේදී පැවිද්ද ලැබූවන් ශික්ෂාපද රැක ගැනීමේ ලා අපොහොසත් වූ බැවින් බුදුරජාණන් වහන්සේ පැවිද්දට පසළොස් වර්ෂයක්ද, උපසම්පදාවට විසි වර්ෂයක්ද නියම කළහ.

- පැවිදිවීමේ පසළොස්වක් සීමාව නැවත සංශෝධනය විය. එනම් පිඩුසිහා යනවිට පාත්‍රයට එන කපුටකු එළවා ගැනීමට හැකි තරම් දරුවෝ පැවිදි කිරීමට අවසර දී ඇත.

- එමෙන්ම පැවිදිවීම සඳහා භාරකරුවන්ගේ අවසරය ද ලබා ගත යුතුය.

**වස් විසීම**

- භාරතීය භූගෝලීය පරිසරය අනුව පරිසරයේ පවත්නා අධික වර්ෂාව නිසා පැවිද්දන්ට දුෂ්කරතා ඇති විය.එබැවින් ඔවුහු එකතැනක පදිංචිව කල් ගෙවූහ. ජෛන ආගමික විශ්වාස අනුව වැසි සමයේ නව ජීවනය ලබා පිබිදෙන තුන් ආදී ජීව සතුන් පැහැදීම නොමනා ය.මුල් කාලයේදී බෞද්ධ භික්ෂූන් මේ කරුණු ගැන නොසලකා චාරිකාවේ යෙදුණු නිසා මහජනතාවගේ දෝෂ දර්ශනයට ලක් විය. වැසි සමයෙහි වස් එළඹ එක තැනකට වී වැඩ වසන ලෙස බුදුරදුන් භික්ෂූන්ට උපදෙස් දී වදාළේ මේ කරුණු සැලකිල්ලට ගනිමිනි.

- එමෙන්ම වස් කාලයේ වස් එළඹි භික්ෂූන් වහන්සේලා ආගමික ප්‍රතිපත්තිය තුළ ශක්තිමත් වේ.

**ආරාම පිළිගැනීම**

- භික්ෂූන් වහන්සේලා මේ වනතුරු වාසය කළේ අරඤ්ඤ, රුක්ඛමූල, කන්දර, ගිරිගුහා, සුසාන, වන පත්ථ, අබ්භෝකාස, පලාල පුඤ්ජ යන ස්ථානවලය.

- පසුව රජවරු සිටුවරු විසින් භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් විහාර ආරාම පාසාද ඉදිකරන ලදී.

- අනේපිඬු සිටුතුමා විසින් මේ සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විත විහාරයක් කරවූ බව චූලවග්ගයේ සඳහන් වේ. එම විහාරය විහාර, පරිවේණ, කොට්ඨක, උපට්ඨාන සාලා, කප්පියකුටි, අග්ගිසාලා, වච්චකුටි, චංකමණ, චංකමණසාලා, උදපාන, උදපාන සාලා, පොක්ඛරණී මණ්ඩප ආදි සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විත වෙයි.

- මෙසේ ක්‍රමයෙන් මෙතෙක් පැවති සංචාරක ජීවිතය අභාවයට ගොස් ආශ්‍රමික සංස්ථාවක් ගොඩනැගුණි.

**පවාරණය**

- වස් විසීම ඇසුරු කොට ගෙන "පවාරණය" හා "කඨිනය" යන චාරිත්‍ර දෙකක් ඇති වූ අතර එම චාරිත්‍ර දෙක මුල් කොටගෙන තවත් නීති සමූහයක් පැනවීමට සිදු වූ බව මහාවග්ගපාලියේ එන පවාරණ- කඨින ඛන්ධකයන්ගෙන් පෙනේ.

- භික්ෂු සංඝයාගේ සමගියත් ශික්ෂණයක් උසස් වනු පිණිස වනු පිරිස පොහොය කිරීම යනුවෙන් සඳහන් වන විනය කර්මය සිදු කරයි. එය සඳහා දෙසතියකට වරක් රැස්වේ. එවැනි රැස්වීම් සඳහා සීමා උපෝසථාගාර සම්බන්ධ කරගැනීමට අවශ්‍ය නීතිය හා උපදෙස් ද බුදුරදුන් පෙන්වා දී ඇත. ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීම මෙහි මූලික අංගයකි. මෙම විනය කර්මය හා සම්බන්ධ සීමා නියම කිරීම භික්ෂු සමාජයේ විකාශනයට බලපෑ කරුණකි.

**ශික්ෂාපද පැනවීමේ පදනම**

- සංඝයාගේ සංවරය හා පහසුව, අප්‍රසන්න අයගේ ප්‍රසාදය, ප්‍රසන්නයන්ගේ වැඩි ප්‍රසාදය, සද්ධර්මයාගේ චිරස්ථිතිය හා විනය අනුග්‍රහය ආදිය උදෙසා ශික්ෂාවන් පැනවූ බව චූලවංශයේ සඳහන් වේ. කිසිම විනය නීතියක් නිධානයකින් තොරව පනවා නැත.

- කලක් යනතුරුම බුදු සසුනේ ගැටලු ඇති නොවුණහොත් පිරිසේ විපුලත්වය නිසා, සසුන් බඹසර හැසිරීමෙන් පිටස්තර ක්‍රියාවන්ටද භික්ෂූහු පෙළඹුණහ. මේ හැර ජෛන ආදී අන්‍යශාස්තෘ ශාසනයන්ගේ බලපෑම නිසා ද බුදුරදුන් ශික්ෂාපද පනවා ඇත.

- සතර පාරාජිකාවන්ගෙන් උත්තරී මනුස්ස ධම්ම පාරාජිකාව හැරුණ විට අනෙක් පාරාජිකා තුනම ජෛන ශාසනයේදී දක්නට ලැබේ. වස් විසීම පිළිබඳ ප්‍රඥප්තිය මහජන උද්ඝෝෂණයක් මත පැන වූවකි. පොහොය කිරීම නම් වූ විනය කර්මය ද බිම්බිසාර රජුගේ ඉල්ලීමක් මත පැනවූ බව පිළිගැනේ.

**ප්‍රාදේශීය අවශ්‍යතාවන්ට ඉඩදීම**

- සංඝ සමාජය වැඩි යාමත් සමඟ  පැනනැගුණු ප්‍රාදේශීය අවශ්‍යතා මත විනය නීති ප්‍රතිසංස්කරණය කෙරුණි.
- පාංශුකූල චීවරයත් සමග ගහපති චීවරය අනුමත විය.
- කප්පාසිත කෝසෙය්‍ය සිවුරු ලැබීම හා පාවිච්චිය මුල්කොට විනය නීති පැනවීම.
- පූතිමුත්ත භේසජ්ජ වෙනුවට සප්පි නවනීත හා අෂ්ටපාන වර්ගද පිළි ගැනීමට ඉඩදීම.
- සාමාන්‍යයෙන් ඇඳ පුටු ආදි ආසන සඳහා සතුන්ගේ හම් භාවිතා කිරීමට මුලදී භික්ෂූන්ට අවසර නොලැබුණු අතර අවන්ති දක්ෂිණාපථ වාසී භික්ෂූන් සම්බන්ධයෙන් පසුව වෙනසක් සිදු කොට ඇත. එම පෙදෙස් වැසි භික්ෂූන් එළු, අජ හා මිග වැනි හම් භාවිතා කළ බව මහාවග්ගයේ සඳහන් වේ.
- බුදුරදුන් වෙත පැවති බලතල පසුකලෙක භික්ෂූන් වෙතම පවරා ඇත. උපසපන් භික්ෂූන් විසිදෙනකු සම්බන්ධව කළ යුතු කළ යුතු ***"අබ්භාහන කර්මය"*** නිදසුනකි.
- විනය නීති කඩ කරන්නන්ට දඬුවම් ද එම දඬුවම් දීමේ දී අනුගමනය කළ යුතු නීත්‍යානුකූල ක්‍රියා පිළිවෙලක් ද අවශ්‍ය විය. ඒ සඳහා තජ්ජනීයාදි විනය කර්මය ඇතිවිය. ඒ පිළිබඳ විස්තර චූලවග්ගයේ කම්මඛන්ධකයේ සඳහන් වේ.

**ප්‍රාතිමෝක්ෂය සහ ශික්ෂා පද**

- භික්ෂු භික්ෂුණීන්ගේ සංවරයට උපයෝගී වන සප්ත ආපත්තිස්කන්ධයන් ගෙන් සමන්විත ***ශික්ෂාපද 227කින්*** සමන්විත ***උභය ප්‍රාතිමෝක්ෂය*** බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලදී.

එහි ශික්ෂාපද පහත පරිදි දැක්විය හැක

- පාරාජිකා - 4
- සංඝාධිශේෂ - 13
- අනියත - 2
- නිස්සග්ගිය - 30
- පාචිත්තිය - 92
- පාටිදේශනීය - 4
- සේඛියා - 75
- අධිකරණසමථ - 7

- මෙහි අධිකරණසමථයන් හැර ඉතිරි කොටස් හත සප්ත ආපත්තිස්කන්ධයක් ලෙස ව්‍යාවහර කෙරේ. සමකාලීන සමාජ ආර්ථික හේතූන් අනුව බුදුරදුන් ශික්ෂාපද පනවා ඇතත්, ඒවා සදාකාලිකවම එලෙසින්ම ආරක්ෂක විය යුතු යැයි බුදුහු අපේක්ෂා නො කළහ. සංඝ සම්මුති අනුව ඛුද්දානු ඛුද්දක ශික්ෂාපදයන් වෙනස් කර ගැනීමේ නිදහස ලබාදී ඇත්තේ ඒ නිසාය.

- මේ අන්දමින් විමසා බලන විට ප්‍රධාන අවස්ථා තුනක් ඔස්සේ භික්ෂු සමාජය ව්‍යාප්ත වී ඇති බව පෙනේ. එනම් සංචාරක යුගය, සංචාරක ආරාමික යුගය හා ආරාමික යුගය වශයෙනි.

# 2. ධර්ම සංගායනා

බුදුන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු බෞද්ධ දේශනා සහ සිද්ධාන්තයන් ඒ අයුරින්ම පවත්වාගෙන යාම සඳහාත්, බුද්ධශාසනය තුල විනය නියමයන් ඒ ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහාත් වරින්වර ධර්මසංගායනා පවත්වා තිබේ.

## ප්‍රථම ධර්ම සංගායනාව

- විනය සංගීති නමින්ද මෙම සංගායනාව හඳුන්වයි. සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව මෙම සංගායනාව පවත්වා ඇත.
- මෙහි අරමුණ වූයේ විසිරී ඇති ධර්ම විනය ඒකරාශී කොට වෙනස්කම්වල ට භාජනය වීමට ඉඩනොදී ආරක්ෂා කර තබාගැනීම ය.

➢ චුල්ලවග්ගයේ එන වාර්තාව අනුව ප්‍රථම සංගීතියට මූලික ලෙස හේතු දෙකක් පාදක වී ඇත.

**1.සුභද්ද භික්ෂුවගේ වගකීමෙන් තොර ප්‍රකාශය.**

බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීම අසා සොවින් වැළපෙන පෘථග්ජන භික්ෂූන් අස්වැසීමට සුභද්ද භික්ෂුව කළ ප්‍රකාශය වූයේ "ඇවැත්නි; සෝක නොකරව්, නොවැලපෙව් ඒ මහා ශ්‍රමණයාගෙන් අපි හොඳින් මිදුනෙමු. මේ තොපට කැපය. මේ අකැපයැයි ඔහුගේ නීති පැනවීමෙන් අපි පීඩා වින්දෙමු. දැන් අපි යමක් කැමතිනම් එය කරන්නෙමු. යමක් අකමැතිනම් එය නොකරන්නෙමු." යියන්නය.

**2.ධර්මය හා විනය අනාගතයෙහි දී පිරිහී අධර්මය, අවිනය රජවෙතැයි ඇතිවූ භීතිය, බුද්ධ භාෂිත ලෙස බොරු සූත්‍ර සකස්කර ධර්මයට වැරදි අර්ථවිවරණ ඉදිරිපත් කෙරෙනු ඇතැයි ද එකළ තෙරවරු බිය වූහ.**

- මහාසාංඝික, මහීසාසක, ධර්මගුප්තික හා සර්වාස්තිවාදී සම්ප්‍රදායන්ට අයත් විනය ග්‍රන්ථවල ද ප්‍රථම ධර්ම සංගායනාවට හේතු මෙලෙස සඳහන් වේ.
- මෙම මූලික හේතුවට අමතරව තවත් හේතු රාශියක් පළමු සංගායනාව පැවැත්වීමට හේතු වූ බව මූලාශ්‍රවල හඳුනාගත හැකිය.
- ඒ අතර මූලික වන්නේ බුදුන් ජීවමාන කලයේදි සංඝ සමාජය තුල විවිධ ගැටලු පැවති අතර ඒම ගැටලු උන්වහන්සේගෙන් පසුව තව තවත් බහුල විය හැකි නිසා සංගායනාවක් පවත්වන්නට අවශ්‍ය වන්නට ඇත.
- මන්ද සුභද්ද වුවද ඉහත ආකාරයේ ප්‍රකාශයක් බුද්ධ පරිනිර්වාණයත් සමහම සිදුකිරීම බුදුන් ජීවමාන කාලයේ පැවති ගැටලුවල ප්‍රතිඵලක් බව සිතිය හැකිය.

## සංගායනාව පැවැත්වූ ආකාරය

- මහරහත් වහන්සේලා 500 නමකගේ සහභාගීත්වය තිබූ අතර මූලිකත්වය ගෙනකටයුතු කළේ මහාකාශ්‍යප මහරහතන්වහන්සේය. (භික්ෂූන්වහන්සේලා පන්සිය නමකගේ සහභාගීත්වයෙන් පැවති මෙම සංගායනාවට පංච සතිකා සංගීති යැයි දකියනු ලැබෙ.)

## සංගායනාව පැවැත්වූ ස්ථානය

- ථෙරවාදී මූලාශ්‍ර වල සඳහන් පරිදි රජගහනුවර වේභාර පර්වත ප්‍රාන්තයෙහි සප්තපර්ණී ගුහා ද්වාරය.

## රාජ අනුග්‍රහය

- වංශකථාවන්හි හා සමන්තපාසාදිකා විනය අටුවාවේ සඳහන් පරිදි අජාසත් රජතුමාගෙනි.

## සංගායනාව පැවැත්වීම හා ප්‍රතිඵල

- උපාලි හිමියන්ගෙන් පළමුව විනය ප්‍රශ්න විචාළහ.
- නිදානපුග්ගල, වස්තු, ප්‍රඥප්ති,අනුප්‍රඥප්ති, ආපත්ති, අනාපත්ති යනාදී විස්තර සහිතව භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ ශික්ෂාපද සියල්ලම පුජ්ජා විස්සජ්ජන ක්‍රමයෙන් විනය සංගායනා කළහ.
- අනතුරුව, ධර්ම සංගායනා කළහ.
- ප්‍රශ්නෝත්තර ක්‍රමය මේ සඳහා යොදාගත්හ.

- අනඳ තෙරණුවන් ලවා පංච නිකායම සංගායනා කළහ.
- සූත්‍ර පිටකය හා අභිධර්මය මෙහිදී සංගායනාවට භාජනය විය.
- ඛුද්දානු ඛුද්දක ශික්ෂාපද පිළිබඳව සාකච්ඡා කළහ.
- සංගායනාවෙන් පසුව ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩය පැන වීය.
- අනඳ තෙරුන්ට එරෙහිව චෝදනා 5ක් සංගීතිය අවසානයේ එල්ලවූ අතර තමන් එයට නිර්දෝශී වීමට හේතු සාධක ද අනඳ තෙරුන් විසින් ඉදිරිපත් කළහ.

1. ඛුද්දානු ඛුද්දක ශික්ෂාපද බුදුන්ගෙන් නොවිචාරීම. බුදුරදුන් ඛුද්දානු ඛුද්දක ශික්ෂාපද පිළිබඳව ප්‍රකාශ කරන අවස්ථාවේදී තමන් ඉතා ශෝආතුරව සිටිනිසා අසා දැනගැනීමට නොහැකි වූ බව.
2. බුදුරදුන්ගේ වැසි සළුව පයින් මැඩගෙන මැසීම. සිවුර මසද්දී සහායවීමට කිසිවෙකු නොසිටි බැවින් එසේ කරන්නට සිදුවිය.
3. බුද්ධ ශරීරය පළමුව කාන්තාවන් ලවා වැන්දවීම. බුදුරදුන්ගේ ශ්‍රී දේහයට බුහුමන් දැක්වීමට පැමිණීම හා ජනකාය බහුලවීම නිසා කාන්තාවන්ට කල් වේලා ඇතිව නිවෙස්වලට යාමට ඉඩ සැලැස්වීම.
4. චාපාලචේතියේදී බුදුන් පිරිනිවන්පාන බව අභවද්දී කල්පයක් ජීවත්වන ලෙසට බුදුන් වහන්සේට ආරාධනා නොකිරීම. තමන්ගේ සිතද එවෙළෙහි මරුට වසඟව තිබූ හෙයින් එසේ ඉල්ලා සිටීමට නොහැකිවීම.
5. තථාගත ශාසනයේ ස්ත්‍රීන්ට පැවිද්ද ලබාදීමට උත්සාහවත් වීම. ප්‍රජාපතී ගෝතමිය කෙරෙහි තිබූ මහත් ගෞරවය නිසා එලෙස කිරීම.

අනඳ හිමියන්ට එරෙහිව පැවති චෝදනා 5 ට අතිරේකව ටිබෙට් දුල්වා ග්‍රන්ථයෙහි තවත් චෝදනා 2 ක් දක්වා ඇත.

- පිරිනිවන් පෑමට සිටි බුදුරදුන් පිපාසිතව පැන් ඉල්ලූ අවස්ථාවෙහි පැන් නොපිළිගැන්වීම.
- බුදු සිරුරේ රහස්‍ය ස්ථාන රාගී ගිහියන්ට පෙන්වීම

## ප්‍රතිඵල

1.එක් එක් ධර්ම කොටස් භික්ෂු පරම් පරාවන්ට ආරක්ෂාකොට පවත්වාගෙනයාම සඳහා පැනවීම.

- දීඝනිකාය- ආනන්දහිමි ඇතුළු ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට
- සංයුත්තනිකාය- මහා කාෂ්‍යපහිමි ඇතුළු ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට
- අංගුත්තර නිකාය -අනුරුද්ධ හිමි ඇතුළු ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට
- මජ්ඣිමනිකාය- සැරියුත්හිමි ඇතුළු ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට
- ඛුද්දකනිකාය -සියලුම වහන්සේලා එක්ව මුඛ පරම්පරාගතව

2.බුද්දානු බුද්දක ශික්ෂාපද වෙනස් නොකිරීම.

3.අනඳ තෙරුන්ට තිබූ චෝදනා වලින් නිදහස් වීම.

## දෙවන ධර්ම සංගායනාව

- බුද්ධ පරිනිර්වාණයෙන් වසර 100 කට පසුව මෙම සංගායනාව පවත්වා ඇත.

## ධර්මසංගායනාව පැවැත්වීමට හේතු

- වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත් කළ දස අකැප වස්තුව චුල්ලවග්ගපාලියේ සඳහන් දසඅකැප වස්තුව

1.සිංගිලෝණ කප්ප - ආහාර වලට මිශ්‍ර කරගැනීම සඳහා අහකදමා ලුණු තබාගැනීම සුදුසුය.

2.ද්වංගුල කප්ප - ඉරහැරී සෙවනැල්ල අඟල් වන තුරු ආහාර වැළඳීම කැපය.

3.ගාමන්තර කප්ප - වරක් වළදා අවසන්කොට තවත් ගමකට ගොස් දන්වැළදීම කැපය.

4.ආවාස කප්ප - මහා සීමාව තුළ පිහිටි කුඩා කුඩා ආවාසයන්හි වෙන වෙනම පොහොය කිරීම කැපය.

5.අනුමතිකප්ප - එක සීමාවක් ඇතුළත වාසය කරන භික්ෂූන්ගේ කැමැත්ත නොගෙන වෙන් වෙන්ව පොහොය කොට නැවත කැමැත්ත ගැනීම කැපය.

6.ආචිණ්ණ කප්ප - කැප අකැප දෙයක් ගැන නොසලකා චිරාගත දේ පිළිගැනීම කැපය.

7.අමථිත කප්ප - කිරිත් නොවූ දීත් නොවූ කිරි වැළඳීම කැපය.

8.ජලෝගික කප්ප- රා බවට නොපැමිණි මී රා බීම කැපය.

9.අදසක නිසීදන කප්ප- දාවලු නැති ඇතිරිලි පරිහරණය කැපය.

10.ජාත රූප රජත කප්ප- රන් රිදී පිළිගැනීම කැපය.

▪මහා සාංඝික දශ වස්තුව

01. අලල යයි කීම කැපය;

02. තමාම විනෝද වීම කැපය;

03. තමාම පොළව හැරීම කැපය;

04. දුර හුදෙකලා වාසීන්ට ලුණු තැන්පත් කිරීම කැපය;

05. තම ආරාමයෙන් යොදුන් අඩ යොදුන් දුර ගමන් යන භික්ෂුවට ආහාර ගෙනයාම කැපය;

06. ඉර අවරට ගිය පසු ඇඟිල්ලෙන් වැළඳීම කැපය;

07. රෝගීන්ට මද්‍යා පානය කැපය;

08. කිරිත් නොවූ දීත් නොවූ කිරි බීම කැපය;

09. දා වලු නැති ඇතිරිලි කැපය;

10. රන් රිදී මසු කහවණු කැපය;

▪සර්වාස්ථි වාදීන්ගේ 'විනය ක්ෂුද්‍රක' ග්‍රන්ථයෙහි දශවස්තුව මෙලෙස දක්වා ඇත.

01. යාව ජීවක ලුණු යාවකාලික ආහාර හා මිශ්‍ර කර වැළඳීම කැපය;

02. අතිරික්ත නොවූ ආහාර ඇඟිලි දෙකින් ගෙන වැළඳීම කැපය;

03. යොදුනක් හෝ අඩ යොදුනක් හෝ ගොස් එකට ආහාර ගැනීම කැපය;

04. කිරි ද්‍රෝණයක් පමණ ගෙන දී කිරිහා මිශ්‍ර කර විකාලයේ වැළඳීම කැපය;

05. ලෙඩකුට කූඩැල්ලන් සේ උරා සුරාපානය කිරීම කැපය;

06. පැරණි නිසීදනයෙන් වියතක් පමණ කැල්ලක් ගෙන අල්ලා අලුත් ඇතිරිල්ලක් පරිභෝග කිරීම කැපය;

07. සුවඳවත් කළ පාත්‍රයක් මහාජනයා නිතර ගැවසෙන තැනක තබා පින් පිණිස රන්රිදී වලින් පුරවන ලෙස දන්වා සිටීම කැපය;

08. සියතින් පොළව කැණීම කැපය;

09. ආගමික කාර්යයන් කිරීමෙන් පසු පැමිණි සංඝයා ඒ පිළිබඳ සතුටුවන ලෙස පෙළඹවීම කැපය.

10. ආගමික කාර්යයන්ගෙන් පසු "අහෝ" යයි හඬනඟා ප්‍රකාශකිරීම කැපය;

මෙලෙසථෙරවාද, මහාසාංඝික, මූලසාර්වස්ථිවාදී යන සම්ප්‍රදායන්වල දශවස්තුව අතර සුලු සුළු වෙනස්කම් පැවතියද මේවායෙහි එක්තරා පොදු බවක් විද්‍යාමාන වෙයි.

## සංගායනාව පැවැත්වූ ස්ථානය

- විශාලා මහනුවර වාලුකාරාමය.

## සංගායනාව පැවැත්වූ ආකාරය

- ධර්මධර, විනයධරතෙරවරුන් 700 නමකගේ සහභාගිත්වය ඇතුව සබ්බකාමී මහරහතන්වහන්සේ ප්‍රධානත්වය ගෙන ක්‍රියා කළහ. (භික්ෂූන්වහන්සේලා හත්සිය නමකගේ සහභාගීත්වයෙන් පැවති මෙම සංගායනාවට සත්ත සතිකා සංගීති යැයි ද කියනු ලැබෙ.)

## රාජ අනුග්‍රහය

- කාලාශෝක රජතුමා

## සංගායනාව පැවැත්වීම හා ප්‍රතිඵල

- අටමසක් පුරාවට පැවැත්වූ මෙම සංගායනාවේ ප්‍රතිඵල වූයේ සංඝ සමාජය ප්‍රථම වතාවට නිකාය වලට බෙදීම.
- මුල්ම සංඝ සමාජය ස්ථවිරවාදය හා මහා සාංඝික ලෙස ප්‍රධාන නිකායන් දෙකකට බෙදුණි.
- පසුව මෙය තවත් අනු නිකායන් කිහිපයකට බෙදී ගියහ.

## තුන්වන ධර්ම සංගායනාව

- බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසීය තිස්හයකට පසුව (බු.ව.236) ධර්මාශෝක මහරජතුමාගේ අනුග්‍රහයෙන් මාස නවයක් පුරා සිදු කළහ.

## ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු

- සංඝයා අතර අසමගිය ඇතිවීම හා ලාභ අපේක්ෂාවෙන් අන්‍ය තීර්ථකයන් සසුනට ඇතුළු වීම.

## සංගායනාව පැවැත්වූ ස්ථානය

- පැළලුප් නුවර අශෝකාරාමය

## සංගායනාවපැවැත්වූආකාරය

- රහතන් වහන්සේලා දහස් නමකගේ සහභාගිත්වය ඇතිව මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙනි. (රහතන් වහන්සේලා 1000 නමකගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු බැවින් මෙයට සාහස්සිකා සංගීති යැයි ද කියනු ලැබේ)

## සංගායනාව පැවැත්වීම හා ප්‍රතිඵල

1. මොග්ගලී පුත්ත තිස්ස මහරහතන්වහන්සේ විසින් කථාවත්ථුප්පකරණය රචනා කිරීම.
2. අභිධර්ම පිටකය සප්ත ප්‍රකරණයෙන් යුතුව සම්පූර්ණ කිරීම.
3. ථෙරවාද සම්ප්‍රදාය සතු පාලි ත්‍රිපිටකය සම්පූර්ණ කිරීම.
4. ධර්ම දූත සේවාව ආරම්භ කිරීම.

ධර්ම විනය ධර ප්‍රබල තෙර නමකගේ නායකත්වය යටතේ රටවල් නවයකට ධර්ම දූත පිරිස් පිටත් කර යැවූ බව වංසකතාවල සඳහන් වෙයි. (රට - ප්‍රධානත්වය - සූත්‍රය)

- ❖ කාශ්මීර ගන්ධාර - මජ්ඣන්තික තෙරණුවෝ - ආසිවිසෝපම සූත්‍රය
- ❖ මහිස මණ්ඩලය - මහාදේව තෙරණුවෝ - දේවදූත සූත්‍රය
- ❖ වනවාස දේශය - රක්ඛිත තෙරණුවෝ - අනමතග්ග සංයුත්තය
- ❖ අපරන්ත දේශය - යෝනක ධම්මරක්ඛිත තෙරණුවෝ - අග්ගික්ඛන්ධෝපම සූත්‍රය
- ❖ මහාරට්ඨය - මහා ධම්මරක්ඛිත තෙරණුවෝ - මහා නාරද කස්සප ජාතකය
- ❖ යෝනක දේශය - මහාරක්ඛිත තෙරණුවෝ - කාලකාරාම සූත්‍රය
- ❖ හිමවන්ත ප්‍රදේශය - මජ්ඣිම තෙරණුවෝ - ධම්මචක්කප්පවත්තන සූත්‍රය
- ❖ ස්වර්ණභූමිය - සෝණ, උත්තර යනතෙරුන් වහන්සේලා - බ්‍රහ්මජාල සූත්‍රය
- ❖ තම්බපණ්ණිය(ශ්‍රීලංකාව) - මිහිඳු මහරහතන් වහන්සේ - චූලහත්ථිපදෝපම සූත්‍රය

# 3.මෞර්ය යුගය හා ධර්මාශෝක රජතුමා

## චන්ද්‍රගුප්ත මෞර්ය

- ඇලෙක්සැන්ඩර් රජු ක්‍රිස්තු පූර්ව 227 දී ඉන්දියාව ආක්‍රමණය කළේය.
- චන්ද්‍රගුප්තමෞර්ය රජු විෂ්ණු ගුප්ත චාණක්‍ය රජුව බලයෙන් පහකර පාඨලීපුත්‍රය අගනුවර කර රජවිය.
- චන්ද්‍රගුප්ත මෞර්ය රජු ඉතාම සංවිධානාත්මක පාලනයක් ගෙනගියහ.
- ඔහුගේ අගනුවර දිගින් සැතපුම් නවයක් ද පළලින් සැතපුම් දෙකක් ද විය.
- පතිරාජයන් දෙනෙකු යටතේ පාලනය වූ රාජ්‍ය තන්ත්‍ර තුනකින් සමන්විත විය.
- එයද කුඩා රාජ්‍යය එකසිය අටකට බෙදා තිබිණි.
- අධිරාජ්‍ය ජනතාවද ප්‍රධාන කොටස් හතකට බෙදා තිබිණි.
- සූවිසි වසරක් රාජ්‍යය කළ චන්ද්‍රගුප්ත පසුව ජෛන භික්ෂුවක් බවට පත්ව මයිසූරයේදී මියගිය බව සඳහන්වේ.

## බින්දුසාර මෞර්ය

- චන්ද්‍ර ගුප්ත මෞර්ය රජුගේ පුත්‍රයා මෙන්ම මෞර්ය රාජවංශයේ දෙවෙනියාය.
- ග්‍රීකයන් හැඳින්වූයේ අමිත්‍රඝාතක යන නමිනි.
- ඔහු මෞර්ය රාජ්‍ය දකුණු දිගින් වින්ධ්‍යා කඳුවැටිය දක්වා පුළුල් කළේය.
- බින්දුසාර රජුගේ දූපුතුන් අතර කීර්තිමත් අශෝක කුමරා ද එක් අයෙකි.
- ක්‍රිස්තුපූර්ව දෙසිය හැත්තෑ තුනේ දී බින්දුසාර රජු කාල ක්‍රියා කළ බැවින් මගධරාජ්‍යය රාජ්‍ය අශෝක කුමාරයාට හිමි විය.

## අශෝක මෞර්ය

- මගධ රාජ්‍යයේ තුන්වන පාලකයාය.
- බෞද්ධ සාහිත්‍යයේ ඔහු ධර්මාශෝක නමින් හැඳින්වෙන අතර හින්දු සාමයික ග්‍රන්ථවල හැඳින්වෙන්නේ අශෝකවර්ධන යනුවෙනි.
- එහෙත් ඔහු තමාගේ සෑම ශිලා ලිපියකම පාහේ සඳහන් කරන්නේ දේවානම්පියතිස්ස යනුවෙනි.
- දීපවංශය, මහාවංශය, සමන්තපාසාදිකාව, සද්ධර්මාලංකාරය, සද්ධර්ම රත්නාකරය, අශෝකාවදානය, දිව්‍යවදානය යන ග්‍රන්ථවල ඔහු ගැන සඳහන් වේ.

## අශෝක ළමාවිය

- පියා බින්දුසාර වූ අතරම මව මෞර්ය වංශික ධර්මානම් ධර්මා නම් බිසවක් වූ බව මහාවංශ ටීකාවෙහි සහ සද්ධර්මරත්නාකාරයේ සඳහන්වේ.

- ලොව ප්‍රකට විද්‍යා ස්ථාන පිහිටි තක්ෂිලාව මේ සමයේදී දීප්තිමත්ව බැබළුණි. විවිධ ශිල්ප ශාස්ත්‍රයන් දියුණුව පැවති යුගයක අශෝක පරිපූර්ණ අධ්‍යාපනයක් ලබන්නට ඇති බව සැලකේ.

## රජවීම

- අශෝක කුමරු තරුණ වියේදීම තම පියාගේ රාජ්‍යයෙහි ප්‍රදේශ කීපයක සේවය කළේය.
- අශෝකාවදානයේ සඳහන්වන පරිදි තක්ෂිලා ප්‍රදේශයේ කැරැල්ලක් මැඩපැවැත්වීමට තම පියා විසින් ඔහුව යවන ලදී.
- දීපවංශයේ අවන්ති ප්‍රදේශයේ අයබදු ගැනීමට ඔහුව උදේනි පුරයට යැවූ බව සඳහන්වේ.
- ඔහු එම ප්‍රදේශයේ යුවරජ පදවිය දරා සිටියද තම පියා අසනීප බැවින් පාටලීපුත්‍රයට පැමිණියේය.
- පියාගේ ඇවෑමෙන් රාජාභිෂේකයෙන් පසුව මගධ රාජ්‍යයේ අගරජු තනතුරට පත්වූ බව මහාවංශයේ සඳහන්වේ.
- ජාතික ඉතිහාසඥයෙකු වන තාරානාථ සඳහන්කරන පරිදි අශෝක කුමරා විසින් සොහොයුරන් සයදෙනෙකු පමණ මරණයට පත්කරන ලදී.
- ග්‍රන්ථවල සඳහන් වන පරිදි සිංහාසනය සඳහා ඔහුට සටනක් පැවතියේ බින්දුසාර රජුගේ වැඩිමහල් පුත්‍රයා වූ සුසීම කුමරු අතර පමණි. චාරිත්‍රානුකූලව ඔටුනු පැලදීමට සිව්වසරක් ගතවීමෙන් ඔහුට බල අරගලයක් පැවති බව තහවුරුවේ.

## අශෝක සමය

### දේශපාලන තත්ත්වය

- බුදුරජාණන් වහන්සේගේ කාලයේ පැවති සොළොස් මහා ජනපදවලින් එකක් වූ මගධය අශෝක සමය වන විට බලවත් අධිරාජ්‍යයා බවට පත්ව තිබුණි.
- ගිරි ලිපි අනුව අධිරාජ්‍යය සීමාවන් දත හැකිය. සුළු සෙල්ලිපි වලට අනුව අධිරාජ්‍යය තුළ තිබූ අර්ධ ස්වාධීන ජනපදයන් ගැනත් ටැම්ලිපිවල පිහිටීම අනුව අශෝක රජතුමා චාරිකාවේ යෙදුනු ප්‍රදේශ ගැනත් සිතාගත හැකිය.

- මේ අනුව අශෝක අධිරාජ්‍යය බටහිරින්, සුනාපරන්තය, සුරාෂ්ට්‍රය, බටහිර අවන්තිය යන ප්‍රදේශ ඇතුළුව අරාබි මුහුදේ නැගෙනහිර වෙරළ දක්වා විහිද ගියේය.
- ගිණිකොණින් කලිඟු රට, ඔරිස්සාව ඇතුළුව, බෙංගාලයේ බටහිර වෙරළ දක්වා විහිදුණි.
- දකුණෙන් ස්වර්ණගිරි පළාත ඇතුළුව, කෘෂ්ණා, තුංගභද්‍ර යන ගංගා දෙක ඇසුරු කොට පවත්නා ප්‍රදේශ දක්වා විහිදෙයි.
- වයඹ දිගින් උත්තරාපථය හෙවත් ගන්ධාරය ඇතුළුව පුරුෂපුරය දක්වාත්, උතුරෙන් හිමවත දක්වාත්, පැතිර තිබිණි.
- මේ අනුව දකුණු ඉන්දියාවේ සුළු භූමිභාගයක් හැරුණු විට මුළු ඉන්දියාවම අශෝක අධිරාජයාට යටත්වී යැයි සිතිය හැක.
- චන්ද්‍රගුප්ත රජු විසින් ග්‍රීක ජාතික සෙලියුකස් නිකේටර් රජුගෙන් ලබාගන්නා ලද, ඇෆ්ගනිස්ථානයේ දකුණු ප්‍රදේශය හා බලුකිස්ථානයද මේ වන විට මෞර්ය අධිරාජ්‍ය පාලනය යටතේ පැවැතිණි.
- රාජ තරංගනීයේ එන පරිදි කාශ්මීරයේ ශ්‍රී නගර් නුවර ගොඩනගන ලද්දේ අශෝක රජු විසින්ය.
- අශෝක කුමරු යුවරජ තනතුරේ සිටින අවධියේ නේපාලයේ කැරැල්ලක් මැඩපැවැත්වූ බව තාරානාථ සඳහන් කරයි.
- මේ විශාල අශෝක අධිරාජ්‍යයේ අගනුවර වූයේ පාටලීපුත්‍ර (පැට්නා) නුවරය.
- අශෝක සමය වන විට වන විට දේශපාලන වශයෙන් විදේශ ආක්‍රමණ හෝ අභ්‍යන්තර වියවුල් දක්නට නොලැබිණි.
- කාලිංග සටනද ඇතිවූයේ මෞර්ය අධිරාජ්‍යයෙහි දේශසීමා විශාල කරගැනීමට උත්සාහ කිරීම නිසා විය හැකිය.
- අභ්‍යන්තර ආරවුල් වශයෙන් සඳහන් වන්නේ තක්ෂිලාවේ හා නේපාලයේ ඇතිවූ කැරැල්ල පමණි. අශෝක රජු විසින් ඒවා මැඩපවත්වන ලදී.

## ආගමික තත්ත්වය

- ඔහුගේ හත්වන ලිපියෙහි එකල සිටි තුන්වර්ගයක ශ්‍රමණ බ්‍රාහ්මණයින් ගැන සඳහන් වේ.
- සංඝ, බ්‍රාහ්මණාජීවක සහ නිගන්ථ යනු ඒ පිරිසයි.
- බෞද්ධ ආගමට අමතරව තව ආගම් පැවති බව මෙයින් ප්‍රකට වේ.
- නිග්ලීව ටැම්ලිපියෙහි සඳහන් වන අන්දමට එකල බෞද්ධයන් අතර ගෞතම බුදුරදුන් පෙර වැඩසිටි කෝනාගමන වැනි අතීත බුදුරදුන් ගැන විශ්වාසයක් තිබුණු බව පෙනේ.
- නිඝණ්ඨ යනුවෙන් සඳහන් වන්නේ බුදුරදුන්ගේ කාලයේ ජීවත්වූ මහාවීර නිගණ්ඨනාථ තුමාගේ ශ්‍රාවකයන් පිරිසය.
- ජීන යන අපර නාමයද පැවැති බැවින් ඔවුහු ජෛන ආගමිකයන් වශයෙන්ද හැඳින් වේ.
- අශෝකගේ පියා වූ චන්ද්‍රගුප්ත ජෛන ආගම වැළඳගෙන අවසාන කාලයේ ජෛන සාධුවරයකු වූ බව සඳහන් වේ.
- චන්ද්‍රගුප්තයන්ට පෙර සිටි නන්ද රජුවරුන්ද ජෛන භක්තිකයෝ වූහ.
- බහුතර ජනතාවක් ජෛනාගම පිළිගත් බව සඳහන්වේ.
- එම නිසා අශෝක රාජසමයේද ජෛන ආගම ප්‍රබල ආගමක් වශයෙන් පැවති බව අනුමාන කළ හැකිය.
- බරාබර් කඳුවැටියේ ලිපිවල පෙනෙන පරිදි අශෝක රජතුමා ලෙන් පූජාකොට ඇත්තේ මොවුන්ට විය හැකිය.
- බ්‍රාහ්මණාජීවක වශයෙන් සඳහන් කර ඇත්තේ බ්‍රාහ්මණයා නොවන ආජීවකයන්ද සිටි නිසා වියහැකිය. මෞර්ය රාජසභාවේ ආජීවකයෝ විය.

- පාසාණ්ඩ යන ආගමික කොටසක් ගැනද සඳහන් වේ.
- සෑම ආගමිකයෙකුම ආත්ම දමනය සහ චිත්ත පාරිශුද්ධියත් සඳහා ශ්‍රමණ ධර්මය රකින නිසා ඔවුන්ට නිදහසේ තම තමන්ගේ ආගම් පිළිපැදීමට ඉඩදිය යුතු බව අශෝක රජුගේ හත්වන ගිරා ලිපියෙහි සඳහන්විය.

# 4. අශෝක රජතුමා බෞද්ධයකු වීම

- අශෝක මෞර්ය මගධ රාජ්‍යයේ රජවීමෙන් පසු තම මුත්තණුවන් සහ පියාණන් විසින් ගෙන ගිය දික්විජය ප්‍රතිපත්තිය දිගටම ගෙනයමින් මගධය පුළුල් කළේය.
- නමුත් කාලිංග යුද්ධයේදී සිදුවූ දරුණු මනුෂ්‍ය ඝාතනය ගැන අශෝක රජතුමා ඉතා කණගාටු වන බව ඔහුගේ දහතුන්වන ෂබාස්ගර් ලිපියෙහි සඳහන් වේ.
- මේ අන්දමට කාලිංග යුද්ධයෙන් පසුතැවිලි වූ අශෝක රජතුමා ක්‍රිස්තුපූර්ව 261 දී උපගුප්ත නම් තෙර කෙනෙකුගෙන් දහම් අසා බෞද්ධයකු වූ බව රෝලින්සන් නම් ඉතිහාසඥයෙකු සඳහන් කරයි.
- දිව්‍යාවදානයේ සඳහන් වන පරිදි අශෝක රජතුමා බුදුදහම වැළඳගෙන ඇත්තේ සමුද්‍ර නම් තෙර කෙනෙකුගෙන් දහම් ඇසීමෙනි.
- දීපවංශය, මහාවංශය, සහ සමන්තපාසාදිකාව යන ග්‍රන්ථවල සඳහන් වන්නේ තීර්ථකයන්ගේ නොහික්මුණු ඉරියව් ගැන කලකිරීමට පත්ව සිටි රජු දිනක් දැමුණු ඉඳුරන් ඇති මහමඟ වඩිමින් සිටි නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ පිළිබඳ ඇතිවූ පැහැදීම නිසා ධර්මය ඇසීමෙන් බෞද්ධ උපාසකයකු බවට පත්වූ බවය.
- ඉන්පසුව මොග්ගලී පුත්ත තිස්ස තෙරුන්ගෙන් දහම් අසා බුදුසසුන කෙරෙහි අනුග්‍රහය දැක්වීමට රජතුමා අදිටන් කරගත් බව මහාවංශයේ සඳහන් වේ.

## අශෝක බෞද්ධයකු වීම

- අශෝක රජතුමා උප්පත්තියෙන් ජෛනයෙකි.
- බුදු සමයද ජෛනාගම මෙන්ම අවිහිංසාව සහ මෛත්‍රිය ඉතා අගය කරයි. එම නිසා ජෛනාගමිකයන්ට බෞද්ධයෙකු වීම අපහසු කරුණක් නොවේ.
- කාලිංග යුද්ධයෙන් පසුව එතුමා දිග් විජය අතහැර දහම් විජය අගය කළේය.

## තෙරුවන් කෙරෙහි ගෞරවය

- බුද්ධ ධම්ම සංඝ යන තෙරුවන් කෙරෙහි අශෝක රජතුමා තුළ පැවති ගෞරවාදරය කල්කටාවේ බයිරාට් ලිපියෙන්ද හෙළිදරව් වේ.
- එතුමා බෞද්ධ භික්ෂූන් වහන්සේලා තුළින් විනයගරුක බවත් සමඟියත් අපේක්ෂා කළ බවද පෙනේ.

## සංඝයා සමගි කැරවීම

- කොස්ඹෑ-සාංචි, සාරානාත් යන ස්ථානයෙහි පිහිටා ඇති සෙල්ලිපිවල සංඝයා අතර භේද ඇතිකරන භික්ෂූන් පලවා හැර ශාසනය ශෝධනය කළ යුතු බව සඳහන් වේ. මොග්ගලී පුත්ත තිස්ස තෙරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවති තුන්වන ධර්ම සංගායනාව හා මේ ප්‍රකාශය අතර සම්බන්ධයක් පැවති බව පෙනේ.
- රුම්න්දෙයි ටැම් ලිපියෙහි සඳහන් වන අන්දමට අශෝක රජතුමා තම ඔටුනු පලන් විසිවෙනි අවුරුද්දේ ලුම්බිණිය වැඳීමට ගිය අතර ලුම්බිණි ග්‍රාමය අයබදුවලින් නිදහස් කරන ලදී.
- දිව්‍යාවදානයේ සඳහන් වන අන්දමට ලුම්බිණිය සහ බුද්ධගයාව දියුණුකිරීම සඳහා අශෝක රජුගේ කහවණු ලක්ෂයක් වැය කොට ඇත.
- ඔහු ඔටුනු පැළඳි තිස්වන අවුරුද්දෙහි කෝණාගමන බුදුරදුන්ගේ ප්‍රතිමාව පෙර පැවතියාක් මෙන් දෙගුණයක් විශාල කොට තැනූ බව සඳහන් වේ.

## රූප්නාත් ලිපිය

- "මා ශාක්‍යයෙකු සේ ප්‍රකටව අවුරුදු දෙකහමාරකටත් වැඩිය. එහෙත් වැඩි දියුණුවක් නොවූයේය. සංඝයා වෙත එළඹී අවුරුද්දකට වැඩිය. දියුණුවද විපුලය....." යනුවෙන් එහි සඳහන් වේ.

## වෙහෙර විහාර ගොඩනැගීම

- එක් එක් ධර්ම ස්කන්ධයක් වෙනුවෙන් එක් එක් විහාරය බැගින් අසූහාර දාහක් වෙහෙර විහාර ගොඩනැගූ බව මහාවංශයේ සහ සමන්තපාසාදිකාවේ සඳහන් වේ.
- තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට අනුග්‍රහය දැක්වීමත්, වෙනත් රටවලට බුදුදහම ප්‍රචාරය කිරීමට අනුබලදීමත්, බුදුසසුන කෙරෙහි අශෝක රජතුමා තුළ පැවැති අනල්ප ප්‍රසාදය ප්‍රකට කරයි.

# 5. අශෝක ධර්මය

- අශෝක රජතුමා බෞද්ධයකු වීමෙන් පසුව දික්විජය අත්හැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කළේය.
- තම විජිතයෙහි ගුහා ලිපි, ටැම් ලිපි, ගිරි ලිපි, පිහිටුවීමෙන් ද ධර්ම මහාමාත්‍රවරුන් පත්කොට යැවීමෙන් ද මෙම ධර්මවිජය ව්‍යාපාරය පවත්වාගෙන යනු ලැබීය.
- සහනශීලී ආගමික ප්‍රතිපත්තියක් අනුගමනය කළ බවට සාධක ඇත.

## අශෝක ධර්මය ගැන විවිධ මත

- **වින්සන්ට් ස්මිත් පඬිතුමා-** අශෝක ධර්මය හැම ආගමකටම පොදු ධර්මයකි.
- **රාධා කුමුද මුඛර්ජී පඬිවරයා -** එය සියලු ආගම් වල සාරය වේ.
- **බණ්ඩර්කර් මහතා-** අශෝක ධර්මය සකස්වී ඇත්තේ බුදු සමයේ මුල් අවධියේ සිටම පැවත එන ගිහි උපාසක ධර්මයන්ගෙනි.
- **ආචාර්ය බරුවා මහතා-** අශෝක රජුගේ ධර්මය බුද්ධ ධර්මයේ ලෞකික අංශයට අදාල මූලධර්ම හා මුළුමනින්ම ගැළපෙන බවත් අනෙක් ආගම් හා දර්ශන මඟින් ඉදිරිපත් කෙරෙන මූලධර්මයන්ට සහමුලින්ම පටහැනි නොවන්නක් බවත් පවසයි.
- **ෆ්ලීට් හා බියුලර් පඬිවරු-** එය දේශපාලන හා සදාචාර ප්‍රතිපත්ති ඇතුළත් රාජ ධර්මයකි.

- අශෝක අභිලේඛන වල භාවිතා වන භාෂාවේ ඇති ගැටලු සහගත බව අශෝක ධර්මය පිළිබඳ විවිධ මත පළ වීමට හේතු වී ඇත.

- අශෝක ධර්මයේ සඳහන් ධර්ම ව්‍යවස්ථාවන් ප්‍රධාන වශයෙන් කොටස් හතරකට බෙදා දැක්විය හැකිය.

**1)ආධ්‍යාත්මික ගුණ වගාව සඳහා වූ චාරිත්‍ර**

**2) ගුණධර්ම**

(දයාව, සත්‍යවාදී බව, පිරිසිදුකම, මුදු බව, යහපත් බව)

**3) විරමන ධර්ම (චාරිත්‍ර)**

(චන්ඩි බව, ක්‍රෝධය, මානය, ඊර්ෂ්‍යාව, කෲර බව)

**4) නිෂ්ඵල චාරිත්‍ර විධි**

- මෙලොව පරලොව සුබසෙත සලසන චාරිත්‍ර ධර්ම මංගල ධර්ම වේ.
  - සේවකයන් කෙරෙහි මනාව පිළිපැදීම.
  - වැඩිහිටියන්ට ගරු කිරීම.
  - සත්ත්ව කරුණාව.
  - බ්‍රාහ්මණයන්ට හා ශ්‍රමණයන්ට දන් දීම.

- ජනතාව ධර්මය කෙරෙහි යොමු කිරීම සඳහා පහසුකම් සැලසිය යුතු බව ධර්මාශෝක රජතුමා කල්පනා කර ඇත.
  - ළිං කැනවීම.
  - සෙවණ සඳහා ගස් සිටුවීම.
  - විශ්‍රාමශාලා සහ ආරෝග්‍යශාලා පිහිටුවීම.
  - ඖෂධ වර්ග සුලබ කිරීම.
  - පුණ්‍යාධාර දීම.

- අශෝක යුගයේ අර්බුද ලෙස අසන්නට ලැබෙන්නේ තක්ෂිලාවේ ඇති වූ කැරැල්ල පමණි. අශෝක සමයේ අර්බුද අඩු වීමට ජනතාව තුළ ආධ්‍යාත්මික ගුණ වගාවක් ඇති කිරීම පහසු වන්නට ඇති බව පෙනේ.

- අභිෂේකයෙන් තුන්වෙනි වර්ෂයේදී අශෝක රජතුමා බුදු දහම වැළඳ ගන්නා බව (දීපවංසය)

- අභිෂේකයෙන් අටවන වර්ෂයේදී අශෝක රජතුමා විසින් බුදු දහමට දැක්වූ අනුග්‍රහය සහ ගෞරවය කීප ගුණයකින් වැඩි වූ බව (මහාවංසය)

- අශෝක ධර්මය බිහිවීමට තුඩුදුන් හේතු
  - ආසන්නතම හේතුව කාලිංග සටනයි.
  - බෞද්ධ බලපෑම
  - එකල පැවති දේශපාලන හා සමාජ සංකල්ප

# 6. අශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාරක සේවාව

- ධර්මාශෝක රජුගේ උපුටනයක්

"සියලු ජනයා මගේ දරුවෝ ය. මගේ දරුවන් වූ ඔවුන් මෙලොව සුභ සිද්ධිය පිළිබඳ කටයුතු වල දී මෙන්ම පරලොව කටයුතු වල දී ද එක්සත්ව ක්‍රියා කරනු දැක්ම මාගේ ආශාවයි." (ධෞලී කාලිංග ලිපිය)

## ➢ ධර්මාශෝක රජු ධර්ම ප්‍රචාරය සඳහාත් බොහෝ කල් පැවැත්ම සඳහාත් අනුගමනය කළ විධිමත් ක්‍රියාමාර්ග

### 01. ධර්ම ලිපි

(අභිෂේකයෙන් දොළොස් වන වසරේ පටන් ක්‍රියාවේ යෙදවීය)

- ගිරි ලිපි, පුවරු ලිපි, ධර්ම ස්තම්භ

උදා: රූප්නාත් ලිපිය

- සිඟාලෝවාද, මංගල වැනි සූත්‍ර වල සාරය රජුගේ ධර්ම ලිපි වල ඇතුළත් විය.

### 02. ධර්ම මහා මාත්‍රවරු පත් කිරීම

- ධර්ම මහා මාත්‍රවරු සහ යුත්ත, රජ්ජුක නම් ප්‍රාදේශීය නිළධාරීන් ධර්ම ප්‍රචාරක කටයුතු සහ සමාජ සේවා නිලධාරීන් ලෙස පත් කරන ලදී.
- රාජ්‍ය තන්ත්‍රයෙහි නියැලි සෑම නිලධාරියකුම ධර්ම දානයෙහි යෙදීය යුතු යැයි නියම කරන ලදී.
- සිරිතක් ලෙස අවුරුදු පහකට වරක් දිශා ප්‍රයානය සඳහා ද ධර්ම දානය සඳහා ද සියලුම නිලධාරීන් පිටත් කරන ලදී. (1 කාලිංග ලිපිය)

➢ **මහා මාත්‍ර වරුන්ගේ කාර්යයන්**

- සිව් මසකට වරක් රැස්වී ප්‍රාන්ත රාජ්‍යයන් හි ජනතාව අස්වැසීමට ධර්මයෙහි හැසිරවීම.
- අසාධාරණ ලෙස සිරකර සිටි මිනිසුන් සිරභාරයෙන් මුදාලීම.
- නිදහස් වූ ඔවුන්ට හොඳ මිනිසුන් ලෙස ජීවත් වීමට උපකාර කිරීම.

## 03. ධර්ම ප්‍රදර්ශන

- ධර්මානුකූල පැවැත්මේ ඉෂ්ට විපාක සහ අධර්ම චර්යාවේ අනිෂ්ට විපාක මහජනතාවට ප්‍රදර්ශනය කිරීමට **දිව්‍ය විමාන දර්ශන, හස්ති දර්ශන, අග්නිස්කන්ධ දර්ශන** භාවිතා කිරීම.

## 04. ආදර්ශය

- ධර්මාශෝක රජතුමා අවිහිංසා ප්‍රතිපදාව අනුගමනය කරන ලදී.

➢ **තිරිසන් සතුන් කෙරෙහි දැක්වූ අවිහිංසාවාදී ප්‍රතිපත්ති**

- සතුන්ට පීඩා ගෙන දෙන ක්‍රීඩා තහනම් කිරීම.
- මාංශ භක්ෂණය තරමක්දුරට තහනම් කිරීම.
- යාගහෝම සහ බිලි පූජා බොහෝදුරට වැලැක්වීම.
- මුව දඩයම මුළුමනින් නවතාලීම.
- සමහර දිනයන් මසුන් මැරීම සහ විකිණීම තහනම් කිරීම.
- කැලෑ ගිනි තැබීම, නිකරුනේ සතුන් මැරීම, පණ ඇති සතුන් ගොදුරට දී තවත් සතුන් රැකීම තහනම් කිරීම.
- තිරිසන් සතුන් උදෙසා ගිලන්හල්, ළිං තැනවීම, සෙවන ලබාදීමට ගස් රෝපණය කිරීම.
- විහාර යාත්‍රා වෙනුවට ධර්ම යාත්‍රා චාරිකා යෝජනා කිරීම.

(රජු අභිෂේකයෙන් දහවැනි වස විහාර යාත්‍රා යෙදීම අත්හැර ධර්ම යාත්‍රා යෙදිණි)

## 05. විදේශ ධර්ම ප්‍රචාර

අභිෂේකයෙන් විසි හත්වන වර්ෂයෙහි,

- ධර්ම ප්‍රචාරය සඳහා දූතයන් යැවීම.

    ❖ සොළී, පාඬි, කේරළ පුත්‍ර සත්‍ය පුත්‍ර ප්‍රත්‍යන්ත රාජ්‍යන් සහ තාම්‍රපර්ණිය , සිරියාව, ඇසිරියාව, මිසරය සයිරීනය හා හා එපිරස් යන ප්‍රදේශවල

# 7. අශෝක රජතුමාගේ බෞද්ධ ධර්මදූත සේවාව

**අශෝක රජු බුදු සසුන වැළඳ ගැනීම සම්බන්ධව බ්‍රහ්මගිරි, රූප්නාත් හා මස්කි සෙල්ලිපිවල දැක්වේ.**

## අශෝක රජතුමා ථෙරවාදී බුදුසමයේ ව්‍යාප්තිය හා අභිවෘද්ධිය සඳහා කළ සේවාවන්

- භික්ෂු සංඝයා සමගි කරවීම.
- තීර්කයන් බුදු සසුනෙන් පලවාහැර බුද්ධ ශාසනය ප්‍රතිසංවිධානය කිරීම.
- තුන්වන ධර්ම සංගීතිය පැවැත්වීම නව රට සසුන් පිහිටුවීම.
- වෙහෙර විහාර ඉදිකිරීම.

## අශෝක රජතුමාගේ ශාසනික මෙහෙය පිළිබඳව සඳහන්වන ථෙරවාදී මූලාශ්‍ර

- මහාවංශය
- දීපවංශය
- සමන්ත පාසාදිකා විනය අටුවාව

## අශෝක රජතුමාගේ ශාසනික මෙහෙය පිළිබඳ සඳහන්වන වෙනත් මූලාශ්‍ර

- සංඝ සමගිය, ශාසන සංශෝධන පිළිබඳව අශෝක රජු පිහිටුවන ලද සාරානාත්, කෞසම්භි හා සාංචි ලිපිවල සඳහන් වේ.
- සමන්තපාසාදිකාවේ බුද්ධ ශාසනය අර්බුද හට ගැනීම හා ආශෝක රජුගේ ශාසනික මෙහෙය පිළිබඳව දැක්වේ. (සංඝ සාමග්‍රිය පිළිබඳව මීට සමාන තොරතුරු මහාවංශයේ හා දීපවංශයේ දැක්වේ.)

## තුන්වන ධර්ම සංගීතිය

- පැළලුප් නුවර අශෝකාරාමයේදී පැවැත්විණි.
- මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවන් ප්‍රමුඛ දහසක් භික්ෂූන් සම්බන්ධ විණි.
- දීපවංශයේ හා මහාවංශයේ මේ පිළිබඳව සඳහන් වේ.

තුන්වන ධර්ම සංගීතියෙන් පසු මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවන්ගේ ආධාරයෙන් රජතුමාගේ අනුග්‍රහයෙන් ධර්මය ප්‍රචාරය කළ රටවල්, ප්‍රමුඛත්වය ගත් භික්ෂූන් හා දේශනා කරන ලද සූත්‍රය

- කාශ්මීර ගාන්ධාර - මජ්ඣන්තික තෙරණුවෝ
- යෝනක දේශය - මහා රක්ඛිත තෙරණුවෝ
    - කාලකාරාම සූත්‍රය
- අපරන්ත දේශය - ධම්ම රක්ඛිත තෙරණුවෝ
    - අග්ගික්ඛන්ධෝපම සූත්‍රය
- මහිෂ මණ්ඩලය - මහාදේව තෙරණුවෝ
    - දේවදූත සූත්‍රය
- වනවාසී ප්‍රදේශ - රක්ඛිත තෙරණුවෝ
    - අනමතග්ග සූත්‍රය
- හිමාලය ප්‍රදේශය - මජ්ඣිම තෙරණුවෝ
    - ධම්මචක්කප්පවත්තන සූත්‍රය
- මීට අමතරව කස්සපගොත්ත, චුල්ලදේව, සහදේව, දුන්දුභිස්සර තෙරවරු හිමාල දේශයට වැඩම කළහ.

- ස්වර්ණභූමිය - සෝණ තෙරණුවෝ
    - බ්‍රහ්මජාල සූත්‍රය

- මහාරට්ඨ - මහා ධම්මරක්ඛිත තෙරණුවෝ
    - මහා නාරද කස්සප ජාතකය

- තම්බපණ්ණි - මහා මහින්ද රහතන් වහන්සේ
- ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල හා සුමන සාමණේර වහන්සේලා ද කැපකරු ලෙස භණ්ඩුක කුමරා ද සමඟ මිහින්තලයට වැඩම කළහ.

## අශෝක රජුගේ ධර්ම ප්‍රචාරක කටයුතු පිළිබඳ ඓතිහාසික පදනම

- සාංචි ස්ථූප වලට අයත් දෙවන ස්තූපයේ තිබී සොයාගත් ධාතුකරඬුවක ඇතුළු පියනේ "සපුරිස (ස) මඣිමස" යනුවෙන් සත්පුරුෂ වූ මජ්ඣිම තෙරුන්ගේ ධාතූන් දැක්වේ.
- එයින්ම සොයාගත් "සපුරිස (ස) කසප ගොතස හෙම වතාවරියස" ලෙස කාශ්‍යප ගොත්‍ර හිමියන් ගැන දැක්වේ .
- සාංචි ස්තූප කැණීම්වලින් සොයාගත් තුන්වන කරඬුවේ "දදභිසාර ගොවිපුත්ත" ලෙස හිමාලයට වැඩම වූ දුන්දුභිස්සර තෙරුන් පිළිබඳ සඳහන් වේ.
- ලංකාවට වැඩම වූ ධර්මදූතයන් පිළිබඳව මිහින්තලා සෙල් ලිපියෙන් දැක්වේ. මහිද, භද්‍රසාල, ඉටික, උති යනුවෙන් එම ධර්ම දූතයන් හැඳින්වේ.
- අශෝක රජතුමාගේ ප්‍රධාන ගිරිලිපි දාහතරේ පිටපත් ආංධ්‍රා ප්‍රදේශයේ කුර්නූල් දිස්ත්‍රික්කයේ යෙරාගුඩි නමැති ස්ථානයේ තිබී හමුවී ඇත. එහිද අශෝක රජු දවස බුදුසමය ස්ථාවර වූ බව ප්‍රකට වේ.

# 8. ධර්මාශෝක රජතුමාට ඉතිහාසයේ හිමිවන තැන

- එච්. ජී. වෙල්ස් නම් වූ ඉතිහාසඥයාගේ "ඉතිහාසයේ සංක්ෂිප්ත චාරිකාව" නම් වූ පොතේ ධර්මාශෝක රජ පිළිබඳ සඳහන් වී ඇත.
- රීස්ඩේවිඩ්ස් පඬිතුමා අශෝක අධිරාජයා රෝමානු අධිරාජයකු වන කොන්ස්ටන්ටයින්ට සමකොට දක්වයි.
- එතුමාද එකල ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කිරීමට ඉමහත් උත්සාහයක් දැරීය.
- කොන්ස්ටන්ටයින් අධිරාජයා කිතුසමය වැළඳගැනීම යුරෝපයේ විවිධ ප්‍රදේශ රෝම අධිරාජයා අණසක යටතට ගැනීමට හේතු විය. නමුත් අශෝක අධිරාජයා බුදුසමය වැළඳගැනීම තුළින් එවන් කිසිදු වාසියක් නොලැබිණි.

## ප්‍රැන්ක් වංශික චාලිමෙන් රජු.

- නමුත් චාලිමෙන් රජු ධර්මාශෝක රජු මෙන් නොව සෙසු ආගම් ආක්‍රමණය කරමින් කිතු සමය ව්‍යාප්ත කිරීමට උත්සාහ කළේය.

## මකා ඔරේලියස් ඇන්ටෝනියස් රජු.

- මොහු එක් ආගමක් පමණක් තෝරා එය දියුණු කිරීමට කටයුතු කෙරිණි. නමුත් ධර්මාශෝක රජු සෙසු ආගම්වලට ද අනුග්‍රහය දැක්වූ බව කාල්සි ශිලාලේඛනයේ දැක්වේ.

## ඕමර් කාලිෆ්.

- ඉස්ලාම් ධර්මය වෙනුවෙන් විශාල කාර්යභාරයක් කළේය.

# මහා අක්බාර් රජු.

- මහා අක්බාර් රජු මුස්ලිම් භක්තිකයෙකු වුවද ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළහ.
- අශෝක රජු නිෂ්ඵල යාග හෝම තහනම් කළාක් මෙන් අක්බාර් රජු,

➢ සැමියා මළ පසු වැන්දඹුව ගිනිතැබීම.

➢ ළදරු විවාහ අත්හිටුවීම.

➢ හින්දු කාන්තාවන්ට යළි විවාහ වීමට අවසරදීම.

➢ මෙතෙක් මුස්ලිම් ආගමිකයන්ගෙන් අය කල බද්ද අවලංගු කිරීම.

අශෝක ධර්මය මෙන් අක්බාර් රජු ද-

- දින් - ඉලාහිය නමින් නව ආගමක් ගොඩනැංවීය. නමුත් එය අශෝක ධර්මය තරම් පැහැදිලි අරමුණු සහිත එකක් නොවූ නිසා පරිහානියට පත්විය.

- යුරෝපීය ඉතිහාසඥයන්ගේ මතයට අනුව මහා ඇලෙක්සැන්ඩර්, ජුලියස් සීසර්, නැපෝලියන් ද අශෝක අධිරාජයාට සමකොට දැක්විය හැකිය. නමුත් ඔවුන් රටවැසියන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳව කටයුතු කර නොමැත.

- වින්සන් ස්මිත් දක්වන අන්දමට සටන්කාමියකු ලෙස රජය ලබා ධාර්මික පාලකයෙකු බවට පත්වූ ප්‍රථම අධිරාජයාය

# 9. සිවුවන ධර්ම සංගායනාව

## කනිෂ්ක රජතුමා

අශෝක රජ දවස ථෙරවාද බුදුදහමේ ස්වර්ණමය යුගයයි.

- ඉන්පසුව නැවත බෞද්ධ ඉතිහාසයේ විශිෂ්ට යුගයක් උදාවන්නේ දෙවන අශෝක හෙවත් කනිෂ්ක රජ සමයයි.
- බුදුරදුන් විසින් කනිෂ්ක රජ ගැන සඳහන් කළ කරුණු මඤ්ජු ශ්‍රී මූල කල්පයේ ඇත.
- කනිෂ්ක රජු බුදුදහම වැළඳගෙන ඇත්තේ ගොපලු දරුවෙකුගේ අනාවැකියක් ඇසීමෙන් බව හියුංත්සියැං වාර්තාවේ දැක්වේ.
- එතුමා විසින් අඩි 500ක් උසට චෛත්‍යයක් කරවා එහි සර්වඥ ධාතු නිදන් කර ඇති අතර ධර්ම සංගායනාවක් පැවැත්වීම හා ධර්ම දූත ප්‍රචාරය මෙතුමාගෙන් සිදුවූ විශිෂ්ට සේවාවයි.

## සිව්වන ධර්ම සංගායනාවේ පසුබිම

- බෞද්ධ භික්ෂූන් නිකාය වලට බෙදී යාම හා එම දේශකයන් වහන්සේලා තම තමන්ගේ අභිමතය පරිදි ධර්ම පදයන්ට අර්ථ දීම ශ්‍රවණය කළ කනිෂ්ක රජු ,
- එම අදහස් පරස්පර විරෝධී බව තේරුම් ගත්තේය. මේ නිසාම ධර්ම විනය සුරැකීමට ධර්ම සංගායනාවක් පැවැත්වීමට කටයුතු කළේය.

## ධර්ම සංගීතිය

උපදේශකත්වය - මහා දාර්ශනික පාර්ශව හිමි
භික්ෂූන්වහන්සේලා - 500
ස්ථානය - කාශ්මීරයේ කුණ්ඩල වන විහාරය
කාලය - මාස 6
සංගීතියේ සභාපති - වසුමිත්‍ර තෙරණුවෝ
උපසභාපති - භදන්ත අශ්වඝෝෂ ආචාර්ය පාදයෝ

සංගීතිකාරක තෙරවරුන්ට පැවරුණු කාර්‍යය -

• බෞද්ධ ධර්මය පිළිබඳ අත්පිටපටත් රැස්කිරීම හා අර්ථ විවරණය.
• පළමුවෙන්ම සූත්‍ර පිටකයේ අර්ථ විවරණය කරමින් ශ්ලෝක දශලක්ෂයකින් යුතු උපදේශ ශාස්ත්‍රය සම්පාදනය කිරීම.
• විනය විභාෂා ශාස්ත්‍ර ග්‍රන්ථය සැපයීම.
• අභිධර්ම විභාෂා ග්‍රන්ථය සැපයීම.

සංගීතියේ අවසන - කනිෂ්ක රජු විසින් සියලු ධර්ම හා විභාෂාවන් තඹ පත්වල ලියවා ගල්පෙට්ටියක බහා නිදන් කොට සෑයක් කරවූ බව හියුංත්සියැං වාර්තාවේ දැක්වේ.

## ධර්ම ප්‍රචාරය

මධ්‍යම ආසියාවේ ධර්ම ප්‍රචාරය ආරම්භ විය.

- මාතාංග කාශ්‍යප වැනි ධර්මදූතයන් වහන්සේලා මධ්‍යම ආසියාව හරහා වැටී තිබූ තවලම් මාර්ග ඔස්සේ විදෙස් කරා ගමන් ගත්හ.
- තක්ල මාකාන් කාන්තාරය අවට තවලම් මාර්ගවල අවට ක්ෂේම භූමිවල රාජ්‍යවලටද ධර්ම ප්‍රචාරය කෙරුණි.
- ඒ අනුව කාශ්ගාරය , ඛෝටාන් යන ප්‍රදේශයන්හි විහාරාදිය තැනී ධර්ම ප්‍රචාරය ඉතා හොඳින් සිදුවිය.
- චීනයේ බුදුදහම පැතිරීමට මෙම සංගායනාව අතිශයින් ඉවහල් වූ අතර එරටට බුදුදහම පිහිටුවීමට කාශ්‍යප මාතාංග හා ධර්ම රක්ෂිත මහතෙරවරුන් වහන්සේලා පුරෝගාමී වූහ.

# 10. මහින්දාගමනය හා ශ්‍රීලංකාවේ බුදුසසුන පිහිටුවීම

- ගෞතම බුදුහිමිගේ පිරිණිවන් පෑමෙන් වසර 236 කට පසුව මිහිඳු මහරහතන්වහන්සේ මෙරටට වැඩම කළහ.
- මිහිඳුහිමිගේ ලංකාගමනය හා බුදුසසුන පිහිටුවීම පිළිබඳ වංසකතාවල හා බුදුඝොස් හිමියන් විසින් රචිත සමන්තපාසාදිකා විනය අටුවාවේ ද දැක්වේ.

මහින්දාගමනයට පෙර ලක්වැසියන් බුදුදහම දැන සිටි බව,

- මේ පිළිබඳව දීපවංශය , මහාවංශය හා සමන්තපාසාදිකාව වැනි පාලි ග්‍රන්ථයන්හි දැක්වේ.
- බුදුරදුන් ප්‍රථම වරට මහියංගනයට වැඩම කළ අවස්ථාවේදී යක්ෂයින්ට ධර්මය දේශනා කළ අතර එහිදී ධර්ම ශ්‍රවණය කළ සමන් දෙවිඳුන් තෙරුවන් සරණ ගොස් සෝවාන් ඵලයට පැමිණි බව මහාවංසය කියයි.
- හෙතෙම ගෞතම බුදුන්ගෙන් ලැබුණු කේශ ධාතු නිදන් කොට මහියංගන චෛත්‍යය නිර්මාණය කළේය.
- දෙවන වරට බුදුරදුන් වැඩියේ නාගදීපයටයි. එහිදී අසූකෝටියක් නාගයෝ තිසරණ සරණ ගියහ. එහිදී මණිඅක්ඛිත නා රජුද බුදුසමය වැළඳගත්තේය. ඔහුගේ ඇරයුමෙන් තෙවන වරට බුදුන් කැළණියට වැඩම කළහ.
- බුද්ධ පරිණිර්වානයෙන් පසු සැරියුත් තෙරණුවන්ගේ ශිෂ්‍ය ***සරභූ තෙරණුවෝ*** බුදුරදුන්ගේ දකුණු අකු ධාතුව රැගෙන ලක්දිවට වැඩම කර එය තැන්පත් කොට මහියංගන චෛත්‍යය 12 රියන් උස්කොට තැනූ බව මහාවංසය කියයි.
- එමෙන්ම විජය රජුගේ පැමිණීමත් ඉන්පසුව පැමිණි ශාක්‍යවංශියන් අතර පණ්ඩුවාසදේවගේ අගමෙහෙසිය වන භද්දකච්චායනා බෞද්ධයන් වූ බවද සිතිය හැක. මේ අතර ඉන්දියාව සමඟ පැවති වෙළෙඳ සබඳතා නිසාද ලංකවාසීන් අතර බුදුසමය පිළිබඳ යම් හැඟීමක් පවතින්නට ඇත.

## භාරත ලංකා සබඳතා

- ධර්මාශෝක හා දේවානම්පියතිස්ස රජු සමඟ පැවති මිත්‍රත්වය නිසා තිස්ස රජවී නොබෝ කලකින්ම දූත පිරිසක් ධර්මාශෝක රජු වෙත යැවීය.
- එහිදී ධර්මාශෝක රජු පැහැදී,
දේවානම්පියතිස්ස රජුට අභිෂේක මංගල්‍යය සඳහා අවශ්‍ය උපකරණ පරිත්‍යාග වශයෙන් එවනු ලැබීය. ඒ සමගම "මම තෙරුවන් සරණ ගියෙමි. රජතුමනි ඔබද ශ්‍රද්ධාවෙන් තෙරුවන් සරණයට පැමිණෙව "යි දන්වා එවීය. දෙවන පැතිස් අභිෂේකය වෙසක් පෝ දිනක දී සිදුවිය. ඉන්පසුව මිහිඳු හිමියන්ගේ වැඩමවීම ද සිදුවිය.

# මහින්දාගමනය

## තෙවන ධර්ම සංගායනාව

- **මූලිකත්වය - මොග්ගලී පුත්ත තිස්ස හිමි**
- **ස්ථානය - පැළලුප් නුවර අශෝකාරමය**
- **ප්‍රචාරය - රටවල් 9 ( ශ්‍රීලංකාවද ඒ අතර විය.)**

පළමුව මිහිඳු හිමි වැඩමවීමට සිටි සමයේ ලංකාවේ මහලු මුටසීව රජු රජකම් කළ බැවින් ඔහුගේ අභාවයෙන් පසුව රජවූ දෙවන පැතිස් රජ සමයේ මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කළ සේක. උන්වහන්සේ සමඟ ඉට්ටිය, උත්තිය , සම්බල , භද්දසාල යන තෙර වරුන්ද, සුමනසාමණේරන්ද , භණ්ඩුක උපාසක පැමිණි අතර මිස්සක පව්වට වැඩම කිරීමට ප්‍රථම මිහිඳු හිමියන් වේදිසගිරියේ වැඩ විසූ සේක.

## තිස්ස රජුට මිහිඳු හිමි මුණගැසීම

- **පොසොන්මස(ජෙට්ඨා මාසය)** පෝ දින තිස්ස රජු මුව දඩයමෙහි ගිය අතරතුර දී තිස්ස නමින් තමාව ඇමතූ මිහිඳු හිමි දැක නතර විය. එහිදී මිහිඳු හිමියන් තමන්වහන්සේ හඳුන්වාදුන් අතර තිස්ස රජුගේ බුද්ධිය විමසා බැලීමට ප්‍රශ්න කීපයක්ද ඇසීය. අවසානයේ තිස්ස රජු හා පැමිණි පිරිසට **චුල්ලහත්ථිපදෝපම සූත්‍රය** දේශනා කරන ලදී.

මෙමසූත්‍රයේ,

- යමෙකු බුදුසමය පිළිගෙන භික්ෂුවක් වන අන්දම ,
- කය වචනය සංවරව ශීලයෙහි හික්මී සැනසීම ලැබීමද ,
- භික්ෂු ජීවිතයේ අවස්ථා හා අරහත් බවද ,
- චතුරාර්ය සත්‍යයද ,

විස්තරවේ.

- අවසන තිස්ස රජු හා පිරිස බුදුදහමේ පැහැදී තෙරුවන් සරණ ගියහ.පසුව භණ්ඩුක උපාසකයන්ද පැවිදි කිරීම එදින රාත්‍රියේ මිස්සක පව්වේදී සිදුවිය.

## නගරයට වැඩම වීම

- දෙවන දින රජුගේ ආරාධනයෙන් මිහිඳු හිමි ඇතුළු පිරිස අනුරාධපුරයට වැඩම කළහ.
- එහිදී පළමුව විමාන වත්ථුවෙන් හා පේත වත්ථුවෙන් කතා දේශනා කළහ.
- ඒවායින් කළකම් පළදී ප්‍රේත ලෝකයෙහි හා දිව්‍යලෝකයේ වාසයකරන්නන් ගැන කියවේ.
- පසුව රජ පවුලට පමණක් නොව රටවාසීන් හටද පළමුව ඇත්හලෙහිද, පසුව නන්ද උයනේදීත්, ධර්මය දේශනා කෙරුණි.

එහිදී මිහිඳු හිමියන් පහත සූත්‍රයන් දේශනා කරන ලදී.

• දේවදූත සූත්‍රය - පවෙහි ආදීනව කෙරෙහි බිය උපදවා මිනිසුන් පවින් වැළැක්වීම පිළිබඳව
• බාල පණ්ඩිත සූත්‍රය - බාලයා / අඥානයා අවිද්‍යාව නිසා මෙලෝ පරලොව දුක් විඳීමත් ,අවිද්‍යාවෙන් මුලා නොවූ පණ්ඩිතයා කුසල් කොට දෙව්ලොව සැප විඳීමත් දැක්වේ .

## මහමෙවුනා උයන පූජාකිරීම හා මහා විහාරයේ ආරම්භය

- අනතුරුව දෙවන පැතිස් රජු විසින් මහමෙව්නාව පූජා කිරීමත් සමඟ නිරතුරු සමාජය හා සම්බන්ධ වීමෙන් ධර්ම දූතයන් වහන්සේලාගේ කටයුතුවලට ස්ථාවරත්වයක් ඇතිවිය. මිහිඳු හිමිගේ උපදෙස් පරිදි මහාවිහාරය කරවූ අතර එනමුත් ලංකාවේ බුදුසසුන පිහිටුවීමට නම් සංඝකර්ම කළ යුතු බවට මිහිඳු හිමි දෙසූ බව මහාවංශයේ හා දීපවංසයේ දැක්වේ .මෙයම සමන්තපාසාදිකාවෙහිද වෙනස් ලෙස දක්වා ඇති නමුත් දෙකෙහිම එකම අර්ථයක් ඇති බව වල්පොළ රාහුල හිමියන්ගේ ලංකාවේ බුදුසමයේ ඉතිහාසය ග්‍රන්ථයේ දක්වා ඇත.

## චෛතියගිරිය පිළිගැනීම හා අරිට්ට කුමරු පැවිදිවීම

- වස් විසීමට මිහිඳු මහරහතන්වහන්සේ චෛතියගිරිය ට වැඩම කළ අතර එහිදී රජුගේ බෑණනුවන් වූ මහා අරිට්ට ඇමැති ඇතුළු පනස්පස්දෙනෙක් පැවිද්ද ලබාගත්හ. වර්තමාන කණ්ඨක චෛතිය අවට ගල්ලෙන්වල උන්වහන්සේලා වැඩ වාසය කළහ .

## ථූපාරාම දාගැබ

- මිහිඳු හිමිගේ උපදෙස් පරිදි සුමන සාමණේරයන් වහන්සේ විසින් දඹදිවෙන් බුදුරජාණන්වහන්සේගේ දකුණු අකු ධාතුව ඇතුළු ධාතූන් වහන්සේලා වැඩම කරන ලදී .එම ධාතූන් වහන්සේලා නිදන් කොට දෙවන පැතිස් රජු විසින් ථූපාරාම දාගැබ කරවීය .එය ලංකාවේ ප්‍රථම දාගැබයි .

## බෝධි ශාඛාව වැඩමවීම හා භික්ෂුණී සමාජය පිහිටුවීම

- සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධි ශාඛාව රැගෙන ලක්දිවට වැඩමවීමෙන් අනතුරුව ,සෝවාන් ඵලයට පැමිණ සිටි අනුලා බිසව හා පිරිවර ස්ත්‍රීහු මෙහෙණි සසුනෙහි පැවිද්ද ලැබූහ. ලක්දිවට ගෙන එන ලද බෝධි ශාඛාව රෝපණය කරන ලද්දේ පෙර බුදුවරුන්ගේ බෝධි වෘක්ෂවල ශාඛා සිට වූ ස්ථානයේදීම බව සමන්තපාසාදිකාව දක්වයි .

## විනය සංගායනාව

- ලක්දිව බෞද්ධ ශාසනය පිහිටියේ දැයි දෙවන පෑතිස් රජු විසින් මිහිඳු හිමියන්ගෙන් විමසූ කළ "එය පිහිටින මුත් මුල් බැස නොමැති "යැයි මිහිඳු හිමියන් පැවසීමෙන් විනය සංගායනාවක් කිරීම ආරම්භවිය. ඒ අනුව ලාංකීය යුවලකගේ පුතෙකු ලංකාවේදී විනය ඉගෙන ලංකාවේදීම එය විස්තර කොට දේශනා කළ යුතු වූ බැවින් එම විනය සංගායනාව අරිට්ට තෙරුන්වහන්සේ විසින් ථූපාරාමයේදී සිදු කළහ. මහාරිට්ඨ තෙරණුවන් විනයාචාර්ය වූ අතර මත්තාභයතෙරණුවෝ 500 ක් භික්ෂූන් හා කැටිව විනය ඉගෙන ගත්හ.

- ලංකාවේ බුදුසසුන මුල් බැසගැනීමට මුල් වූ හේතුවෙන් මිහිඳු හිමි " දීපප්පසාදකො " ලෙසද හඳුන්වයි. උන්වහන්සේ ලංකාවේ කලාව හා ගෘහ නිර්මාණශිල්පය , සිංහල භාෂාව හා සාහිත්‍ය ආරම්භ කිරීමටත් මුල් වූ සේක .

- දෙතිස් වියේදී ලංකාවට වැඩම කළ මිහිඳු හිමියන් පුරා වසර 80 ක් ආයු වළඳා දෙවන පෑතිස් රජු ඇවෑමෙන්, උත්තිය, රජුට අටවැන්නෙහි ,චෛතියගිරියෙහි වස් වැස සිටියදී පිරිනිවන් පෑහ. උන්වහන්සේගේ ධාතු නිදන් කොට අනුරාධපුරයේ ද සෑගිරියෙහි ද දාගැබ් පිහිටුවිය.

# 11. භික්ෂුණී සමාජය

- හික්ෂුණී සමාජයේ ආරම්භය භාරතයේදී,මහා ප්‍රජාපතී ගෝතමියගේ ඉල්ලීම පරිදි සිදු විය.
- ඉන් සියවස් තුනකට පසු ලක්දිව භික්ෂුණී සමාජය අශෝක රජුගේ ධර්ම විජය ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස ඇරඹුණි.
- භික්ෂුණී සමාජය පිළිබඳ මහාවංසය, සමන්තපාසාදිකාව,දීපවංසයෙහි තොරතුරු හමුවේ.

## ලක්දිව භික්ෂුණී සමාජයේ ආරම්භය

- මිහිඳු මාහිමියන් දිවයිනට බුදු සමය හඳුන්වා දී නොබෝ දිනකින් මෙහෙණි සස්න ආරම්භ විය.
- අනුලා දේවිය ඇතුළු කාන්තාවෝ පැවිදි වීමට කැමැත්ත පළ කළහ.
- ඒ සඳහා මිහිඳු හිමියන්ගේ උපදෙස් පරිදි දේවානම්පියතිස්ස රජු විසින් ධර්මාශෝක රජු වෙත සංඝමිත්තා තෙරණිය කැඳවාගෙන ඒම පිණිස අරිට්ට ඇමති ඇතුළු දූත පිරිසක් යවන ලදී.
- බුද්ධ වර්ෂ දෙසිය තිස් හතෙහි උඳුවප් මස ඉන්දියාවේ තාම්‍රලිප්තයෙන් නැව් නගුණු සඝමිත් තෙරණිය සත් දිනකින් දඹකොළ පටුනට ගොඩ බටහ.
- දීපවංසයට අනුව එතුමිය කැටුව බොහෝ භික්ෂුණීහු දඹදිව සිට මෙරටට පැමිණියහ.
- සාංචි ස්තූපයේ නැගෙනහිර වාහල්කඩේ නිරූපිත කැටයමකින් සංඝමිත්තාවන්ගේ ලංකාගමනය සනාථ වන බව ගෘන්ඩ්වෙල් විසින් පෙන්වා දී ඇති බවමහාවංසඉංග්‍රීසි පරිවර්තනයේ දැක්වේ.
- සංඝමිත්තා තෙරණියෝ උපාසිකා නම් මෙහෙණවරෙහි ලැගුම් ගෙන් සිටි අනුලා දේවිය ඇතුළු කාන්තාවන් පැවිදි කොට භික්ෂුණී සමාජය පිහිටවූවෝය.
- මේ අවස්ථාවේදී ලක්දිව උපසම්පදාව ලැබූ භික්ෂුණීන් කිහිප දෙනෙක් සිට ඇති අතර මේ මගින් ලක්දිව භික්ෂුණී සමාජයේ ආරම්භයේදීම දියුණුවක් ඇති වූ බව පෙනීයයි.

## මෙහෙණි සස්නේ වර්ධනය

- දේවානම්පියතිස්ස රජු මෙහෙණින් සඳහා ආරාම දොළහක් ඉදි කරවූ බව මහාවංසයේ දැක්වේ.
- සංඝමිත්තා තෙරණිය උපාසිකා විහාරයෙහි වාසය කර පසුව චේතියගිරියට වැඩම කළ අතර දෙවනපෑතිස් රජු එහි හත්ථාල්හක මෙහෙණවර කරවා පිදූ බව මහාවංසයේ දැක්වේ.
- භික්ෂුණීන්ට තනිව වාසය කිරීම අකැප බැවින් නගරයෙහිම වාසය කළහ.

## පරිහානියෙන් පසු සීඝ්‍ර දියුණුවක්

- දෙවනපෑතිස් රජ සමයේ ශීඝ්‍ර දියුණුවක් ලැබූ නමුත් උත්තිය රජ සමයේ සඝමිත් තෙරණියගේ පරිනිර්වාණය සමඟ පරිහානියක් දක්නට ලැබේ.
- නැවත දුටුගැමුණු රජ සමයේ සමයේ භික්ෂුණී සමාජයේ නවෝදයක් ඇති විය.
- දීපවංසයට අනුව මහිලා,සමන්තා,ගිරිකාලි,දාසී හා කාලී යන සුප්‍රකට භික්ෂුණීන් පස් නමක් රුහුණේ සිට අනුරාධපුරයට වැඩම කර විනය ඉගැන්වූ බවත්, මිරිසවැටි විහාර පූජා උත්සවයට භික්ෂුණීන් අනූ දහසක් පැමිණි බව මහාවංසයේත් දැක්වේ .
- රුවන්වැලි මහා සෑයේ මංගල ශිලා ප්‍රතිෂ්ඨාපන උත්සවයේදී භික්ෂුණින් දහහතරදහසක් ධර්මය අසා රහත් වූ බව කියවේ.
- ලංකා භික්ෂුණී සමාජයේ ස්වර්ණමය යුගය දුටුගැමුණු රජ සමය බව පෙනීයයි.
- සද්ධාතිස්ස රජ සමයේ එතරම් තොරතුරු සඳහන් නොවුනද එතුමන්ගේ පුතු වූ ලජ්ජි තිස්ස රජ සමයේ භික්ෂුණී සමාජය පිළිබඳ තොරතුරු පාලි රසවාහිනිය,සිහලවත්ථුපකරණය, විශුද්ධිමාර්ගය හා වෙනත් අටුවා වල දැක්වේ.

## දුක්බර අවධියක්

- වළගම්බා රජ දවස ආක්‍රමණ, ස්වාභාවික විපත් නිසා භික්ෂුණී සමාජයට අඳුරු යුගයක් විය.
- මේ සමයේ සිදුවූ ශාසන භේදයට අනුව භික්ෂුණී ශාසනයද බෙදී යන්නට ඇතැයි සිතිය හැක.
- මහා චූළී මහාතිස්ස රජ සමයේ භික්ෂුණී සමාජය දියුණුව පැවති බව පෙනේ.
- කුඨ කණ්ණතිස්ස රජු දන්ත ගේහ නම් මෙහෙණවරක් කරවන ලද බව දැක් වේ.

## රාජ්‍ය අනුග්‍රහය හා නිකාය භේදය

- භික්ෂුණීන්ද නිකාය වශයෙන් බෙදී සිට ඇති අතර මහසෙන් රජු උතුරු අබාහෙබ නම් භික්ෂුණී ආරාම දෙක කරවා මහා විහාරයට විරුද්ධ පාක්ෂික භික්ෂුණීන්ට පූජා කළ බව මහාවංසයේ දැක්වේ.
- ලංකාවේ දේවසාරා භික්ෂුණීය ප්‍රමුඛ භික්ෂුණීන් පිරිසක් චීනයට වැඩම කර චීනයේ භික්ෂුණී ශාසනය පිහිට වූහ.
- පළවන මුගලන් රජු රාජිනී නම් මෙහෙණවරක් ඉදි කොට සාගලික භික්ෂුණීන්ට පූජා කර බව චූලවංශයේ දැක්වේ.
- දෙවන අග්බෝ රජ සමයේ කලිඟුරට රජු,බිසව හා ඇමතියාද මෙරටට පැමිණ පැවිදි වූ බව සඳහන්.
- තුන්වන දෙටුතිස් රජුගේ මෙහෙසිය ශාසනයේ පැවිදි වී අභිධර්මය උගත් අතර සිව්වන අග්බෝ රජුගේ ජෙට්ඨා නම් මෙහෙසිය ජෙට්ඨාරාමය නම් මෙහෙණවරක්ද,ගම්ද පිදූ බව චූලවංශයේ සඳහන් වේ.
- සීගිරි ගී අතර මෙහෙණියක් විසින් ලියන ලද ගීයක් සොයාගෙන ඇත.
- දෙවන දප්පුල රජුගේ සේන නම් මෙහෙසිය සිලාමේඝ නම් මෙහෙණවරක් කරවා පිදූබව සඳහන්
- සිව්වන කාශ්‍යප රජු තිස්සංරාම නම් මෙහෙණවරක් කරවා ඇත. ගෝ වැව ගල් සන්නසේද එම පුවත දැක්වේ.
- සිව්වන මිහිඳු රජුගේ මිහින්තලා ශිලා ලිපියේ දාන ශාලාවක් හා උපස්ථාන ශාලාවක් කරවූ බවත් ජේතවන ශිලා ලිපියේ මෙහෙණවරක් කරවූ බවත් දැක්වේ.
- මෙහෙණි සස්න අනුරාධපුර යුගයේ බිඳ වැටීමත් සමග මුළුමනින්ම පරිහානියට පත් විය.

## භික්ෂුණී සමාජයේ පිරිහීමට හේතු

- භික්ෂූන් වහන්සේලා අතර නිකාය භේදය ඇතිවන විට භික්ෂුණීන් බෙදී යාම.
- දේශිය අර්බුද , විදේශීය ආක්‍රමණ , සාගත වැනි ස්වාභාවික බලපෑම් ද හේතු විය.

# 12. ශ්‍රී මහා බෝධින් වහන්සේ වැඩම වීම

## බෝධි වෘක්ෂයේ පූජණීයත්වය

- ඇසතු වෘක්ෂය වැනි විශාල වනස්පතින් අතීතයේ සිටම මිනිස් හද තුළ ගුප්ත හැඟීම් ජනිත කරමින් භක්තිය ඇති කිරීමට සමත් විය.
- මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ටාචාරයේ කාසි මුද්‍රාවල මෙම ගස සටහන්ව තිබීමෙන් එම යුගයේද පූජනීය වෘක්ෂයක්ව පැවති බව පෙනේ.
- වෛදික යුගයේද , උපනිෂද් යුගයේද මෙම වෘක්ෂය පූජනීයත්වයට පත්ව තිබුණි .
- ඇසතු වෘක්ෂය විෂ්ණු මූර්තියක් හැටියට මහා භාරතය සඳහන් කරයි.
- මේ අනුව ඇසතු වෘක්ෂය ප්‍රාග් බෞද්ධ යුගයේ මෙන්ම පශ්චාත් බෞද්ධ යුගයේද පූජනීයත්වයට පත්වූ වෘක්ෂයකි.
- බුද්ධ ප්‍රතිමා ගොඩනැගිමට පෙර ඇසතු වෘක්ෂය බුද්ධත්වයේ සංකේතයක් බවට පත්ව තිබුණි .
- බුදුන්වහන්සේ ජීවමාන කාලයේදීම සැවැත්නුවර ජේතවනාරාමයේ ආනන්ද බෝධිය රෝපණයත් එය තමන්ගේ නිබද්ධවාසයක් හැටියට බුදුරදුන් විසින් ම ප්‍රකාශ කිරීම බෝධි රෝපණයටත් පූජාවන්ටත් උනන්දු කරවන සිදුවීමක් විය.
- ධර්මාශෝක අවධිය වන විට බෝධි වන්දනාව භාරතයේ ජනප්‍රියව පැවති බව සමන්තපාසාදිකා අටුවාවේ මෙන්ම සාංචි ස්තූපයේ කැටයම් වලද දැක්වේ .
- ධර්මාශෝක රජු,මොග්ගලිපුත්ත තිස්ස මහරහත් හිමි, මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිව බුදුදහම පැතිර වීමට මුල් වූ භාරතීයන් වේ.

## වෘක්ෂවන්දනාවට නව අරුතක් එක් කිරීම

- වෘක්ෂ වන්දනාව මෙරට ජනප්‍රිය ඇදහීමකි.
- නුග ගස මෙන්ම තල් ගසද එවකට පූජනීය වෘක්ෂ ලෙස සලකා ඇත.
- ඔවුනට වඩා අර්ථවත් වන්දනා ක්‍රමයක් හඳුන්වා දීමට ධර්මදූත කණ්ඩායම කල්පනා කිරීම ශ්‍රී මහා බෝධින් වහන්සේ වැඩම වීමට හේතු වන්නට ඇත.

## බෝධි ශාඛාව වැඩම වීමට දූත පිරිසක් යැවීම

- අරිට්ඨ ඇමති ප්‍රමුඛ පිරිස දඹකොළ පටුනින් නැව් නැගී පැළලුප් නුවරට ළඟා විය.

## ශ්‍රී මහා බෝධි ශාඛාව ගැනීම

- බුදුරදුන් පිරිනිවන් මංචකයේදී දේශනා කළ මහා අධිෂ්ඨාන පහ,

  1.අශෝක රජතුමා ශාඛාවක් ගැනීම පිණිස පැමිණි විට මහා බෝධියේ දකුණු ශාඛාව ඉබේම ගැලවී රන් කටාරමේ පිහිටනු ලැබේවා .
  2.බෝධි ශාඛාව පිහිටන කල්හි එය හිම වළා ගැබක් අතරට වැද සිටීවා.
  3.සත් දිනකට පසුව නැවත රන් කටාරමේ පිහිටි කෙනෙහි පත්‍රයන්ගෙන් හා ඵලයන්ගෙන් සවනක් ගන බුදුරැස් විහිදේවා
  4. ථූපාරාම චෛත්‍යයේ පිහිටන මගේ අකු ධාතුව අහසට නැගී යමා මහ පෙළහර කෙරේවා.
  5. මගේ දෝණයක් පමණ ධාතූන් ලක්දිව රුවන්වැලි සෑයේ පිහිටන කල්හි බුද්ධ වේශය ගෙන අහසට පැන නැගී යමා මහ පෙළහර කෙරේවා.

## බෝධි ශාඛාව වැඩම වීම

- තේවා විධි පැවැත්වීමට රජ කුමාරවරු අට දෙනෙක් ප්‍රධාන කුල රැසකට අයත් පිරිසක් එවීය.
- එකොළොස් නමක් මෙහෙණින් සහිත වූ සංඝමිත්තා තෙරණිය හා අරිට්ඨ කුමරු ඇතුළු පිරිස දූත පිරිසේ මූලිකත්වය දැරීය.
- තාම්‍රලිප්ත තොටේ සිට දඹකොළ පටුනට ළගා වූ අතර දෙවනපෑතිස් රජු අටලොස් කුලයක ජනයා සමග බෝධි ශාඛාවත් , සංඝමිත්තා තෙරණිය ප්‍රමුඛ භික්ෂුණී සංඝයාත් ගෞරවයෙන් යුතුව පිළිගත්තේය.

## ශ්‍රී මහා බෝධි ශාඛාව වැඩමවීමෙන් වූ ප්‍රබෝධය

### ආගමික ප්‍රබෝධය

- ශ්‍රී මහා බෝධි රෝපණය ලක්වැසියන්ට බොදු පූජා විධි හඳුන්වා දීමේ පියවරක් විය.

### සංස්කෘතික ප්‍රබෝධය

- කලා ශිල්ප පිළිබඳ ඇති වූ පුනරුදය විශේෂත්වයක් ගනී.

## කලා ශිල්ප

- කුල දහඅටකට අයත් ශිල්පීන් පැමිණීමත් සමඟ එවකට ඉන්දියාවේ දියුණුව පැවති කැටයම් , මූර්ති ,චිත්‍ර,ගෘහ නිර්මාණ වැනි කලාවන් මෙරටට හඳුන්වා දෙන්නට ඇතැයි සිතිය හැක.
- ලංකාවේ පළමු ස්තූපය ථූපාරාමය යි.
- ස්තූප ආශ්‍රිතව වටදා ගෙවල්,වාහල්කඩ වැනි කලා නිර්මාණ බිහිවිය.

## උත්සව

- ශ්‍රී මහා බෝධින් වහන්සේ මුල් කරගෙන විවිධ උත්සව පැවැත්වීම ද ආරම්භවිය.

## ශාස්ත්‍රීය ප්‍රබෝධය

- ශ්‍රී මහා බෝධින් වහන්සේ මුල් කරගෙන ග්‍රන්ථ සමුදායක් සිංහල සාහිත්‍යයට එකතු වී ඇත.
- සිංහල බෝධි වංශ කිහිපයක් තිබෙන්නට ඇති අතර තිස්ස හිමියන් විසින් රචිත මහා බෝධි වංශයට ඒවා මූලාශ්‍ර වන්නට ඇත.
- ගුරුළුගෝමීන් විසින් රචිත ධර්ම ප්‍රදීපිකාවද බෝධි සාහිත්‍යයට අයත් කෘතියකි.
- විල්ගම්මුල මාහිමියන් විසින් රචිත සිංහල බෝධි වංශය කුරුණෑගල යුගයට අයත් කෘතියකි.
- චුල්ලබෝධිවංශයද අගනා සාහිත්‍ය කෘතියකි.
- වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් විසින් රචිත මධුරාර්ථ ප්‍රකාශනී නම් ග්‍රන්ථයද බෝධි සාහිත්‍යයට අයත් ය.

# 13. ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවීම

## ධාතුපූජාව

- බුදුරජාණන් වහන්සේ අරමුණු කරගෙන ශාරීරික, පාරිභෝගික, උද්දේශික ත්‍රිවිධ චෛත්‍යයන් වන්දනා කරයි.
- බුදුන්ගේ පරිණිර්වානයෙන් පසු ශාරීරික ධාතු බෙදාගැනීමට රජවරු අතර අර්බුදයක් ඇතිවිය.
- එම ගැටලුව ද්‍රෝණ නම් බමුණා මැදිහත්ව විසඳා ඇත.
- බමුණා හෂ්මාවශේෂ රජවරුන් අතර සමව බෙදා දෙන ලදි.
- රජවරු ඒවා තැම්පත් කර චෛත්‍යයන් ගොඩනගන ලදි.

- මගධයේ අජාසත් රජු
- විසාලාවේ ලිච්ඡවීන්
- කපිලවස්තුවේ ශාක්‍යන් ධාතු තැම්පත් කර ස්තූප දහසක් ගොඩනැගූ බව පරිණිර්වාන සූත්‍රයේ සඳහන් වේ.

- නෑ හැලි හතක් දඹදිව වැසියන්ගේ
- රාමගාමයේ අනෙක් නෑ හැලිය නාරජුන්ගේ පූජාවට පාත්‍ර විය.
- දළදාවන් තාවතිංසයේ, ගාන්ධාර පුරයේ කාලිංග රජු විජිතයේ, නාලොව එක බැගින්
- දන්ත ධාතුන් හතලිහ කේශධාතු හා ලෝමධාතු එක බැගින් දෙවියෝ ගෙන ගියහ.

- සුමංගල විලාසිනියේ අනුව ද්‍රෝණ බමුණා දකුණු දළදාව හිස්වැස්මේ සඟවා ගනී.
- එය දුටු ශක්‍යා එය සොරකම් කර දෙව්ලොව ගෙන ගොස් සිළුමිණ සෑයෙහි නිධන් කරයි.
- ගෞතම බුදුන්ට පෙර විසූ බුදුවරුන්ගේ ධාතු පූජා ගැන අපදාන පාළියේ සඳහන්වේ.

එහි **" යමෙක් ජීවමාන වූ ලෝකනායක බුදුරදුන් පුදන්නේ නම්, එසේම පිරිනිවි බුදුන්ගේ අබැටක් පමණ වූ ධාතූන් වහන්සේ නමකුදු පුදන්නේ නම් චිත්තප්පසාදය සම වූ කල්හි පිනද සමානය. මහත් බවට ගියේද වේ. එහෙයින් සෑයක් කොට සර්වඥ ධාතූන් පුදනු මැනවි "** ලෙස සඳහන්වේ.

- චෛත්‍යක් වන්දනා කිරීමට පහන් සිතින් යන්නෙකු මගදී  මළ හොත් එකෙණෙහිම දෙව්ලොව උපදින බව සුමංගල විලාසිනියේ සඳහන්වේ .
- චෛත්‍යක් කැඩීම ආනන්තරිය පාපකර්මයක් බව මනෝරථ පූරණියේ සඳහන්වේ.

## දළදා වැඩම වීමට පෙර ලක්දිව ධාතු පූජාව

- බුද්ධත්වයෙන් නව වන මස මහියංගනයට වැඩම වූ අවස්ථාවේ මහා සුමන දේවතාවාගේ ඉල්ලීම පරිදි බුදුරදුන් කෙස්මිටක් දුන් බවත් එම කේශධාතු නිදන් කොට සත් තියෙන උස මහියංගන දාගැබ ගොඩනැංවූ බවත් මහාවංශයේ සඳහන් වේ.
- ධාතු චෛත්‍යයන් වන්දනා කිරීම බොහෝ සෙයින් ජනප්‍රියව පැවතියේ ධර්මාශෝක යුගයේදීය.
- අජාසත් රජතුමා විසින් ගොඩනැංවූ චෛත්‍යයකින් ධාතූන් වහන්සේලා ලබාගත් අශෝක රජතුමා එම ධාතු තැන්පත් කොට මුළු දඹදිව පුරාම අසූහාරදාහක් දාගැබ් බැන්ද වූ බව සුමංගල විලාසිනීයෙහි සඳහන්වේ.

ධාතූන් වහන්සේ නමක් දැකීම තථාගතයන් වහන්සේ දැකීමක් ලෙස මිහිඳු මාහිමියන් පවසා ඇත.

- උන්වහන්සේ මෙරටට වැඩමවා නොබෝ දිනකින්ම බුදුන්ගේ ශාරීරික ධාතු තැන්පත් කොට ස්ථූපයක් කරවීමේ අදහස දෙවන පැතිස් රජතුමාට දන්වා ඇත.
- ඒ අනුව **දෙවන පැතිස් රජතුමා විසින් බුදුරජාණන් වහන්සේගේ අකු ධාතුව ඇතුළුව ධාතූන් වහන්සේලා මෙරටට වැඩමවා අනුරාධපුරයෙහි ථූපාරාම දාගැබ ඉදිකොට එහි තැන්පත් කරවන ලද බව මහාවංසය සඳහන් කරයි.**

## දළදා පුවත

දළදා වහන්සේ පිළිබඳ තොරතුරු හැදැරීමට විශේෂයෙන්ම,

- මහාවංශය
- දාඨාවංශය
- ධාතුවංශය
- දළදා සිරිත
- දළදා පූජාවලිය
- රාජාවලිය ආදී සාහිත්‍යමය මූලාශ්‍ර වැදගත් වේ.

- දළදා වහන්සේ ලක්දිව වැඩමවීම පිළිබඳ පුරාවෘත්තය සම්පූර්ණයෙන්ම වාගේ සඳහන් වී ඇති **පරණම ග්‍රන්ථය දාඨාවංශය යි.**

- බඹදත් රජුගේ පරපුරට අයත් රජවරුන් විසින් ගරු බුහුමන් සහිතව ආරක්ෂා කරන ලද දන්ත ධාතුව පසු කලෙක පාඨලීපුත්‍රයෙහි පණ්ඩු නම් රජ කෙනෙක් රාජ්‍ය විචාළේය. එදවස දළදා වහන්සේ සතුව පැවැතියේ ගුහසීව නම් රජෙකුටය. ඒ අවධියෙහි ලාභ සත්කාරයෙන් පිරිහුණු මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ කේලම් බස් අසා කුපිත වූ පාටලීපුත්‍රයේ පාණ්ඩු රජතුමා තමාගේ සාමන්ත රජකු වූ ගුහසීව රජු දළදා වහන්සේ සමඟ පාටලීපුත්‍රයට අල්වාගෙන එන ලෙස රාජ හටයන්ට නියම කළේය .
- එහිදී ඛීරධාර නම් රජුගේ බෑණා වූ කුමරුවෙක් දළදා වහන්සේ ලබාගැනීම පිණිස ගුහසීව රජු සමඟ යුද්ධයට පැමිණියේය. එම සටනින් තමා පරාජයට පත්වුවහොත් බමුණු වෙස්ගෙන දළදා වහන්සේ රැගෙන සීහළ

දීපයට යන ලෙස ගුහසීව රජ තම බෑණා වූ දන්ත කුමරුට හා දුවණිය වූ හේමමාලා යන දෙදෙනාට නියම කොට තිබුණි. ඒ අනුව මුටසීව රජුගේ පරාජය දුටු දන්ත කුමරු හා හේමමාලා යන දෙදෙනා දළදා වහන්සේත් රැගෙන සිරිමේඝවණ්ණ රජුගේ නවවැනි රාජ්‍ය වර්ෂයේදී ලංකාවට පැමිණියහ .

- මෙම යුගයේදී හා ඊට සමීප යුගයන්හි දී ලංකාව හා කාලින්ගේ අතර පැවති සබඳතා දළදාව ලංකාවට වැඩමවීම කෙරෙහි තුඩු දෙන්නට ඇතැයි සිතීමට සාධක තිබේ. සෙනරත් පරණවිතාන මහතා පෙන්වා දෙන අන්දමට මහසෙන් රජු දවස ලංකාවේ පැතිර ගිය වෛතුල්‍යවාදය එවක මහායානය දියුණුවෙමින් පැවැති ආන්ධ්‍ර ප්‍රදේශයෙන් මෙරටට පැතිරෙන්නට ඇත .
- දළදා වහන්සේ අරඹයා හටගත් යුද්ධයෙන් පරාජය වුවහොත් දළදාව රැගෙන ලංකාවට යන ලෙස කළ නියමයෙන් එය සිදු වූ බව දාඨාවංසයේ මෙන්ම දළදා සිරිත දළදා පූජාවලිය වැනි ග්‍රන්ථවල සඳහන් වේ.

## දළදාව රැගෙන ඒම

**ගමන්මග**

- දන්ත කුමරු හා හේමමාලා යුවළ බමුණු වෙස්ගෙන නුවරින් පිටව ගියහ.
- නුවරින් දකුණු දෙසට ගමන් කළ ඔවුහු මහානදියෙන් එතෙරව දළදා වහන්සේ වැලිගොඩක සඟවා වන ලැහැබක විසූහ.
- මෙහිදී කිසියම් කෙනෙක් තෙර කෙනෙකුන් විසින් "තෙපි ශරීර පීඩා නොතකා දළදා වහන්සේ සීහළ දීපයට ගෙන යව්" යනුවෙන් අනුශාසනා කරන ලදි.
- දුර්ග මාර්ගය ගෙවා තාමලිත්ති පට්ටණයට ළඟාවූහ.
- එතනින් ලක්දිව බලා යන වෙළඳ නැවක් දැක දළදා වහන්සේ කේශ කලාපයෙහි සඟවාගත් හේමමාලා කුමරිය ද දන්ත කුමරු ද එම නැවෙන් පිටත්වූහ.
- මහසෙන් රජුගේ පුත් සිරිමේඝවණ්ණ රජුගේ නවවන අවුරුද්දෙහි ලංකා පට්ටනයෙන් ගොඩබටහ. අනුරාධපුර මේඝගිරි විහාරයෙහි කිසියම් භික්ෂූන් වහන්සේ කෙනෙකුන් රජු හා ඉතා කුළුපග බව අසා එහි ගොස් දළදා පුවත සැළකළහ. උන්වහන්සේ ඉතාමත් සාදරයෙන් ඔවුන් පිළිගෙන දළදා වහන්සේ ස්වකීය ගෘහයෙහි තැන්පත් කොට රජුට එපවත් දැන්වූහ.

## දළදාව තැන්පත් කරවීම

- දළදා පුවත දැනගත් වහාම  පාගමනින්ම මේඝගිරියට ගිය සිරිමෙවන් රජතුමා ඉමහත් ගෞරවයෙන් දළදා වහන්සේ පිළිගෙන අලංකෘත රථයක තබා පෙරහරින් වඩමවාගෙන රාජමාලිගාවට පැමිණ සිංහාසනයෙහි තැන්පත් කළේය. ඇතුළු නුවර මාහැඟි දළදා ගෙයක් කරවා දළදාව එහි වඩා හිඳුවීය.

- රජතුමා එය කරඬුවක තැන්පත් කළේය. අනතුරුව දෙවන පැතිස් රජ විසින් කරවන ලද ධම්මචක්කගෙහයෙහි වඩා හිඳුවීය. එතැන් පටන් එය දාඨාධාතුඝර නම් වී යැයි එම මහාවංශ පුවතින් කියවේ.

- දළදා වහන්සේ මහාවිහාරයෙහි හෝ අභයගිරියෙහි වඩා හිඳුවන්නේ නැතුව රාජවත්ථුවෙහි තැන්පත් කරන ලදි.මහාවිහාරයත් අභයගිරියත් අතර පැවැති අසමගිකම නිසා ඒ දෙපාර්ශ්වයටම අයත් විහාරයක තැන්පත් නොකොට රජුට අයිති ගොඩනැගිල්ලක දළදා වහන්සේ තැන්පත් කරන්නට ඇතැයි මේ අනුව සිතාගත හැක.

## දළදා වහන්සේ ජාතික වස්තුවකි

- ලංකාවේ රජු හැටියට පිළිගැනෙනු කැමති රජ දරුවකු මෙම දන්තධාතුව හා පාත්‍රාධාතුව තමන් සතු කොටගැනීම අවශ්‍ය යැයි පසුකලක සලකන ලද්දේය.

- ලංකාවේද දළදා වහන්සේ රාජ්‍ය උරුමයේ සංකේතයක් බවට පත්විය.

- ධර්මයත්, රාජ්‍යත් දෙකම සංකේතවත් කරමින් දළදා වහන්සේ රජු සමීපයෙහි වැඩසිටියහ.ලංකාවේ රාජ්‍ය විචාළ හැම පැරණි රජ කෙනෙක්ම වාගේ දළදා වහන්සේත් පාත්‍රාධාතුවත් ආරක්ෂා කිරීම තමාගේ වගකීමක් කොට සලකා ඇත.

- දළදා වහන්සේ රාජ්‍යය සතු වස්තුවක් වීම විදේශීය රජවරුන්ගේද සුහදතාව හා සැලකිල්ලට ප්‍රබල හේතුවක් වී ඇත. බුරුමයේ සැදැහැවත් බෞද්ධයෙකු වූ අනුරුද්ධ රජතුමා දන්ත ධාතුන් වහන්සේ බුරුමයට එවන ලෙස එවකට ලංකාවේ රජතුමා වූ විජයබාහු රජතුමාගෙන් ඉල්ලීමක් කළේය. එහෙත් විජයබාහු රජතුමා ඒ උතුම් වස්තුව නොයවා ඒ වෙනුවට දළදාවෙහි අනුරුවක් පිළියෙල කොට මැණික් කරඬුවක බහා බුරුමයට යැවූ බව බුරුම සාසන වංශයේ සඳහන් වෙයි. එම දළදාව දළදා මාළිගාවේ තැන්පත් කොට වැඳුම් පිදුම් කළ බවත් පසු කලෙක ස්වේදගොන් චෛත්‍යයේ නිදන් කළ බවත් එහි කියවේ.

## දළදා පූජෝපහාර විධි

### දළදා තේවාව

එහි මූලික අවස්ථා තුනකි.

1. අලුයම් තේවය
2. නව පෑ පූජාව/ දහවල් තේවය
3. සවස පූජාව

මේ හැරුණු විට නානුමුර මංගල්‍යය, අමුතු මුළුතැන් පූජාව, අලුත් සහල් මංගල්‍යය, අවුරුදු මංගල්‍යය, කාර්තික මංගල්‍යය, උපසම්පදා මංගල්‍යය, ආදී වශයෙන් පූජා කිහිපයක්ද ඇති බව කිව හැක.

## දළදා පෙරහැර

- ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම වූ තැන් පටන් මේ සඳහා පූජා පෙරහැර කළා සේම දළදා වහන්සේ වැඩම වූ තැන් පටන් මේ සඳහා ඊටත් වඩා උසස් අන්දමින් පෙරහර පවත්වන ලදී.
- දළදා වහන්සේ මෙරටට වැඩමවන විට බුදුසමය මෙරට තහවුරු වී පැවතීමත්, දළදා වහන්සේට අන් කිසිම වස්තුවකට නොලැබෙන අන්දමින් රාජ්‍ය ගෞරවය ලැබීමත්, මේ සඳහා විශේෂයෙන් හේතු වන්නට ඇත.
- වංශ කථා තොරතුරු අනුව දළදා පෙරහැර ආරම්භ වී ඇත්තේ ක්‍රිස්තුවර්ෂ 4 වන සියවසේදීය.

## දළදා මාළිගය

- අනෙක් හැම පූජනීය වස්තුවක්ම තැන්පත් කොට පැවති ස්ථානය විහාරය හෝ ආරාමය නමින් හැඳින්වූවද දළදා වහන්සේ වැඩ සිටි ස්ථානය හඳුන්වා ඇත්තේ ඝරය, මන්දිරය, මාලිගාව යන විශේෂ නාමයකින්ය.
- **අනුරාධපුරයේ ප්‍රථම දළදා මාලිගාව දෙවන පැතිස් රජතුමා විසින් ඉදිකරන ලද ධම්මචක්කගේහයයි.**

## පොළොන්නරු යුගය

- පොළොන්නරු යුගයේදී පළමුවන විජයබාහු රජු විසින් ඉදිකරන ලද දළදා මාළිගය අටදා ගේ වශයෙන් හඳුන්වයි.
- පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ඉදිකළ මැඳුර හැටදාගේ වශයෙනුත් හඳුන්වයි.
- පළමුවන පැරකුම්බා දවස දළදා මාලිගා තුනක් ඉදිකරන ලදැයි මහාවංශය කියයි.

## දඹදෙණිය යුගය

- තුන්වන විජයබාහු රජු විසින් බෙලිගල පර්වතය මුදුනේ අගනා දළදා මන්දිරයක් තනවා එහි දළදාව වඩා හිඳ වූ බව මහාවංසය කියයි.
- දෙවන පරාක්‍රමබාහු රජ දළදාව බෙලිගලින් දඹදෙණියට වැඩමවා දඹදෙණි පර්වත මුදුනේ තෙමහල් මන්දිරයක් ඉදිකොට එහි වඩා හිඳවීය.

## යාපහුව

- පළමුවන බුවනෙකබාහු රජ දවස යාපහුවට වැඩම වූ බව මහාවංශයේ සඳහන් වේ.
- දකුණු ඉන්දියානු සම්ප්‍රදාය අනුව නිර්මාණය කළ දළදා මාළිගාවකි.

## කුරුණෑගල යුගය

- පළමුවන බුවනෙකබාහු රජුගෙන් අනතුරුව ඇති වූ අරාජික කාලයේදී පඬිරට පස්බෑ රජවරුන් යටතේ ලංකාව ආක්‍රමණය කළ ආර්ය චක්‍රවර්ති නැමැත්තා යාපහුවේ දළදාව හා සෙසු වටිනා වස්තූන් රැගෙන ගොස් පඬි රට කුලසේකර රජුට භාර කළ බව මහාවංශයේ සඳහන්වේ.
- තුන්වන පරාක්‍රමබාහු රජු පඬිරට කුලසේකර රජු සමඟ මිත්‍ර වී දළදා වහන්සේද ගෙනවිත්, පොළොන්නරුවේ පැරණි දළදා මාළිගයේ තැන්පත් කරන ලදී.

## කෝට්ටේ යුගය

- හයවන පැරකුම්බා රජතුමා තෙමහල් දළදා මන්දිරයක් කරවා දළදා වහන්සේ වඩා හිඳ වූ අන්දම මහාවංශයේ සඳහන්වේ.

## මහනුවර දළදා මාලිගාව

- අවසාන අදියර ලෙස පෙනීයන්නේ මහනුවර යුගයේදී ගොඩනගන ලද දළදා මාලිගයයි.
- පළමුවෙන් මහනුවර දළදා මාලිගයක් ඉදිකරන ලද්දේ පළමුවන විමල ධර්මසූරිය රජතුමා විසිනි.
- දළදා මැදුරට පත්තිරිප්පුවක් කරන ලද්දේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින්ය.
- දැනට මහනුවර පවතින දළදා මන්දිරය ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් ඉදිකරන ලද මන්දිරය ලෙස සැලකිය හැක.
- කිත්සිරිමෙවන් රජ දවස මෙරටට වැඩමවන ලද ශ්‍රී දළදා වහන්සේ එවක් පටන් මේ දක්වා රාජ රාජ මහාමාත්‍යවරුන්ගේ ද පොදුමහජනතාවගේ ද අතිශය ගෞරවාදරයට පාත්‍රවෙමින් ශ්‍රී ලංකාවට ආශිර්වාදයක් ලබාදෙමින් වර්තමාන මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ වැඩවෙසෙති.

# 14. මහා විහාරය

දෙවන පැතිස් රජතුමා විසින් අනුරාධපුරයෙහි මුලින්ම පිහිටුවන ලද මහා ආරාමයට පැහැදිලි උචිත වන පරිදි මහා විහාරය යන වචනය යෙදී ඇති බව පිළිගත හැකිය.

මුල් අවධියේ විසූ සියලුම භික්ෂූන් වහන්සේලා කොතැනක හෝ විසුවද අනුරාධපුරයේ මහාවිහාරයට ආගමික වශයෙන් සම්බන්ධ වූහ. එබැවින් උන්වහන්සේලා මහාවිහරිකයන් ලෙස හඳුන්වා ඇත. ලංකාවේ පැරණිතම සංස්කෘතික මධ්‍යස්ථානය අනුරාධපුර මහා විහාරයයි.

## මහා විහාරයේ ආරම්භය

- මිහිඳු මහරහතන් වහන්සේ අනුරාධපුරයට වැඩි දින රාත්‍රිය ගත කිරීමට මහමෙවුනා උයනම තෝරාගත්තේ නගරයට වඩා දුරවූත් වඩා ළංවූත් ස්ථානයක් නොවන බැවිනි.
- දෙවන පැතිස් රජතුමා විසින් එම උයන මිහිඳු මාහිමියන් ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට පූජා කරන ලදී.
- මිහිඳු මාහිමියන් විසින් ආරාමයේ සැලැස්ම සකස් කරන ලදී. උන්වහන්සේගේ සැලැස්ම අනුව සංඝ කර්ම සඳහා මාලකයක්, උණු දිය නාන කාමරයක් සහිත පොකුණක්, ශ්‍රී මහා බෝධි රෝපණයට ස්ථානයක්, සංඝයාගේ උපෝසථ ශාලාවක්, ලහබත් ගෙයක්, සංඝයා වහන්සේලාට දාන ශාලාවක්, මහාථූපයත් ගොඩනැගෙන ස්ථාන නියම විය.
- දෙවන පැතිස් රජතුමා නගුලකින් සීසාමින් එම සීමා ලකුණු කොට දැක්විය. මෙම ආයතනයේ මුලින්ම හඳුන්වා ඇත්තේ තිස්සමහරාම නමින්ය.

## ලෝහ ප්‍රාසාදය

- මහා මුවල මාලක නමින් මිහිඳු මාහිමියන් විසින්ම අනුදැන වදාළ තන්හි දී කරන ලද ලෝහ ප්‍රාසාදය දෙවන පැතිස් රජුගේම කෘතියකි.
- ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේදී දුටුගැමුණු රජතුමා විසින් එම ස්ථානයේම නංවන ලද ලෝවාමහාපාය මහල් නමයකින් යුක්ත වූවකි.

## මහා ථූපය

- මහ චෛත්‍ය, මහා ථූපය, රුවන්වැලි දාගැබ යන නම් වලින් හැඳින්වෙන ගොඩනැගිල්ල ලෝහ ප්‍රාසාදයට ද වඩා ස්ථිරව ගොඩනගන ලද්දකි.
- දුට්ඨගාමිණී අභය රජු විසින් මේ අසදෘශ මහා කෘතිය කරවන ලදී.

- වෙනත් කිසිම චෛත්‍යයක මීට සමාන ධාතූන් වහන්සේලා ප්‍රමාණයක් නිදන් කොට නොමැති බැවින් මෙම දාගැබට අසදෘශ මහා ස්ථූපය යයි නම් විය.
- පළමුවන ගජබාහු ගාමිණී රජුගේ සෙල්ලිපියක හඳුන්වා ඇත්තේ රතන අරඹ නමිනි.
- සද්ධාතිස්ස රජතුමා වෙන එම ස්තූපය සම්පූර්ණ කොට ඇත් පවුරද බැඳවීය.
- ලජ්ජිතිස්ස රජු පේසා වළලු වලට හුණුගල් පුවරු ඇල්ලූ අතර බල්ලාටනාග රජු විසින් වැලි මිදුලක් තැනවීය.
- භාතික අභය රජතුමා විසින් මහා ථූපයට මහා මල් පූජාවක් කරන ලදී.
- මහාදාඨික, මහානාග, ආමණ්ඩ ගාමිණී අභය, පළමුවන සිරිනාග, සංඝතිස්ස, මිත්තසේන, ධාතුසේන, මහානාග අග්ගබෝධි, තුන්වන මොග්ගල්ලාන ආදී අනුරාධපුරයේ රජවරුන් විසින් මහා ථූපය ප්‍රතිසංස්කරණ කටයුතු හා සංවර්ධන කටයුතු කර තිබේ.
- මහාපරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල වැනි පොළොන්නරු යුගයේ රජවරුන් විසින් ද රුවන්වැලි සෑය ප්‍රතිසංස්කරණය කළ බව සඳහන් වේ.

## බුදු මහා විහාර අනුබද්ධ ආයතන

- ථූපාරාමය
- චේතිය විහාරය
- ඉස්සර සමණ
- වෙස්සගිරිය එම ආයතන වේ.

**මහා විහාරයත්, ඇතුළුව පඤ්ච මහා ආවාස නමින් ප්‍රකට වී තිබේ.**

## අනාවරණය නොවී ඇති ආයතන

- සුන්හාත පිරිවෙන
- දීඝචඞ්කමණ පිරිවෙන
- ඵලග්ග පිරිවෙන
- ථෙරාපස්ස පිරිවෙන
- මරුගන පිරිවෙන
- දීඝසන්ද සේනාපති පිරිවෙන
- චන්තාඝරය රන්සිමාලකය
- සලාකඝර යන ආයතනයන් ය.

  මෙම හැම ආයතනයක්ම දේවානම්පියතිස්ස රජතුමා විසින් කරවන ලද බව වාර්තා වෙයි.

- වසභ රජතුමා විසින් මහා විහාරයට කුටි පෙළක් කරවා දෙන ලදී.
- කණිටුතිස් රජතුමන් විසින් කුක්කුට ගිරි පිරිවෙන් පන්තියක් කරවා දුන් අතර එහි මඟුල් පිරිවෙන නම් ආයතනයක්ද පැවතියේය. වැදැරා පිරිවෙන ඊට අනුබද්ධව තිබුණි.
- කණිටුතිස් රජතුමන් විසින් සිව්රැස් ප්‍රාසාද 12 ක් මහා විහාරය වෙනුවෙන් ඉදිකරවා දුන් බව කියවේ.
- මයුර පිරිවෙන බුද්ධදාස රජතුමාගේ කෘතියකි. පස්වන කාශ්‍යප රජතුමා විසින් එය ප්‍රතිසංස්කරණය කර ඇත.
- දෙවන සේන රජුගේ සෙන්පති වූ කුට්ඨකසෙන් සෙනෙවිරත් පිරිවෙන මහා විහාරයේ ප්‍රයෝජනය සඳහා කර තිබේ.

## මහා විහාරිය භික්ෂූන් වහන්සේලාගේ විපුලත්වය

- දෙවන පැතිස් රජතුමාගේ අමාත්‍ය මහා අරිට්ඨ මහා විහාරයේ පැවිදි වූ ප්‍රථම සිංහලයාය. මේ අවධියේ මහා විහාරයේ සිදු වූ විනය සංගීතයේ ප්‍රධානියා වූයේද මහ අරිට්ඨ තෙරණුවන්ය.
- මහා විහාරීය භික්ෂූන් වහන්සේලා බුද්ධිමත් බැවින් ධාරණ ශක්තියෙන් මෙන්ම මහා ප්‍රඥාවෙන්ද අගතැන් පත්වූවන් බවට සාධක තිබේ. උන්වහන්සේලා අතර මහා විනයධරයන් වහන්සේලා මෙන්ම අභිධර්ම විශාරද මහ තෙර වරුන්ද වූහ.

❖ භාණක නමින් හැඳින්වුණු තෙරවරුන්ට තුන්පිටකයම වන පොත් කොට මතක තබා ගැනීමට සිදුවිය. උන්වහන්සේලාගේ ධාරණ ශක්තිය දියුණුව පැවති බව පෙනේ. මජ්ඣිම භාණක දේව තෙරුන් අවුරුදු එකුන් විස්සක් භාවනානු යෝගීව සිට එම නිකාය කිසිම වැරදීමක් නැතිව යළි කීමට සමත් වූ බව අට්ඨ කථාවේ සඳහන් වේ.

❖ අවුරුදු දහසක්ම අධ්‍යාපනය අතහැර සිටි නාග තෙරුන්ට ධාතු කථා කිසිම වැරදීමක් නැතිව ඉගැන්වීමට පුළුවන් විය.

❖ ත්‍රිපිටක චූලාභය තෙරුන්ට අනුරාධපුර සියලු වැසියන් එක්වරක් දුටු පමණින් නම් පවා මතක තබා ගැනීමට පුළුවන් ශක්තියක් තිබුණි.

## මහා විහාරයෙන් සිදුවූ ධර්ම ශාස්ත්‍රීය සේවය

- බ්‍රාහ්මණ දුර්භික්ෂ කාලයේත් මහසෙන් රජුගේ අතවර මධ්‍යයේත් මහා විහාරීය භික්ෂූන් මුහුණ පෑ දුෂ්කර අපමණය.
- සිංහල භාෂාවෙන් දහම් දෙසා සිංහලෙන් අටුව තබා සිංහලයන් දහම් මගට යොමු කළ අනුබුදු වරයා මිහිඳු මහරහතන් වහන්සේ බව ඓතිහාසික සත්‍යකි.
- වළගම්බා රජු දවස මහා විහාරය භික්ෂූන් වහන්සේලා අතින් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලදී.
- මහානාම රජු දවස බුද්ධඝෝෂ ආචාරීන් විසින් සිංහල අටුවා පාලියට නැගීම සිදුවිය.
- ලංකාවේ ප්‍රචලිත ථේරවාද බුදුදහම වෙනත් රටක හෝ ආරක්ෂා වීමට හේතු වන මේ කාර්යය ද මහා විහාරික භික්ෂූන් වහන්සේලා මැදිහත් වීමෙන් සිදුවූවකි.

## කලා ශිල්ප වලට ලැබුණු අනුබලය

- බුද්ධ ධර්මයට මුල් තැනක් ලැබුණත් වෛයාකරණ, ඡන්දස් අලංකාර, සාහිත්‍ය ඉතිහාසය, තර්ක ශාස්ත්‍රය, ගණිතය, වෛද්‍ය ශාස්ත්‍රය වැනි විෂයයන් පවා මහා විහාරය මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ බවක් නොපෙනේ.
- දීපවංශය, මහාවංශය වැනි ඉතිහාස මෙන්ම වීරකාව්‍යයන්ද මහා විහාරික භික්ෂූන් වහන්සේලා මගින් ලැබී ඇත. සියබස්ලකර වැනි කාව්‍යාලංකාර ග්‍රන්ථයන්ද බිහිවන්නට ඇත්තේ මහාවිහාරයෙන් බෙදා දුන් සාහිත්‍යධරයන් නිසාය.
- එය සීගිරි කැටපත් පවුරේ ඇති ගී බොහොමයක් මහාවිහාරයේ ආභාසය ලැබූ බව පෙනේ.

## මහාවිහාරයේ අන්තර්ජාතික කීර්තිය

- මහා විහාරයේ වැඩ සිටි ධර්මධර, විනයධර මහ තෙරවරුන්ගේ කුසලතාවන් අසා විදේශීය ධර්ම ගවේෂීහු මහා විහාරයට පැමිණෙන්නට පටන් ගත්හ.

- මහාථූප පූජා උත්සවයට ලෝකයේ නොයෙක් රටවල් වලින් විශාල සංඛ්‍යාවක් භික්ෂූන් වහන්සේලා පැමිණි බව වාර්තා වේ.

- එසේ පැමිණි විදේශිකයන් අතර ඉන්දියාවේ නොයෙක් ප්‍රදේශවලින් මෙන්ම පර්සියාවේ ග්‍රීසිය වැනි රටවලින්ද පැමිණි භික්ෂූන් වහන්සේලා වූහ.

- හියුත්සාං නම් දේශාටක භික්ෂුව "මුහුදු මැද සිංහ නම් රටක් ඇති බවත්, ථෙරවාද නිකායට අයත් භික්ෂූන් හා යෝග ශාස්ත්‍ර දත් අය සිටින නිසා එය නම ගිය දිවයිනක් බවත් අසා තිබේ" යනුවෙන් සඳහන් කරයි.

## මහා විහාරයේ පරිහානිය

- දෙවන පැතිස් රජතුමන් විසින් ගොඩනඟන ලද දුටුගැමුණු යුගයෙහි දීප්තිමත්ව බැබළුණු මහා විහාරය මහසෙන් රජු විසින් විනාශ කොට නැවත ගොඩනංවන ලදී.
- ඇතැම් රජවරුන්ට අභයගිරි, ජේතවන දෙනිකායටම උදව්කරන්නට වුව නිසා මහා විහාරයට ලැබුනු අනුග්‍රහය හීන විය.
- ධාතුසේන, සීලාකාල ,සිරිමේඝවණ්ණ, දෙවන අග්ගබෝධි, සීලාමේඝවණ්ණ ,දෙවන දායෝපතිස්ස වැනි රජවරු බොහෝවිට අභයගිරිකයන්ගේ දායකයෝ වූහ.
- ක්‍රි.ව පස්වන හයවන සියවස්වලින් පසුව අනුරාධපුර රාජධානියද ක්‍රමයෙන් පිරිහීමේ ලකුණු පහළ විය.
- නවවන සියවස වන විට ලෝහප්‍රාසාදයේ සිටියේ භික්ෂූන් වහන්සේලා දෙතිසක් පමණි.
- විවිධ දුෂ්කරතා හා උවදුරු මධ්‍යයේ ථේරවාද බුද්ධ ධර්මය ආරක්ෂා කරගෙන ආ මහා විහාරය එපමණ කලක්ම දෙවන මිගදායක් වූයේ බුදුදහමේ ඉගැන්වෙන අනිත්‍යතා ධර්මය සිහිපත් කරවන්නට මෙනි.

# 15. අභයගිරි විහාරය

( ධර්මරුචි නිකාය, අභයගිරි නිකාය, අභය විහාරය, අභයුත්තර විහාරය, උත්තර විහාරය)

* ඉදිකරවීම - වළගම්බා රජු

* ආරම්භය - ක්‍රි.ව පෙර පළමුවන සියවසේදී

*වළගම්බා රජුන් කළ ද්‍රවිඩ සටනේදී තිස්ස නම් තෙර නමක් රජතුමාට සහාය දුන්නේය. රජු නැවත බලයට පත් වූ පසු ගිරි නිගණ්ඨ පූජකවරයා සිටි ආරාමය බිඳවා එහි පන්සලක් සාදා තිස්ස තෙරුන්ට පූජා කළේය.

## ගජබා රජ

- අභයුත්තර ථූපය විශාල කරවා විහාරයේ පැවැත්ම පිණිස වෙන් කළ ඉඩකඩම් වගා කිරීමට ජලය ලබාගැනීම සඳහා ගාමණි තිස්ස නමින් ජලාශයක් බැන්ද වීය.

## කණිට්ඨතිස් රජතුමා

- භූතාරාමවාසී මහානාග ස්ථවිරයන් වහන්සේට පැහැදී අභයගිරියෙහි රක්තප්‍රාසාදය කරවීම.

## වෝහාරික තිස්ස රජතුමා

- අභයගිරියෙහි හා එයට අයත් දක්ඛිණ චෛත්‍යයෙහි ඡත්‍ර සවිකිරීම.

## මහසෙන් රජු

- මහා විහාරයට අයත් ආරාම කඩා බිඳ දමා ඒවායේ වස්තුව අභයගිරියේ දියුණුවට යෙදවීම.
- ථූපාරාමයේ ඇති "මහාකාල සිලා ප්‍රතිමා" නම් වූ බුදුපිළිමය අභයගිරියට ගෙනයෑම.
- මහාවිහාරයට අයත්ව තිබූ මිහින්තලේ සඳගිරියද, පූර්වාරාමය නම් විහාරයද අභයගිරියට පැවරීම.

## සිරිමෙවන් රජු

- අභයගිරි විහාරය විශාල කිරීම.
- බෝධිද්‍රැමයක් පිහිටුවීම.
- දුඨග්ග බෝධිඝර නම් මන්දිරයක් ඉදිකරවීම.
- ලක්දිවට වැඩම කරන ලද දළදා වහන්සේ අභයගිරියට වැඩමවා ධාතු පූජා පැවැත්වීමට රජු නියම කිරීම.

( දළදාවහන්සේ ,කේශධාතුන් වහන්සේ, පාත්‍රධාතුන් වහන්සේ අභයගිරියේ තැන්පත් කිරීම.)

## දෙටුතිස් රජු

- බෝධිසත්ව රූපයක් කරවීම.

## ධාතුසේන රජු

- අභයගිරි විහාරයේ කැඩී බිඳී ගිය ඡත්‍ර ප්‍රතිසංස්කරණය කරවීම.
- රජු අභයගිරි මතයට ගරු කළේය.
- බුදුබව පතා බෝධියට නහනුමුර පූජාවක් කිරීම.
- මෛත්‍රී බොධිසත්ව රුවකට රාජාභරණ පැළඳවීම.
- බෝධිසත්ව ඝරයක් කරවීම
- සීගිරි කාශ්‍යප රජු, කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු, පළමු අග්බෝ රජු, ශිලාමේඝවණ්ණ රජු, දෙවන අග්බෝ රජු අභයගිරියට පක්ෂපාතීව කටයුතු කිරීම.

## දාඨෝපතිස්ස රජු

- කප්පූර පිරිවෙන, නිළුපුල් විහාර කරවා අභයගිරියට පූජා කිරීම.

## 5 වන කාශ්‍යප රජු

- මිහින්තලේ චේතිය පබ්බත විහාරය, ඇත් වෙහෙර අභයගිරි විහාරයට අයත් කපාරාමූලයට පැවරීම.

## 1 වන විජයබාහු රජු

- අභයගිරිය සඳහා උත්තර මූල පිරිවෙන කරවීම.
- පොළොන්නරු යුගයේදී අභයගිරි පක්ෂය වෙනම සාම්ප්‍රදායක් වශයෙන් පෙනී සිටීම නැවතුණි.
- 13 වන සියවසේදී පමණ අනුරාධපුර රාජධානියේ වැටීමත් සමඟ අභයගිරි විහාරයද ඉතිහාසයෙන් ගිලිහී ගියේය.

## ජේතවන විහාරය

- ඉදිකරවීම- මහසෙන් රජු ( මේඝවර්ණාභය නමැති ඇමතියෙකුගේ උපදෙස් පරිදි)
- මහා විහාර සීමාව තුළ පිහිටි ජෝතිවන උයනෙහි ඉදිකරවීය.
- වෛතුල්‍යවාදය පිළිගත් නිකායක් විය.
- මුලින්ම විහාරය දක්ඛිණ ගිරි විහාරවාසී තිස්ස නම් තෙරට පූජා කළේය.
- ලක්දිව විශාලතම චෛත්‍යය සහිත විහාරස්ථානයකි.
- දකුණුගිරි විහාරයේ විසූ සාගලික භික්ෂූන් දක්ඛිනගිරි විහාරයෙන් නික්මී අවුත් ජේතවනයේ පැවිදිවිය- ජේතවන නිකාය වශයෙන් ප්‍රසිද්ධ විය.
- ශීලාකාල රජ දවස පූර්ණ නම් වෙළෙන්දෙකු විසින් මෙරටට ගෙනෙන ලද ධර්ම ධාතුවක් ජේතවනයේ තැන්පත් කළේය.

# 16. ජේතවන විහාරය

❖ ලක්දිව විශාලතම චෛත්‍ය සහිත විහාරස්ථානයකි
❖ ජේතවනය ආරම්භ වීමත් සමඟ භික්ෂූහු අභයගිරි ජේතවන විහාර වශයෙන් බෙදී වෙන්වූහ.

## ආරම්භය

- ක්‍රිස්තු වර්ෂ 253 සිට 256 දක්වා ගෝඨාභය රජු රජකම් කළේය.
- ඔහු අභයගිරිය විසූ හැට නමක් භික්ෂූන් නිග්‍රහ කර හංවඩු ගසා රටින් පිට කළේය.
- ඒ අතර සිටි සංඝමිත්‍ර නම් සොළී තෙර නමක් නැවත ලංකාවට පැමිණ ගෝඨාභය රජු පහදවාගෙන ඔවුන්ගේ පුත් කුමරුවන් වන මහාසේන කුමරු සහ ජෙට්ඨතිස්ස කුමරුන් හට ආචාර්ය වූහ.
- එතැනින් මහසෙන් කුමරු තම වසඟයට කරගන්නා ලදී.
- මහසෙන් රජ පැමිණ පසු ඔහු ලවා මහාවිහාර භික්ෂූන්ට හිරිහැර කළේය.
- මහා විහාරය වැනසීමත් සමඟ ජනතාව රජු සමඟ අප්‍රසාදයට පත්වීම.
- පසුව මේඝවර්ණාභය ඇමතියෙක්ගේ උපදෙස් මත මහා විහාරය නැවත ප්‍රතිසංස්කරණය කරන ලදී.
- නමුත් මහසෙන් රජු මහා විහාරයට මුළුමනින්ම පක්ෂපාතී නොවූ අතර ඔහු ජෝතිවන නම් උයනෙහි විශාල ආරාමයක් සහ චෛත්‍යයක් ඉදිකරන ලදී.

## ජේතවනය පාලනය

- දක්ඛිණ ගිරි විහාරවාසී තිස්ස නම් තෙර කෙනෙකුට විහාරය පූජා කළේය.
- ගෝඨාභය රජ දවස වෛතුල්‍යවාදය පිළිගත් අභයගිරිවාසි භික්ෂු පිරිසකට රජතුමා විසින් කළ නිග්‍රහය දුටු අභයගිරිවාසි උස්සිලියා තිස්ස තෙර බියට පත්විය.
- එබැවින් තමා අනුගාමීවූ 300 ක් භික්ෂූන් වහන්සේලා සමඟ දකුණගිරි විහාරයට ගොස් විසූහ.
- සාගල නම් තෙර කෙනෙකු ආචාර්ය වූ හෙයින් ඔවුන් සාගලික නමින් ප්‍රසිද්ධ වූහ.
- ජේතවනය පූජා කළ තිස්ස තෙරුන් චෝදනා ලැබූ කෙනෙකි.
- ධාර්මික නම් ඇමති කළ විනිශ්චය අනුව චෝදනා ඔප්පු වී තිස්ස තෙරුන් සිවුරු හරවා සාසනයෙන් පිටුවහල් කරන ලදී.
- එවිට දකුණුගිරි විහාරයේ විසූ සාගලික භික්ෂූහු ජේතවනයට පැමිණ පදිංචි වූහ.
- ඉන්පසු සාගලික නිකාය ජේතවන නිකාය නමින් ප්‍රසිද්ධ විය.

## පසුකාලීන ජේතවනය

- ශිලාකාල රජු දවස පූර්ණ නම් වෙළෙන්දෙකු මෙරටට ගෙන ආ ධර්ම ධාතුවක් ගෞරවාන්විතව ජේතවනයේ තැන්පත් කළ හැකිවිය.
- ධර්ම ධාතුව යනු සද්ධර්ම පුණ්ඩරිකය වැනි වෛතුල්‍යවාදී කෘතියක්ද විය හැකිය. කෙසේ වෙතත් ජේතවන විහාරවාසී සාගලික භික්ෂූන් වෛතුල්‍යවාදය නිසා ගැටුම් ඇති කරගැනීමට කැමැති නොවූ පිරිසක් බව පෙනේ.

# 17. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

* වළගම්බා රජු සමයේ සිදුවිණි.

* ස්ථානය - මාතලේ අලුවිහාරය

## බ්‍රාහ්මණ තිස්සගේ කැරැල්ල

- වට්ටගාමිණී කුමරු පැමිණ 5 මසක් ගත වන්නට පෙර තිස්ස නම් බමුණෙක් රජුට විරුද්ධව රුහුණේ කැරැල්ලක් ඇති කළේය.
- මෙකල ඉන්දියාවෙන් දමිළයන් 7 දෙනෙකු ද රජු සමඟ සටනට පැමිණියේය.
- රජු තිස්ස බමුණාට රාජ්‍ය පැවරීය. එම නිසා තිස්ස දමිළයන් සමඟ සටන් කළ අතර ,ඔහු එයින් පරාජයද විය.
- මේ කාලයේ ලංකාවේ දරුණු සාගතයක් ඇතිවිය.එය අවුරුදු 12 ක් පැවතිණි.
- සාගතය දරුණු බැවින් භික්ෂූන් බොහෝ පිරිසකට රට හැර දැමට සිදුවිය. භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් මරණයටද පත්විය.
- නමුත් රට හැර නොයා ලංකාවේ විසීමට මහාසේන ,ඉසිදත්ත, චූලසීව යන හිමිවරු තීරණය කළේය.- සම්මෝහන විනෝදනී අටුවාව.

## ධර්මය රැකගැනීමට උනන්දු වීම

- මේ අවධිය වන විට ත්‍රිපිටක ධර්මය පවත්වාගෙන ආවේ ශිෂ්‍යානු ශිෂ්‍ය මුඛ පරම්පරාවෙනි.
- සාගතය බොහෝ දරුණු නිසාවෙන් ,භික්ෂූන් වහන්සේලා මරණයටද පත්විය.
- ධර්මය රැකගැනීමට ගත් පියවර ලෙස,

➢ තමන් කටපාඩමින් දැනසිටිය ධර්මය අත් නොහැර සජ්ඣායනා කිරීම.

➢ ඉන්දියාවට යාමේ අදහසින් සමුද්‍ර තීරය තෙක් පවා ගිය සැටනමක් භික්ෂූන් වහන්සේලා ආපසු මලය රටට අවුත් ගස් ,මුල් සහ කොළ පමණක් ආහාරයට රැගෙන විසීම. - මනෝරථපූරණී අටුවාව

## ශාසනික පරිහානිය

- සුත්ත නිපාතයට අයත් මහා නිද්දේශය කට පාඩමින් දැන සිටි චතුනිකායික තිස්ස තෙරුන් අපිරිසිදු චරිතයක් ඇති බවට පිළිගැනීම - සමන්තපාසාදිකාව

* පරිහානියට හේතු ලෙස,

- ශාසනයේ දියුණුවට ආධාර කළ සිංහල රජවරුන්ගේ බලය අඩු වී යෑම.
- ලෞකික සැප කෙරෙහි ඇලුණු පුද්ගලයන් සසුනට ඇතුල් වීම.

## පර්යාප්ති ප්‍රතිපත්ති වාද

- තිස්ස බමුණු වර්ෂ කීපයකින් මිය ගිය අතර දුර්භික්ෂයද තුරන් විය.
- පාංශුකූලික හා ධර්මකථික භික්ෂූන් අතරේ "සසුනේ පැවැත්ම පර්යාප්ති මූලකද, නැතහොත් ප්‍රතිපත්ති මූලකද" යන්න මතභේදයක් ඇතිවිය.

- ➢ පාංශුකූලික භික්ෂූන් - ශාසනය ප්‍රතිපත්ති මූලකයි.
- ➢ ධර්මකථිකයන් - ශාසනය පර්යාප්ති මූලකයි.

- මෙම වාදයෙන් ප්‍රතිපත්තිවාදීහු ජයගත්හ.

## නිකාය භේදය

- අභයගිරිය බිහිවීමත් සමග ලංකාවේ මුල් බුදු සසුන තුළ නිකාය භේදයක් ඇතිවිය.
- එම නිසා මතභේදාත්මක අදහස් ත්‍රිපිටක ධර්මයට එක්වීම වැළැක්වීමට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පියවර ගන්නා ලදී.

## සංගීතිය පිළිබඳ වාර්ථා

- "ත්‍රිපිටක ධර්මයද එහි අර්ථකතාවද, ප්‍රඥා ඇති පූර්වක භික්ෂූහු මුඛ පාඨ වශයෙන් ගෙන ආවෝය. එකල්හී වැසිවූ භික්ෂූහු සත්වයන්ගේ පරිහාණි දැක ධර්මයේ චිරස්ථිතිය පිණිස පොත්හි ලියූහ" - මහාවංශය
- "මේ මහා ස්ථවිර පරම්පරායෙන් ,මුඛපාළි වශයෙන් පැවත ආවා වූ ත්‍රිපිටක ධර්මය එක්තරා ජනපදාධිපතියක්හුගේ ආරක්ෂායෙන් ,පන්සියයක් රහතන් වහන්සේ මාතුල නම් දනව්වෙහි අළුලෙන වැඩහිඳ පොත් සංගායනා කොට ලියවූ සේක."  - නිකාය සංග්‍රහය
- " බැමිණිටියාසායත් මොහු සාමයෙහිම විය.  මොවුන් දවස පන්සියයක් රහතන් වහන්සේ අළුලෙන වැඩ හිඳ පොත් සංගායනා කළසේක." - පූජාවලිය

- සංයුක්තභානක චූලසිව, ඉසිදත්ත, මහාසේන යන තෙරවරුන්ද, ත්‍රිපිටකධාරී වත්තබ්බක නිග්‍රෝධ මහ තෙරුන් වහන්සේ හා විශාරද විද්වත්හු පුස්තකාරූඪ සංගීතියට සහභාගි විය.
- පුස්තකාරූඪ සංගීතියේදී පුරෝගාමී වූයේ මහාවිහාර භික්ෂූන් වහන්සේ ය.

## සංගීතියේ අගය

- ත්‍රිපිටකය හා අටුවා මෙයින් පසුව ඉගෙනීමට හා ඉගැන්වීමට පහසුවිය.
- පෙරට වඩා බෞද්ධ උගතුන් බහුල විය.
- ථෙරවාද සම්ප්‍රදායේ පමණක් නොව පාළි සාහිත්‍යයේම අනාගත සුරක්ෂිතභාවයට අනුබලයක් විය.

# 18. බුදුසමයෙන් ලක්වැසියන් ලද ආභාසය

❖ දෙවන පැතිස් රජ දවස මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ බෞද්ධ ධර්ම දූත පිරිස දිවයිනට වැඩම විය. ලංකාව තුළ බුදුසසුන පිහිටුවීම සහ නව සංස්කෘතියක් හඳුන්වා දුන්හ.

## පැරණි සංස්කෘතිය

- ක්‍රිස්තු පූර්ව පස්වන සියවස පමණ ආර්යයෝ මෙරටට පැමිණියහ.
- ඔවුන්ගේ පැමිණීමත් සමඟ ගම්සභා ක්‍රමය, ග්‍රාම සහ නගර නිර්මාණය, වැව් අමුණු කර්මාන්තය සහ කෘෂිකර්මාන්තය අතින්ද ප්‍රමාණවත් දියුණුවක් පැවති බව වංසකතාවේ හෙළිවේ.

## රාජ්‍ය පාලනය හා බුදුදහම

- තිස්ස රජු මුලින් සිටියේ ග්‍රාමණී තත්වයේ බවත්, අශෝක රජු යටතේ නියම රාජාභිෂේකය ලැබූ බවත් ඒ අනුව දේශපාලන ස්ථාවරත්වය ලංකාවේ ඇති වූයේ මිහිඳු මාහිමියන් වැඩමවීමේ සිද්ධියට සම්බන්ධව බව පැහැදිලි වේ.
- රාජ්‍ය අනුග්‍රහය සහිතව බුදුදහම පැතිරිණි.
- ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට රාජ්‍ය හිමිකමට නීතියෙන් බලය ලැබුණේ සිංහල බෞද්ධයෙකුට පමණි.
- ක්‍රිස්තු පූර්ව පළවෙනි සියවසේ පමණ සිට මහායාන ධර්මය ලංකාවේ පැතිරීමත් සමඟ රාජ්‍ය පාලනය සඳහා බෞද්ධයකු වීම පමණක් නොව බෝධිසත්වයකු වීම ද අවශ්‍ය විය.
- ක්‍රිස්තු පූර්ව 10 වන විට මෙම ඇදහීම වැඩිදුරටත් පැවතිණි. බුදුදහම රාජ්‍ය ආගම බවට දෙවන අභයගිරි ලිපිය සහ නිශංකමල්ල රජුගේ සෙල්ලිපිවල ද බුද්ධ ශාසනයට පක්ෂපාතීව අදාළ කරුණු සටහන් කොට ඇත.
- රජවරුන්ගේ සංඥා නාම පවා බෞද්ධ ස්වරූපයක් ලබා ගත්තේය.
  උදාහරණ : සිරිසඟබෝ, අග්ගබෝධි, මොග්ගල්ලාන,ධාතුසේන, මහින්ද

- රජුගේ ප්‍රධාන යුතුකම් අතර බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම එකකි.
- භික්ෂූන් වහන්සේලා අතර වූ ආරවුල් වල දී පවා රජවරු ඒ සඳහා මැදිහත් වූහ.
- උදාහරණ ලෙස කණිරජානුතිස්ස රජතුමා, වෝහාරතිස්ස, ගෝඨාභය, මහාපරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල සහ දෙවැනි පැරකුම්බා වැනි රජවරු මිථ්‍යා මත පැවති භික්ෂූහු සසුනෙන් නෙරපා සසුන පිරිසිදු කළේය.

- සමහර අවස්ථාවලදී භික්ෂූහු රාජ්‍ය පාලනය සඳහා කුමාරවරු සිංහාසනාරූඪ කිරීම සඳහා රාජනීතිය පවා උල්ලංඝනය කළේය.
- ද්‍රවිඩ පාලකයන්ගෙන් රට මුදවාගැනීම පිණිස භික්ෂූන් වහන්සේලා ධාතුසේන කුමරු සුදානම් කළ බව ද මහාවංශයේ සඳහන් වේ.
- "පාත්‍රාධාතුව හා චීවරය රැකීම පිණිස මහා සංඝයා පිරිනැමූ රාජ්‍යශ්‍රීයට පැමිණීමෙන් පසු අභිෂේක මංගල්‍යය පැවැත්වෙන දිනයෙහි සංඝයාට මෙහෙය හා උපස්ථාන කිරීම බෝධිසත්වයන් වන රජවරුන්ගේ සිරිත බව" සිව්වන මිහිඳු රජ ජේතවනාරාම සෙල්ලිපියෙහි සඳහන් කරයි.
- රාජ්‍ය අභිෂේක උත්සවය පවා බුදුසසුනේ බලපෑම් මත සිදුවිය.
- අභිෂේක දී ප්‍රයෝජනයට ගන්නා කකුධ භාණ්ඩ අඩංගු භාජන සෑදීම සඳහා මැටි ලබාගත යුතු වූයේ රුවන්වැලිසෑය, ශ්‍රී මහා බෝධිය වැනි බෞද්ධ සිද්ධස්ථානවල උතුරු වාසල් දොරටු පියගැට පෙළ යටින්ය.
- දෙවන සේන රජු තම අභිෂේක උත්සවය පැවැත්වූයේ රුවන්වැලි සෑ මළුවේදීම ය.
- බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා ආරක්ෂා කිරීමට ද රජවරු බැඳී සිටියහ.
- පසළොස්වක පොහොය දිනය බෞද්ධ රජවරු ශ්‍රේෂ්ඨ දිනයක් ලෙස පිළිගත්හ.
- තුන්වන උදය රජු බදුලු ටැම් ලිපියේ පොහෝ දින වෙළඳාම් නොකළ යුතු බව ද සඳහන් කරයි.

## ඇදහිලි හා විශ්වාස නව මඟකට

- මළවුන් පිදීම එවක පැවති ඇදහීමකි. ඒ වෙනුවට දාන ධර්ම ආදිය පවත්වා පින් අනුමෝදන් කිරීමට මෙරට වැසියන් යොමු වූයේ බුදු සසුන මඟිනි.
- රුක්ෂ වන්දනාව වෙනුවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනාව සිදුවිය.

## භාෂාව සාහිත්‍ය පෝෂණය

- අට්ඨකථා සම්ප්‍රදායන් මෙම දිවයින් වැසියන්ට හඳුන්වා දෙනු ලැබීය.
- හෙළ අටුවා සමූහයක් සිංහල සාහිත්‍යයට එක්වුණි.
- පාලි සහ සිංහල භාෂාවන්ගේ ප්‍රවීණත්වයක් ඇතිවිය.
- මහා අටුවාව, මහා පසුරු අටුවාව, කුරුඳු අටුවාව යනුවෙන් සිංහල අටුවා 3 ක් පිළිබඳව සමන්තපාසාදිකාවේ සටහන් වේ.
- සාරිපුත්ත සඟරාජ මා හිමියෝ සිංහල ගැටපද තුනක් පිළිබඳව සටහන් කරති.
- සීහල ධාථා ධාතු වංසය, සිංහල මහා බෝධි වංශය, සිංහල කේශධාතුවංසය ආදී සාහිත්‍ය කෘති රැසක් පිළිබඳව මහාවංශයේ සඳහන් වේ.
- විශුද්ධි මාර්ග පුරාණ සන්නය,කුදු සික පුරාණ සන්නය, මයුර සන්දේශය, පුරාණ කුසජාතක කාව්‍යය, දම්පියා අටුවා ගැටපදය, අසක්දාකව, සියබස්ලකර, සිඛවලඳවිනිස පුරාණ සිංහල කෘති කිහිපයකි.
- පොළොන්නරු යුගයේ රචිත අභිමතාර්ථ සංග්‍රහය, අමාවතුර, ධර්මප්‍රදීපිකාව, මුව දෙව්දාවත, සසඳාවත, මහා බෝධිවංස ගැටපදය විවරණය, විනය සන්නය, පිරිත් සන්නය වැනි කෘතීන් ද බුදුදහමේ ආභාෂයෙන් රචිතය.

## ලේඛන කලාව දියුණු වීම

- සිංහල අක්ෂර මාලාව ලැබීම.
- දෙවන පැතිස් රජතුමා විසින් කරවන ලද වෙස්සගිරි විහාරය සඟ සතු කළ බව සඳහන් වන වෙස්සගිරි ලිපියේ පටන් කලක් යනතුරු මෙරට සෙල්ලිපි ලියා ඇත්තේ බ්‍රාහ්මී අක්ෂර වලින් වේ.
  උදාහරණ ලෙස වෙස්සගිරි, තෝනිගල, රිටිගල, දඹුල්ල, මහගල්කඩවල හා පෙරිමීයන් කුලම
- ක්‍රිස්තු වර්ෂ පළවෙනි සියවසේ වළගම්බා රජු දවස සිංහල අටුවා සහිත පාලි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ ය.

## කලා ශිල්ප පෝෂණය

- ගෘහ නිර්මාණ, මූර්ති, කැටයම්, හා චිත්‍ර කලා යන අංශවලද විශාල දියුණුවක් ඇතිවිය.

## ගෘහ නිර්මාණ ශිල්පය

- මුල් කාලයේ භික්ෂූහු වාසය කළේ ගල් ගුහා තුළය.
- පසුව ආරාම වැනි සුවපහසු ගොඩනැගිලි ඉදිකෙරිණි.
- ශ්‍රී මහා බෝධි ශාඛාව මෙරටට වැඩමවන අවස්ථාවේදී දහඅට කුලයක ශිල්පීහු පැමිණියහ.
- මහා විහාරය ගොඩනැගිලි තැනීමේ ස්ථාන ලකුණු කර ඇත්තේ ද මිහිඳු මහා හිමියන් විසිනි.
- පසුව ථූපාරාම වැනි නොයෙකුත් ස්තූප ඇතිවිය.
- බුදු දහම පැමිණීමට පෙර පණ්ඩුකාභය රජතුමා විසින් ඉදිකරන ලදැයි සැළකෙන දේවාල පිළිබඳ වාර්තා වේ.
- පසුකාලීනව ගල්, ගඩොල් සහ උළු භාවිතයට පුරුදු වූ අතර ලෝවාමහාප්‍රාසාදය, චෛතියඝර, බෝධිඝර වැනි ගොඩනැගිලි නිර්මාණය විය.

## කැටයම්

- ස්තූප වටා ඇති ආයත කුළුණු ආදියේ ඉතා පියකරු මාලා කර්ම, ලතාකර්ම කැටයම් කර ඇත.
- ජාතක කතා හා බුද්ධචරිතයේ සිද්ධි කැටයම් කළ ගල් පුවරු ද දක්නට ලැබේ.
- සඳකඩ පහන්, පඩි පෙළවල්, කොරවක් ගල් මේ සඳහා උදාහරණ වේ.

## මූර්ති

- ආචාර්ය පරණවිතාන මහතාගේ මතය අනුව, ලංකාවේ ප්‍රතිමා කලාව ආරම්භ වූයේ ඉන්දියානු ආභාසයෙනි.
- මුල් කාලයේ කලුගලින් බුදුපිළිම නෙලන ලද අතර, කලාත්ම මැටි, බදාම, ලී, ලෝහ, ඇත්දත්, කිරිගරුඬ ආදී මාධ්‍ය උපයෝගී කරගෙන ඇත.
- අවුකන බුදුපිළිමය තොලුවිල බුදුපිළිමය හෙළ කලාකරුවාගේ දක්ෂකම් විදහා පායි.
- කුෂ්ඨ රජාගල බෝධිසත්ව රූපය ද, රුවන්වැලි සෑ මළුවේ ඇති භාතිය රජුගේ ප්‍රතිමාව ද පොළොන්නරුවේ ඇති පළමුවන පැරකුම්බාවන්ගේ යැයි සැලකෙන ප්‍රතිමාවද ඒ සඳහා නිදසුන් වෙයි.

## චිත්‍ර කලාව

- රුවන්වැලි සෑ ගර්භය තුළ බිත්ති සිතුවමින් අලංකාර කොට තිබූ බව මහාවංසයේ විස්තර වලින් පෙනේ.
- ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස පමණ වන විට ලංකාවේ චිත්‍ර සම්ප්‍රදාය ඉහළ අගයක පැවති බව සීගිරි චිත්‍ර මගින් පැහැදිලි වෙයි.

## අධ්‍යාපනය

- යුරෝපීයයන් මෙරට පැමිණ මිෂනාරි අධ්‍යාපන ක්‍රමයක් ගොඩනගා ගන්නා තුරුම මෙහි පැවතියේ බෞද්ධ අධ්‍යාපන ක්‍රමයකි.
- පිරිවෙන් අධ්‍යාපනය එකල පැවතිණි.
- අනුරාධපුර යුගයේදී මෙය වැඩි දියුණු වී ඇති බව සාධක හමුවේ.
- අටලොස් භානක පරපුර විසින් පෙළ දහම හා අටුවා කතා සම්ප්‍රදායන් අධ්‍යාපනය කරමින් රැකගනු ලැබිය.
- මුල් අවධියේදී ත්‍රිපිටකය හැදෑරීමෙන් පමණක් සීමා වූ අධ්‍යාපන ක්‍රමය පසු කලෙක ජ්‍යොතිෂශාස්ත්‍රය, වෛද්‍යශාස්ත්‍රය, වාස්තු විද්‍යාව ආදී ලෞකික විෂයයන් සඳහා ද වැඩිදියුණු වී ගියේය.

## අධ්‍යාත්මික ගුණ වගාව

- සත්ව ඝාතනය, සොරකම, කාමයේ වරදවා හැසිරීම, බොරු කීම හා සුරාපානය යන පස්පවින් වැළකිය යුතු බවත් එසේ ජීවත් වන තැනැත්තා උසස් ජීවිතයක් ගෙවන්නෙකි බවත් ඒ සඳහා භික්ෂූන් වහන්සේගේ උපදෙස් ලැබුණු අතර රජවරුන්ගේත් ප්‍රභූන්ගේත් ආදර්ශය ලැබුණි.
- ඇතැම් රජවරු සත්ව ඝාතනයට විරුද්ධව නීති පැන වූහ. මෙය සිව්වන මිහිඳු රජතුමා විසින් පිහිටුවන ලද වේවැල්කැටිය සෙල්ලිපියේ සඳහන් වේ.
- මෙරට කාන්තාවෝ කිසිවෙකු සුරාපානය නොකළහ. එය බෞද්ධ සංස්කෘතියේ ලක්ෂණයකි.
- මහසෙන් රජතුමා ජේතවන දාගැබ අභියස සිට පටි ධාතුවේ පෙළහර දක්නට නොලැබුණේ නම් රා බොන බවට තර්ජනය කළේය. එයින් පෙනී යන්නේ සුරාපානය පස්පවින් එකක් ලෙස රජවරුන්ද සැලකූ බවයි.